# 3

# ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

## 3.1 සමස්ත නිරීක්ෂණ

නිෂ්පාදන කටයුතු සඳහා ආර්ථිකයේ පවතින සම්පත් උපයෝගී කර ගැනීමට, සම්පත්වල ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට සහ ජනතාවගේ යහපැවැත්ම ඉහළ නැංවීමට යටිතල පහසුකම් උපකාරී වන බැවින්, දැඩි රාජ්‍ය මූල්‍ය සීමාවන් මධ්‍යයේ වුව ද රජය විසින් 2019 වසරේ දී ද ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ගන්නා ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ක්ෂේත්‍ර කිහිපයක විවිධ යටිතල පහසුකම් ව්‍යාපෘති රාශියක් සඳහා පහසුකම් සැලසීමටත් මෙරට මානව සම්පත සංවර්ධනය කිරීම අරමුණු කරගෙන ගන්නා ලද පියවර ක්‍රියාත්මක කිරීමටත් රජය විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී. මෙරට යටිතල පහසුකම් පදනම පුළුල් කිරීමේ අරමුණින් විවිධ මාර්ග සංවර්ධන කටයුතු, නාගරික සංවර්ධන හා නිවාස ව්‍යාපෘති, ජල සම්පාදන හා වාරිමාර්ග යෝජනා ක්‍රම සහ විදුලි සන්දේශ ව්‍යාපෘති රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සලකා බලන වර්ෂය තුළ දී, ප්‍රාදේශීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන පද්ධතියේ කාර්යක්ෂම බව ඉහළ නැංවීමේ අරමුණින්, දක්ෂිණ අධිවේගී මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ තෙවන අදියර සම්පූර්ණ කිරීමත් ප්‍රාදේශීය මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මකවීමත් සිදු වූ අතර එහි ප්‍රතිඵල ලෙස පොදු මහජනතාවට ඵලදායී කටයුතු, විවේකය සහ ගෘහ ජීවිතය සඳහා කාලය ඉතිරි කර ගැනීමට හැකි වනු ඇත. මේ අතර, වරාය නගර ව්‍යාපෘතියේ භූමිය ගොඩකිරීමේ කටයුතු 2019 වසරේ ජනවාරි මාසයේ දී සම්පූර්ණ කෙරුණ අතර, ව්‍යාපෘතිය යටතේ ගොඩ කරන ලද භූමිය කොළඹ දිස්ත්‍රික්කයට අයත් භූමියක් ලෙසත්, නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ පවතින නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙසත් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සුවිශේෂී ව්‍යාපෘතිය මගින් ලොව ඉහළ මට්ටමේ මූල්‍ය කේන්ද්‍රස්ථානයක් ඉදි කිරීමට ඉලක්ක කෙරෙන අතර, හෝටල් සහ ආපන ශාලා, වෙළඳ සහ කාර්යාලීය පරිශ්‍ර, අධ්‍යාපන, සෞඛ්‍ය හා විනෝදාස්වාද කටයුතු සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ද අපේක්ෂිතය. මීට අමතරව, මෙරට තුළ ඉහළ යන නිවාස අවශ්‍යතා සපුරාලීම සහ මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා 2019 වසරේ දී ද නාගරික සහ නිවාස සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ආරක්ෂිත පානීය ජලය සහ වාරි මාර්ග ජලය සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම ද මහජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම තුළ, ජල විදුලි බලය උත්පාදනය මෙන්ම දකුණු පළාතේ වියළි ප්‍රදේශවලට වාරි ජලය සැපයීම අරමුණු කරගත් උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය ද 2019 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. උමා ඔය ව්‍යාපෘතිය යටතේ ජලාශ හතරක් 2019 ඔක්තෝබර් මාසයේ දී ජනතා අයිතියට පත් කරන ලදී. මේ අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් රාජ්‍ය ආයතන එකිනෙක සම්බන්ධ කිරීම හා විශාල දත්ත එකතුවක් නිර්මාණය කිරීම සහ එමගින් රාජ්‍ය සේවයේ ඵලදායීබව හා කාර්යක්ෂමබව වර්ධනය කිරීමේ අරමුණින් ලංකා රාජ්‍ය ජාලය 2.0 සහ ලංකා රාජ්‍ය ක්ලවුඩ් 2.0 ව්‍යාපෘති 2019 වසරේ දී ද, අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, කොළඹ වරායේ නැගෙනහිර බහලු පර්යන්ත ව්‍යාපෘතිය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතිය වසර තුළ දී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කළේය. පාස්කු ඉරු දින

ප්‍රහාරයන්ගෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් එල්ල වූ අතර, ප්‍රවාහන අංශය එයින් දැඩි බලපෑමකට ලක් වූ අංශවලින් එකකි. ඒ අනුව, 2019 වසරේ දී ආරක්ෂක හේතූන් මත පුද්ගල ගමනාගමනය අඩුවීම සහ ආර්ථික ක්‍රියාකාරකම් අඩුවීම හේතුවෙන් මහා මාර්ග, දුම්රිය හා ගුවන් ප්‍රවාහන මාධ්‍ය ඔස්සේ මගී ප්‍රවාහනය මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය ද පහළ යෑමක් පෙන්නුම් කළේය.

රජය සතු වාණිජ ව්‍යවසායයන්හි දුර්වල ක්‍රියාකාරිත්වය නිසා එම ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව 2019 වසරේ දී පැන නැගුණි. 2019 වසරේ මුල් මාස හත තුළ පැවති වියළි කාලගුණික තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ජල විදුලිබල උත්පාදනය අඩු වූ අතර, තාප විදුලිබල උත්පාදනය වැඩි විය. ද්‍රව ඉන්ධන භාවිතයෙන් විදුලිබල උත්පාදනය කිරීම මත වැඩි වශයෙන් යැපීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට (ලං.වි.ම.) වසර තුළ දී අධික පාඩු ලැබීමට සිදුවිය. දැඩි උණුසුම් කාලගුණය නිසා ඇතිවූ අධික විදුලිබල ඉල්ලුම සහ විදුලිබල උත්පාදන ධාරිතාවෙහි පවතින සීමා හේතුවෙන් 2019 වසරේ මාර්තු හා අප්‍රේල් මස මුල් කාලසීමාවේ දී සැලසුම් සහගතව විදුලි කප්පාදුවක් කිරීමට ලං.වි.ම.ට සිදු විය. ඊට අමතරව, ඉහළ යන විදුලිබල උත්පාදන පිරිවැයට සමගාමීව විදුලිබල ගාස්තු සංශෝධනය කිරීම ප්‍රමාදවීම ලං.වි.ම.හි මූල්‍ය අර්බුදය තීව්‍ර කළේය. මේ අතර, ලං.වි.ම.හි මූල්‍ය අලාභය තවදුරටත් වර්ධනය කරමින් නිලධාරිවාදී අකාර්යක්ෂමතා සහ ටෙන්ඩර් හා ප්‍රසම්පාදන පටිපාටිවල පවතින ගැටලු හේතුවෙන් ලං.වි.ම.හි විදුලිබල උත්පාදන විකාශන සැලැස්ම ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පවතී. එබැවින්, ලං.වි.ම.හි විදුලිබල උත්පාදන පිරිවැය අඩු කරන අතර ම මෙරට බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා මෙම විදුලිබල උත්පාදනය වැඩි කිරීමේ සැලැස්ම කඩිනමින් ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛතාව ලබාදිය යුතුය. 2019 සැප්තැම්බර් මාසය දක්වා ඉන්ධනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව සංශෝධනය කරනු ලැබුව ද එම මිල ගණන්වලින් ඉන්ධනවල සැබෑ පිරිවැය පිළිබිඹු නොකෙරුණු බැවින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) සැලකිය යුතු අලාභයක් වාර්තා කළේය. ලං.වි.ම. සහ ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් ගෙවිය යුතු වෙළඳ ණය මුදල් ආපසු නොගෙවීම ද ලං.ඛ.නී.සං.හි මූල්‍ය ගැටලුව උග්‍ර වීමට හේතු විය. තවද, ශ්‍රීලන්කන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.), ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (ශ්‍රී ලං.දු.දෙ.) සහ තැපැල් දෙපාර්තමේන්තුව වැනි බොහෝ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවති අතර, එමගින් පෙන්වා දෙනු ලබන්නේ මෙම ආයතන ප්‍රතිඵල අත්කර ගැනීම පදනම්ව ක්‍රියාත්මකවන, පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් ආයතන බවට පත් කිරීම සඳහා රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි ඵලදායීබව වැඩිදියුණු කිරීම හා ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම්වල ඇති අවශ්‍යතාවයි. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් මූල්‍ය ශක්‍යතාවෙන් යුතු ආයතන බවට පරිවර්තනය කිරීමේ වැදගත්කම රජය විසින් දැනටමත් හඳුනාගෙන ඇති නමුත්, මෙම රජය සතු වාණිජ ව්‍යවසායවල ක්‍රියාකාරිත්වය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය මත දිගින් දිගටම පැටවී ඇති බර ලිහිල් කිරීම සඳහා මධ්‍ය කාලීන සැලසුම් සකස් කිරීම සහ අවශ්‍ය කාර්යක්ෂම ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සිදු කළයුතුව ඇත.

රජය විසින්, පෞද්ගලික අංශයේ සහාය ද ඇතිව, සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා ලබාදීම තුළින් මානව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ද අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස ද සමාජ ආධාර වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරන ලදී. සැමට සමානව අධ්‍යාපනය සඳහා අවස්ථාව සැලසීම හා ශ්‍රම වෙළඳපොළේ වෙනස් වන නිපුණතා ඉල්ලුම සපුරාලීම අරමුණු කර ගනිමින් 'වසර 13ක සහතික කරන ලද අධ්‍යාපනයක් ලබාදීම' හා 'ළඟම පාසල හොඳම පාසල' යන වැඩසටහන් වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. පෞද්ගලික අංශය ද මෙරට අධ්‍යාපන සේවා සැපයීමේ දී විශාල කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කළේය. කෙසේ වෙතත්, ඵලදායී වැඩිහිටි දිවියක් ගත කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සිසුන්ට ලබා දීම සහතික කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සහ අධීක්ෂණ හා තත්ත්වාරක්ෂණ ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කළ යුතුය. බෝ නොවන රෝග මගින් මෙරට ජනගහනය තුළ මරණ හා රෝගාබාධ පිළිබඳ ගැටලු බොහොමයක් ඇති කරමින්, ආර්ථිකය මත සැලකිය යුතු පීඩාවක් අඛණ්ඩව ඇති කරන අතර, කොවිඩ්-19 නව කොරෝනා වෛරස වසංගත තත්ත්වය 2020 වසරේ දී සමාජ-ආර්ථික වශයෙන් දැඩි බලපෑමක් මතු කරමින් ශ්‍රී ලංකාව තුළ ප්‍රබල සෞඛ්‍ය ගැටලු නිර්මාණය කර ඇත. මේ අතර, අඩු ආදායම්ලාභී පවුල් වැඩි සංඛ්‍යාවකට මූල්‍යාධාර ලබාදීමේ අරමුණින් 2019 වසරේ දී සමෘද්ධි වැඩසටහන යටතේ අලුතෙන් පවුල් 400,000කට වඩා වැඩි සංඛ්‍යාවක් ලියාපදිංචි කරන ලද අතර, ඒ හේතුවෙන් සමස්ත සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව මිලියන 1.8කට වඩා ඉහළ ගියේය. පසුගිය දශක කිහිපය පුරා මෙම සමාජ ආධාර වැඩසටහන් සහ දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ දිළිඳු බව සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට දායකත්වයක් දැක්වුව ද, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලින් අපේක්ෂා කරන පරිදි 2030 වසර වන විට දිළිඳුකම සපුරා තුරන් කිරීම පිණිස, සැබෑ ලෙසම උපකාර අවශ්‍ය වන දිළිඳු පවුල් සඵලදායී ලෙස ඉලක්ක කිරීම සඳහා සමාජ ආධාර වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය වේ.

3.1 රූප සටහන

## ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් ආශ්‍රිත ක්‍රියාකාරිත්වය

## රජය, පෞද්ගලික අංශයේද සහයෝගිත්වය ඇතිව

**2019 වසරේ දී ද අඛණ්ඩ ව ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් සැලසීමේ නිරත විය.**

# ආර්ථික යටිතල පහසුකම්

**පාස්කු ඉරිදා ප්‍රහාරවලින් සමස්ත ප්‍රවාහන අංශයටම සැලකියයුතු බලපෑමක් එල්ල විය...**




මාර්ගස්ථ ප්‍රවාහනය | දුම්රිය ප්‍රවාහනය | ගුවන් සේවා

**වියළි කාලගුණික තත්ත්ව මධ්‍යයේ ඉන්ධන මගින් විදුලිබල උත්පාදනය කිරීම මත වැඩි වශයෙන් යැපීම නිසා විදුලිබල උත්පාදනය සඳහා සිදුකළ ඛනිජ තෙල් අලෙවිය ඉහළ ගියේය..**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ඛනිජ තෙල් අලෙවියෙහි වාර්ෂික වර්ධනය

| බලශක්ති නිෂ්පාදන | ප්‍රවාහන | ගුවන් සේවා | කර්මාන්ත | ගෘහස්ථ | අපනයන |
|---|---|---|---|---|---|
| 45.4% | 5.0% | -5.0% | -18.4% | 1.4% | -40.2% |

## විදුලිබලය

ගි.වො.පැ. 14,091 (2018)

ගි.වො.පැ. 14,612 (2019)

**ලං.වි.ම. විදුලිබල අලෙවිය**

2019 මාර්තු සහ අප්‍රේල් මාසවල දී සැලසුම් කළ විදුලි කප්පාදු කිරීම් මධ්‍යයේ වසරේ විදුලිබල අලෙවිය සුළු වර්ධනයක් වාර්තා කළේය.

## වරාය ක්‍රියාකාරිත්වය

| භාණ්ඩ | බහලු | ප්‍රතිනැව්ගත කිරීම් |
|---|---|---|
| 1.9% | 2.6% | 4.4% |

වරාය ක්‍රියාකාරකම් **2019 වසරේ දී වර්ධනයක්** පිළිබිඹු කළේය.

## විදුලි සංදේශ

ස්ථාවර දුරකථන 10.5

ජංගම දුරකථන 150.8

අන්තර්ජාල 61.5

පුද්ගලයින් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව මගින් නිරූපිත ඝනත්වය

# සමාජ යටිතල පහසුකම්

**සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා රජයේ වියදම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 1.6ක් සහ සියයට 1.9ක් විය.**

**රජයේ රෝහල්වල**

- පුද්ගලයින් 1,000කට ඇඳන් 3.6
- පුද්ගලයින් 1,203කට එක් වෛද්‍යවරයෙකු
- පුද්ගලයින් 570කට එක් හෙද සේවකයෙකු

## සමෘද්ධි සහනාධාරය

**සමස්ථ ගෙවීම් ප්‍රමාණය 2018 වසරේ පැවති රු.බිලියන 39.2 සිට 2019 වසරේ දී රු.බිලියන 44.7ක් දක්වා වැඩි විය.**

සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 2018 වසරේ පැවති මිලියන 1.4 සිට 2019 වසරේ දී මිලියන 1.8ක් දක්වා ඉහළ ගියේය.

2019

2018

## සාක්ෂරතාව

**2018 වසරේ සාක්ෂරතාව 2017 වසරේ පැවති සියයට 92.6ට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.**

92.5%

93.4% (2018) පුරුෂ

91.6% (2018) ස්ත්‍රී

3

### 3.1 සංඛ්‍යා සටහන
### යටිතල පහසුකම් සඳහා වූ රාජ්‍ය ආයෝජන

| වර්ෂය | ආර්ථික සේවා | | සමාජ සේවා | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | ද.දේ.නි. % ලෙස | රු. බිලියන | ද.දේ.නි. % ලෙස | රු. බිලියන | ද.දේ.නි. % ලෙස |
| 2015 | 429.0 | 3.9 | 124.4 | 1.1 | 553.4 | 5.1 |
| 2016 | 424.0 | 3.5 | 117.3 | 1.0 | 541.3 | 4.5 |
| 2017 (අ) | 474.1 | 3.6 | 135.4 | 1.0 | 609.5 | 4.6 |
| 2018 (අ) | 437.9 | 3.3 | 133.2 | 1.0 | 571.1 | 4.3 |
| 2019 (ආ) | 475.9 | 3.4 | 112.9 | 0.8 | 588.8 | 4.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### ඛනිජ තෙල්

**පසුගිය වසරට සාපේක්ෂව 2019 වසරේ දී ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) මිල ගණන් සාමාන්‍යයෙන් පහළ මට්ටමක පැවතිණි.** බ්‍රෙන්ට් තෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2018 වසරේ පැවති එ.ජ. ඩොලර් 71.76ක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් 64.04ක් දක්වා සියයට 10.7කින් පහත වැටුණි. 2019 වසරේ පළමු මාස හතර තුළ බ්‍රෙන්ට් මිල ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් 2019 වසරේ අප්‍රේල් මාසයේ දී බැරලයක මිල එ.ජ. ඩොලර් 71.45ක් දක්වා උපරිමයකට ළඟා වූ අතර, ඉන් අනතුරුව ගෝලීය වර්ධනයේ පසුබෑමක් ඇති වීමට යම් ප්‍රමාණයකට බලපෑ එක්සත් ජනපද-චීන වෙළඳ අර්බුදය උත්සන්න වීම හේතුවෙන් 2019 වසරේ ඔක්තෝබර් මැද භාගය දක්වා සාමාන්‍ය වශයෙන් අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ගෝලීය ඉල්ලුම නැවත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම හේතුවෙන් ජූලි මාසයේ දී මිල ගණන් තාවකාලිකව ඉහළ ගියේය. තවද, ලෝකයේ විශාලතම නිෂ්පාදකයන්ගෙන් කෙනෙකු වන සෞදි අරාබියේ තෙල් නිෂ්පාදනාගාර දෙකකට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයකට ප්‍රතිචාර වශයෙන් සැප්තැම්බර් මාසයේ මැද භාගයේ දී තෙල් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, මාසයක් තුළ නිෂ්පාදනය යථා තත්ත්වයට පත් කරන බවට සෞදි අරාබිය සහතික වූ බැවින් මෙම මිල වැඩි වීම තාවකාලික විය. ඒ අනුව, ජාත්‍යන්තර වෙළඳපොළේ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි මාසික සාමාන්‍ය එ.ජ. ඩොලර් 59.54 දක්වා ඔක්තෝබර් මාසයේ දී පහත වැටුණි. වසර අවසානය වන විට එක්සත් ජනපද - චීන වෙළඳ ගනුදෙනුව මගින් තෙල් සඳහා වූ ඉල්ලුම ඉහළ නංවනු ඇතැයි යන අපේක්ෂාවෙන් බ්‍රෙන්ට් මිල ගණන් ඉහළ ගියේය. 2019 වසරේ දෙසැම්බර් මස මුල දී, 2020 මාර්තු දක්වා සිය නිෂ්පාදනය සියයට 50කින් අඩු කිරීමට ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (ඔපෙක්) එකඟ වීම, මිල ඉහළ යෑම සඳහා තවදුරටත් හේතු විය. මේ අතර, මැද පෙරදිග පැවති අර්බුද උත්සන්න වීමත් සමඟ 2020 ජනවාරි මස මුල දී බ්‍රෙන්ට් මිල බැරලයකට එ.ජ. ඩොලර් 70ක් දක්වා ඉහළ ගියේය. මැද පෙරදිග පැවති අර්බුද හේතුවෙන් මතු වූ අවිනිශ්චිතතා පහව යෑමත් සමඟ බොරතෙල් මිල පහළ වැටුණු අතර, ලෝකයේ විශාලතම තෙල් ආනයනකරුවා වන චීනයේ කොවිඩ්-19 වසංගතය පැතිරී යෑම නිසා බොරතෙල් මිලෙහි ශීඝ්‍ර අඩු වීමක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020 වසරේ මුල් මාස තුන තුළ බ්‍රෙන්ට් බැරලයක මිලෙහි සාමාන්‍යය එ.ජ. ඩොලර් 51.65ක් විය. ජාත්‍යන්තර මිල ප්‍රවණතාවන්ට අනුකූලව ලං.ඛ.නී.සං. විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2018 වසරේ පැවති එ.ජ. ඩොලර් 76.25ක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් 68.80ක් දක්වා සියයට 9.8කින් පහළ ගියේය. මේ අතර, ලං.ඛ.නී.සං. මගින් ආනයනය කළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත මෙට්‍රික් ටොන් (මෙ.ටො.) එකක මිලෙහි සාමාන්‍යය 2018 වසරේ දී පැවති එ.ජ. ඩොලර් 592ක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් 571ක් දක්වා සියයට 3.6කින් පහළ ගියේය.

**2018 වසරේ මැයි මාසයේ දී මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමේ සිට ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් 2019 සැප්තැම්බර් මස දක්වා ක්‍රමානුකූලව සංශෝධනය කරන ලද අතර, ඉන්පසුව මිල ගණන් වෙනස් කිරීමක් සිදු නොවුණි.** ඒ අනුව, ලං.ඛ.නී.සං.හි ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් 2019 වසරේ දී අට වතාවක් සංශෝධනය කරන ලදී. තවද, වෙළඳපොළේ දෙවන තරගකරුවා වන ලංකා ඉන්දියන් ඔයිල් සමාගම ද වසර තුළ දී සිය මිල ගණන් සංශෝධන සිදු කළේය. 2019 දෙසැම්බර් මස අවසානය වන විට, ලං.ඛ.නී.සං. මගින් අලෙවි කරන පෙට්‍රල් (ඔක්ටේන් 92), පෙට්‍රල් (ඔක්ටේන් 95), සුදු ඩීසල්, සුපිරි ඩීසල්, භූමිතෙල් සහ කාර්මික භූමිතෙල් ලීටරයක පරිපාලිත සිල්ලර මිල, පිළිවෙළින්, රුපියල් 137.00, රුපියල් 161.00, රුපියල් 104.00, රුපියල් 132.00, රුපියල් 70.00, රුපියල් 110.00 යන මට්ටම්වල පැවතුණි. 2018 වසර අවසානයට සාපේක්ෂව 2019 වසර අවසානයේ දී පෙට්‍රල් (92 ඔක්ටේන්), පෙට්‍රල් (95 ඔක්ටේන්), සුදු ඩීසල් සහ සුපිරි ඩීසල්වල මිල ගණන්, පිළිවෙළින්, සියයට 9.6කින්, සියයට 8.1කින්, සියයට 3.0කින් සහ සියයට

### 3.2 රූප සටහන
## ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල හා ලං.ඛ.නී.සං. විසින් ආනයනය කරන ලද බොරතෙල් මිල




මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

9.1කින් වැඩි විය. මේ අතර, දැවි තෙල් 800 සහ දැවි තෙල් 1,500 ලීටරයක මිල 2018 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති රුපියල් 92.00ට සාපේක්ෂව 2019 ජූනි මාසයේ දී රුපියල් 96.00ක් දක්වා වැඩි විය. ද්‍රව ඉන්ධන මත පදනම් කර ගත් විදුලි බල උත්පාදනය සහ ප්‍රවාහන අංශයෙන් ඉහළ ඉල්ලුමක් ඇති වීමත් සමඟ 2019 වසරේ දී දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් අලෙවිය සියයට 4.8කින් වර්ධනය විය. වසර තුළ දී ප්‍රධාන වශයෙන් ප්‍රවාහන අංශයේ ඇති වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් දේශීය පෙට්‍රල් අලෙවිය සියයට 4.2කින් වර්ධනය විය. නියං තත්ත්වයන් හේතුවෙන් ඉහළ ගිය ද්‍රව ඉන්ධන මත පදනම් වූ විදුලි බල උත්පාදනය නිසා පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී ඩීසල් අලෙවිය සියයට 6.5කින් ඉහළ ගියේය. 2019 වසර තුළ දී කාර්මික කටයුතුවල වර්ධනය අඩු වීම පිළිබිඹු කරමින්, කාර්මික අංශය වෙත සිදු කරන ලද සමස්ත ඛනිජ තෙල් අලෙවිය පහත වැටුණි. තවද, පාස්කු ඉරිදා ප්‍රහාර නිසා ගුවන් සේවා අංශයට සිදු වූ ඍණාත්මක බලපෑම හේතුවෙන් ගුවන් සේවා අංශය වෙත අලෙවි කළ ඛනිජ තෙල් ප්‍රමාණය සියයට 5කින් පහළ ගියේය. මේ අතර, සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී භූමිතෙල් අලෙවිය සියයට 1.6කින් අඩු විය.

**ලං.ඛ.නී.සං.වේ මූල්‍ය තත්ත්වය 2019 වසරේ දී දුර්වල මට්ටමක පැවතුණි.** මිල සංශෝධන සිදු කළ ද, විශේෂයෙන් ම පෙට්‍රල් (92 ඔක්ටේන්), ඩීසල් සහ භූමිතෙල් යන ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල සංශෝධනය කිරීමේ දී නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් පරිපාලිත මිල නියම කිරීම නිසා විගණනය

### 3.2 සංඛ්‍යා සටහන
## ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | 2018(අ) | 2019 (ආ) | වර්ධන අනුපාතය % 2018(අ) | වර්ධන අනුපාතය % 2019(ආ) |
|---|---|---|---|---|
| ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000) | | | | |
| බොරතෙල් | 1,674 | 1,842 | 5.2 | 10.0 |
| පිරිපහදු නිෂ්පාදිත | 4,959 | 4,740 | 1.3 | -4.4 |
| ගල් අඟුරු | 2,167 | 2,390 | -14.3 | 10.3 |
| එල්.පී. ගෑස් | 413 | 430 | 6.7 | 4.1 |
| දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000) | 22 | 27 | 13.7 | 22.2 |
| ආනයන වටිනාකම (මි.ර.ගැ.) | | | | |
| බොරතෙල් (රු.මිලියන) | 160,024 | 173,547 | 49.0 | 8.5 |
| (එ.ජ.ඩො. මිලියන) | 978 | 971 | 38.9 | -0.8 |
| පිරිපහදු නිෂ්පාදිත (රු.මිලියන) | 475,521 | 483,462 | 26.7 | 1.7 |
| (එ.ජ.ඩො. මිලියන) | 2,937 | 2,706 | 19.3 | -7.9 |
| ගල් අඟුරු (රු.මිලියන) | 38,750 | 38,719 | -2.4 | -0.1 |
| (එ.ජ.ඩො. මිලියන) | 237 | 215 | -9.5 | -9.3 |
| එල්.පී. ගෑස් (රු.මිලියන) | 43,162 | 43,156 | 21.6 | -0.01 |
| (එ.ජ.ඩො. මිලියන) | 266 | 241 | 14.0 | -9.1 |
| බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.) (රු./බැරල්) | 12,475 | 12,302 | 41.5 | -1.4 |
| (එ.ජ.ඩො./බැරල්) | 76.25 | 68.80 | 31.9 | -9.8 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය (මෙ.ටො. '000) | 1,093 | 984 | 12.5 | -10.0 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම (රු.මිලියන) | 101,467 | 93,194 | 53.1 | -8.2 |
| (එ.ජ.ඩො. මිලියන) | 622 | 521 | 43.2 | -16.2 |
| දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000) | 5,273 | 5,528 | -2.0 | 4.8 |
| ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ) | 1,179 | 1,269 | 6.4 | 7.6 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 189 | 158 | 12.3 | -16.6 |
| සුදු ඩීසල් (ඈ) | 1,987 | 2,139 | -9.5 | 7.7 |
| සුපිරි ඩීසල් | 101 | 85 | 10.6 | -16.3 |
| භූමිතෙල් | 210 | 206 | 30.4 | -1.6 |
| දැවිතෙල් | 949 | 1,011 | -8.8 | 6.6 |
| ගුවන්යානා ඉන්ධන | 499 | 474 | 9.3 | -5.0 |
| නැප්තා | 137 | 162 | -1.6 | 18.1 |
| දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000) | 435 | 466 | 5.7 | 7.0 |
| දේශීය මිල (වර්ෂය අවසානයේ දී) (රු./ලීටර) | | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | 125.00 | 137.00 | 6.8 | 9.6 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 149.00 | 161.00 | 16.4 | 8.1 |
| සුදු ඩීසල් | 101.00 | 104.00 | 6.3 | 3.0 |
| සුපිරි ඩීසල් | 121.00 | 132.00 | 10.0 | 9.1 |
| භූමිතෙල් | 70.00 | 70.00 | 59.1 | - |
| දැවිතෙල් | | | | |
| තත්පර 800 | 92.00 | 96.00 | 11.9 | 4.3 |
| තත්පර 1,500 | 96.00 | 96.00 | 20.0 | - |
| තත්පර 3,500 | ලැ.නො. | ලැ.නො. | - | - |
| එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්) | | | | |
| ලිට්‍රෝ ගෑස් | 138.64 | 119.44 | 21.1 | -13.8 |
| ලාෆ්ස් ගෑස් | 138.64 | 119.44 | 21.1 | -13.8 |
| ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල (එ.ජ.ඩො./බැරල්) | | | | |
| බ්‍රෙන්ට් | 71.76 | 64.04 | 31.0 | -10.7 |
| ඩබ්.ටී.අයි. | 64.99 | 56.96 | 27.6 | -12.4 |
| ලෝක ඛනිජ තෙල් සැපයුම (දිනකට බැරල් මිලියන) | 100.3 | 100.3 | 2.9 | - |
| ලෝක ඛනිජ තෙල් ඉල්ලුම (දිනකට බැරල් මිලියන) | 99.3 | 100.3 | 1.1 | 1.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ලංකා මෙරයින් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ජාත්‍යන්තර බලශක්ති ආයතනය

නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලං.ඛ.නී.සං. 2019 වසරේ දී රුපියල් බිලියන 11.9ක බදුවලට පෙර අලාභයක් වාර්තා කළේය. ඒ අනුව, 2019 වසරේ දී පෙට්‍රල් (ඔක්ටේන් 92), ප්‍රවාහන අංශය සඳහා වූ සුදු ඩීසල් සහ ගෘහස්ථ අංශය සඳහා වූ භූමිතෙල් ලීටරයක් සඳහා මෙහෙයුම් අලාභය, පිළිවෙළින්, රුපියල් 4.72ක්, රුපියල් 7.30ක් සහ රුපියල් 29.01ක් විය. තවද, 2019 වසරේ දී පෙට්‍රල් (ඔක්ටේන් 92), ප්‍රවාහන අංශය සඳහා වූ සුදු ඩීසල් සහ ගෘහස්ථ අංශය සඳහා වූ භූමිතෙල් නිසා ඇති වූ අලාභය, පිළිවෙළින්, රුපියල් බිලියන 8.7ක්, රුපියල් බිලියන 16.0ක් සහ රුපියල් බිලියන 7.7ක් විය. ඒ අනුව, 2019 වසරේ දී ලං.ඛ.නී.සං. විසින් රුපියල් බිලියන 19.1ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. මීට අමතරව, 2019 වසරේ දී ලං.ඛ.නී.සං.හි මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 14.7ක් විය. මේ අතර, ප්‍රධාන ගනුදෙනුකරුවන් වන ලං.වි.ම. හා ශ්‍රීලංකන් ගුවන් සේවය වැනි ආයතනවලින් අය විය යුතු හිඟ මුදල් නොලැබී යෑමෙන් පැන නැඟුණු ද්‍රවශීලතා කළමනාකරණ ගැටලු හේතුවෙන් මෙම කාලසීමාව තුළ ලං.ඛ.නී.සං. විසින් බැංකු අංශයෙන් ලබා ගත් ණය ප්‍රමාණය ඉහළ ගියේය. ඒ අනුව, 2019 වසර අවසානය වන විට රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගෙන් අයවැය යුතු හිඟ මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 154.3ක් දක්වා සියයට 87.9කින් ඉහළ ගියේය. ඒ අනුව, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලං.ඛ.නී.සං.ට අය විය යුතු හිඟ මුදල් 2019 වසර අවසානය වන විට ඉහළ ගියේය. 2019 වසර අවසානයේ දී ලං.වි.ම. සහ ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින්, පිළිවෙළින්, සියයට 55.7ක් හා සියයට 31.3ක් විය.

**සපුගස්කන්ද තෙල් පිරිපහදුව අලුත්වැඩියා කිරීමේ හා නවීකරණය කිරීමේ කටයුතු 2019 වසරේ දී ද අඛණ්ඩව සිදු විය.** නිර්මාණ ආයු කාලයේ අවසානයට ළඟා වී ඇති සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙහි ප්‍රධාන බොරතෙල් ආසවන කුළුන, හයිඩ්‍රජන් භාවිතයෙන් ඩීසල් පිරිපහදුකරණය (Diesel Hydrotreator) සහ ප්ලැට්ෆෝමර් ඒකකය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති වියදම් මනාව පාලනය කරන ලද ඉංජිනේරු සැලැස්මක් සඳහා නිර්මාණකරුවෙකු තෝරා ගැනීමට ලංසු වටයක් කැඳවනු ලැබීය. බොරතෙල් ප්‍රවාහන නල, ඉන්ධන ප්‍රවාහන නල සහ ගබඩා ටැංකි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක විය. පිරිපහදුවේ ධාරිතාව ඉහළ නැංවීමෙන් පසුව මෙම වසර තුළ බිටුමන් (තාර) නිෂ්පාදනය මෙ.ටො. 17,103ක් විය.

**අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණය සඳහා වන නියාමන අධිකාරිය වන ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය 2019 වසරේ දී අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ සංවර්ධන හා නිෂ්පාදන කටයුතු සම්බන්ධව සිය කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** මන්නාරම ද්‍රෝණියේ එම් 2 කොටසේ ඇනට සොයා ගන්නා ලද ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදනය කිරීම සහ තවදුරටත් ගවේෂණය කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා කුඩා ලංසු වටයක් 2019 ජනවාරි මාසයේ දී ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ලංසු වටය 2019 ජූනි මාසයේ දී අවසන් කළ අතර, ලංසු ඇගයීම ද ක්‍රියාත්මක විය. තවද, එම් 2 කොටස සඳහා අලෙවිකරණ වටයක් 2019 මාර්තු මාසයේ දී ආරම්භ විය. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් 2019 මැයි මාසයේ දී එම් 1 සහ සී 1 යන කොටස්වල ගවේෂණ කටයුතු සිදු කිරීමට කැමැත්ත දක්වා යෝජනා ඉදිරිපත් කිරීමට ආරාධනා කරමින් ලංසු වටයක් ක්‍රියාත්මක කරන ලදී. 2019 ජූලි මාසයේ දී ලංසු වටය අවසන් කිරීමෙන් අනතුරුව ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය ඒ පිළිබඳව සිය ඇගයීම් කටයුතු ආරම්භ කළේය.

## විදුලිබලය

**තාප විදුලිබල උත්පාදනය මත වැඩි රැඳියාවක් පවත්වා ගනිමින්, විදුලිබල උත්පාදනය 2018 වසරේ දී නිපද වූ ගිගාවොට් පැය (ගි.වො.පැ.) 15,374ට සාපේක්ෂව 2019 වසරේ දී ගි.වො.පැ. 15,879ක් දක්වා සියයට 3.3කින් ඉහළ ගියේය.** වසරේ මුල් මාස හත තුළ දී පැවති නියං තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, සුළු පරිමාණ ජල විදුලිය හැර, ජලවිදුලි බල උත්පාදනය ගි.වො.පැ. 3,783ක් දක්වා සියයට 26.5කින් අඩු විය. කෙසේ වෙතත්, ජල පෝෂක ප්‍රදේශවලට ලැබෙන වර්ෂාපතනය වැඩි වීමත් සමඟ විදුලිබල උත්පාදනය සඳහා ජල විදුලිබලයේ දායකත්වය වසර අවසානය වන විට ක්‍රමයෙන් වර්ධනය විය. මේ අතර, ද්‍රව ඉන්ධන සහ ගල් අඟුරු භාවිතයෙන් සිදු කරන විදුලි බල උත්පාදනය ගි.වො.පැ. 5,016ක් සහ ගි.වො.පැ. 5,361ක් දක්වා, පිළිවෙළින්, සියයට 38.2කින් හා සියයට 12.5කින් වර්ධනය විය. කෙසේ වෙතත්, සුළු පරිමාණ ජල විදුලිය ඇතුළත්ව, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් සිදු කරන ලද විදුලිබල උත්පාදනය, පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී ගි.වො.පැ. 1,718ක් දක්වා සියයට 6.2කින් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වියළි කාලගුණ

තත්ත්ව හේතුවෙන් සුළු පරිමාණ ජලවිදුලි බලාගාරවල බලශක්ති උත්පාදනය අඩු වීමයි. ඒ අනුව, 2019 වසරේ දී ජලය, ද්‍රව ඉන්ධන, ගල් අඟුරු හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් සිදු කළ විදුලිබල උත්පාදනය, සමස්ත විදුලිබල උත්පාදනයෙන්, පිළිවෙළින්, සියයට 24ක්, සියයට 32ක්, සියයට 34ක් සහ සියයට 11ක් විය. 2019 පළමු කාර්තුව අවසන් වන විට ජල විදුලිබල උත්පාදනය විශාල ලෙස පහත වැටීමත් උණුසුම් කාලගුණ තත්ත්ව සමග වැඩි වන විදුලිබල ඉල්ලුම සැපිරීමත් සඳහා ලං.වි.ම. විසින් අධික පිරිවැයක් සහිත වායු ටර්බයින (gas turbines) ඇතුළු සියලුම තාප විදුලි බලාගාර උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කළ නමුත්, විදුලි කප්පාදු කිරීම සඳහා ද යොමු විය. තවද, 2019 වසරේ මාර්තු මස සහ අප්‍රේල් මස මුල භාගයේ දී ලං.වි.ම විසින් දෛනික විදුලි කප්පාදුවට අදාළ කාලසටහන් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් 11 වන දින සිට බලාත්මක වන පරිදි විදුලි කප්පාදු කිරීම් අවසන් විය. මෙම විදුලි කප්පාදු මහජනයාට සැලකිය යුතු මට්ටමේ අපහසුතාවයක් ඇති කළ අතර, කර්මාන්ත හා සේවා අංශවල කටයුතුවලට ද බලපෑම් ඇති කළේය. 2019 වසරේ දී ලං.වි.ම. සතු විදුලි බලාගාර විසින් මුළු විදුලිබල උත්පාදනය සඳහා දැක්වූ දායකත්වය සියයට 71.1ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලදී.

**3.3 රූප සටහන**

**විදුලිබල උත්පාදන සංයුතිය**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

**3.3 සංඛ්‍යා සටහන**

**විදුලිබල අංශයේ ක්‍රියාකාරීත්වය**

| ශීර්ෂය | 2018 | 2019 (අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2018 | 2019(අ) |
| ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | 4,046 | 4,213 | -2.2 | 4.1 |
| ජල විදුලිබලය (ආ) | 1,399 | 1,399 | 1.1 | - |
| ද්‍රව ඉන්ධන (ඇ) | 1,137 | 1,282 | -12.1 | 12.8 |
| ගල් අඟුරු | 900 | 900 | - | - |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඈ) | 610 | 632 | 8.7 | 3.6 |
| ජනනය කළ ඒකක (ගිගාවොට් පැය) | 15,374 | 15,879 | 4.8 | 3.3 |
| ජල විදුලිබලය (ආ) | 5,149 | 3,783 | 68.4 | -26.5 |
| ද්‍රව ඉන්ධන (ඇ) | 3,629 | 5,016 | -28.1 | 38.2 |
| ගල්අඟුරු | 4,764 | 5,361 | -6.7 | 12.5 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඈ) | 1,832 | 1,718 | 25.1 | -6.2 |
| මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය) | 14,091 | 14,612 | 4.9 | 3.7 |
| ගෘහස්ථ සහ ආගමික | 4,641 | 4,863 | 4.0 | 4.8 |
| කර්මාන්ත | 4,290 | 4,392 | 6.2 | 2.4 |
| පොදු සේවා සහ හෝටල් (ඉ) | 3,412 | 3,563 | 5.9 | 4.4 |
| වීදි ආලෝක කිරීම | 108 | 109 | - | 0.7 |
| ලං.වි. සමාගම (LECO) | 1,640 | 1,684 | 2.8 | 2.7 |
| ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය) | 1,566 | 1,646 | 3.2 | 5.1 |
| ගෘහස්ථ සහ ආගමික | 640 | 692 | 1.7 | 8.1 |
| කර්මාන්ත | 288 | 293 | 2.5 | 1.7 |
| පොදු සේවා සහ හෝටල් (ඉ) | 617 | 640 | 5.3 | 3.7 |
| වීදි ආලෝක කිරීම | 21 | 21 | -4.5 | - |
| ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (%) | 8.3 | 8.0 | -1.9 | -4.3 |
| පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (ඊ) | 6,354 | 6,501 | -5.7 | 2.3 |
| ඉන්, ගෘහස්ථ සහ ආගමික | 5,583 | 5,692 | -5.7 | 2.0 |
| කාර්මික | 63 | 64 | -1.9 | 2.8 |
| පොදු සේවා හා හෝටල් (ඉ) | 709 | 744 | -5.5 | 4.9 |

(අ) තාවකාලික
(ආ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ.
(ඇ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය.
(ඈ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව
(ඉ) රාජ්‍ය අංශය සඳහා සිදුකළ අලෙවිය ද ඇතුළත්ය.
(ඊ) සී. ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

2019 වසරේ දී මුළු විදුලිබල උත්පාදනයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් විට සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ සමස්ත හානිය පෙර වසරේ පැවති සියයට 8.34 සිට සියයට 7.98ක් දක්වා අඩු විය.

2019 වසරේ දී මුළු විදුලිබල අලෙවිය, 2018 වසරේ පැවති ගි.වො.පැ. 14,091ක සිට ගි.වො.පැ. 14,612ක් දක්වා සියයට 3.7කින් වැඩි විය. 2019 වසරේ දී විදුලිබල අලෙවියෙන්, පිළිවෙළින්, සියයට 21.1ක්, සියයට 0.6ක්,

3

සියයට 32.7ක් සහ සියයට 30.1ක් පොදු කාර්ය, ආගමික, ගෘහස්ත සහ කර්මාන්ත යන කාණ්ඩ වෙත සිදු වූ අතර, එම කාණ්ඩ වෙත අලෙවියේ වර්ධනය, පිළිවෙළින්, සියයට 5.1ක්, සියයට 4.9ක්, සියයට 4.8ක් සහ සියයට 2.4ක් විය. කෙසේ වෙතත්, පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව හෝටල් අංශය තුළ කාර්යසාධනය දුර්වල වීම නිසා, සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 1.9කට දායක වන හෝටල් අංශය සඳහා විදුලිබල අලෙවිය 2019 වසරේ දී සියයට 5.4කින් පහත වැටිණි.

**2019 වසරේ දී විදුලිබල උත්පාදනය සඳහා ද්‍රව ඉන්ධන මත අධික ලෙස රඳා පැවතීම හේතුවෙන් ලං.වි.ම. හි මූල්‍ය කාර්යසාධනය දුර්වල විය.** විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලං.වි.ම. විසින් 2018 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 30.5ක බදුවලට පෙර අලාභයට සාපේක්ෂව 2019 වසරේ දී වාර්තා කළ අලාභය රුපියල් බිලියන 85.4ක් විය. 2019 වසරේ මුල් මාස හත තුළ දී පැවති වියළි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් තාප විදුලිය මත යැපීම වැඩි වීම, ලං.වි.ම.හි මූල්‍ය තත්ත්වය පිරිහීමට ප්‍රධාන හේතුව විය. ජලවිදුලිය, ගල් අඟුරු සහ ද්‍රව ඉන්ධන මගින් විදුලිය නිපදවීම සඳහා ලං.වි.ම. විසින් දරන ලද පිරිවැයෙහි සාමාන්‍යය කිලෝ වොට් (කි.වො.) එකක් සඳහා, පිළිවෙළින්, රුපියල් 2.49ක්, රුපියල් 10.48ක් සහ රුපියල් 31.93ක් විය. ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් ලං.වි.ම. විසින් මිල දී ගත් විදුලිය කි.වො. එකක් සඳහා දරන ලද පිරිවැය පෙර වසරේ වාර්තා කළ රුපියල් 24.47ට සාපේක්ෂව රුපියල් 26.47ක් විය. තවද, 2019 වසරේ දී විකුණුම් අවස්ථාවේ සමස්ත විදුලිබල පිරිවැය කි.වො. පැයක් සඳහා රු.23.29ක් ද සමස්ත සාමාන්‍ය ගාස්තුව කි.වො. පැයක් සඳහා රුපියල් 16.62ක් ද වූ බැවින් කි.වො. පැයක් සඳහා අලාභය රු.6.7ක් විය. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව විකුණුම් අවස්ථාවේ සමස්ත සාමාන්‍ය විදුලිබල පිරිවැය මෙන්ම සමස්ත සාමාන්‍ය විදුලිබල ගාස්තුව ද, පිළිවෙළින්, සියයට 21.8කි සහ සියයට 2.0කින් ඉහළ ගොස් තිබේ. 2019 වසරේ දී ගෘහස්ත, පොදු කාර්ය, රාජ්‍ය, කාර්මික සහ හෝටල් යන අංශවල කි.වො. පැයක් සඳහා සාමාන්‍ය විදුලිබල ගාස්තුව, පිළිවෙළින්, රුපියල් 14.11ක්, රුපියල් 23.91ක්, රුපියල් 18.19ක්, රුපියල් 14.72ක් සහ රුපියල් 17.75ක් විය. ලං.වි.ම.හි කෙටිකාලීන ණය සහ ලං.ඛ.නී.සං. හා ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ට ඇති කෙටිකාලීන වගකීම්, 2018 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 142.2 සිට 2019 වසර අවසානය වන විට රුපියල් බිලියන 223.2ක් දක්වා වැඩි විය. මේ අතර, ලං.වි.ම.හි නොපියවා ඉතිරිව ඇති දිගුකාලීන වගකීම්, 2018 වසර අවසන් වන විට පැවති රුපියල් බිලියන 392.2 සිට 2019 වසර අවසන් වන විට රුපියල් බිලියන 421.7ක් දක්වා වැඩි විය. ලං.වි.ම.හි දුර්වල මූල්‍ය තත්ත්වය මගින් ප්‍රශස්ත හා ක්‍රියාවට නැංවිය හැකි බලශක්ති උත්පාදන සංයුතියක් මෙරටට හඳුන්වා දීම ඔස්සේ ලාභදායී ප්‍රභව හරහා විදුලිබලය උත්පාදනය කිරීමේ දැඩි අවශ්‍යතාවය අවධාරණය කෙරේ. තවද, ලං.වි.ම.හි මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග එක්ව පිරිවැය පිළිබිඹු කරන මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. ලං.වි.ම. විසින් ගෙවිය යුතු මුදල් ආපසු නොගෙවීම හේතුවෙන් ලං.ඛ.නී.සං.ට බැංකු අංශයෙන් විශාල වශයෙන් ණය ලබාගැනීමට සිදු වූ අතර, එමගින් පෙන්නුම් කරනු ලබන්නේ රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා බැංකු ණය දීම අඩු කිරීම සඳහා ලං.වි.ම. මුහුණපාන මූල්‍ය ගැටලු වහාම විසඳීමට අවශ්‍ය බවයි. ගෝලීය තෙල් මිලෙහි උච්චාවචනයන් අන්තර්ග්‍රහණය කර දේශීය මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් බොර තෙල් මිල ස්ථායීකරණ අරමුදලක් පිහිටුවීමට 2020 මාර්තු මාසයේ දී කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබිණි.

**2019 වසරේ දී ලං.වි.ම. විසින් වසර 2020-2039 කාලසීමාව සඳහා වන අවම පිරිවැයක් යටතේ විදුලි උත්පාදන විකාශන කිරීමේ දිගු කාලීන සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.** එම විදුලිබල උත්පාදන විකාශන සැලැස්මට අනුව, 2039 වසර වන විට විදුලි උත්පාදනයෙන් සියයට 30ක් ද්‍රවීකෘත ස්වාභාවික වායු මගින් ද, සියයට 30ක් ගල් අඟුරු මගින් ද, සියයට 25ක් මහා පරිමාණ ජලවිදුලි බලාගාර මගින් ද සියයට 15ක් අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සහ දැවි තෙල්වලින් ද කිරීමට සැලසුම් කෙරේ. වැඩිවන බලශක්ති ඉල්ලුම සපුරාලීම සහ ලං.වි.ම.ට දැරීමට සිදු වන පිරිවැය අවම කිරීම සඳහා මෙම උත්පාදන ව්‍යාප්ති සැලැස්ම නිසි කලට ක්‍රියාත්මක කිරීම අතිශයින්ම වැදගත් වේ.

**2019 වසරේ දී ප්‍රධාන විදුලි ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වූ අතර, අතිරේක තාප බලාගාර පිහිටුවීම සඳහා සැලසුම් සකස් කිරීම ද සිදු විය.** 2023 වසරේ ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂිත මෙගාවොට් (මෙ.වො.) 300ක ස්වාභාවික වායු සංයුක්ත බලාගාර දෙකක් සහ කෙලවරපිටියේ දැනට පවත්නා බලාගාරයට දිගුවක් ලෙස මෙ.වො. 300ක ගල් අඟුරු බලාගාරයක් ඉදි කිරීම සඳහා 2019 වසරේ දී

**3.4 රූප සටහන**

**විදුලිබලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව**




(අ) උත්පාදන අන්තයේ සාමාන්‍ය පිරිවැය

මූලයː ලංකා විදුලිබල මණ්ඩලය

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. හබරණ, මොණරාගල, හොරණ සහ පල්ලේකැලේ යන ප්‍රදේශවල ඉදි කිරීමට නියමිත, එක් බලාගාරයක් මෙ.වො. 24ක් බැගින් වන, ඩීසල් විදුලි බලාගාර සඳහා වන යෝජනා සඳහා ඉල්ලීම් සකස් කිරීම ද වර්ෂය තුළ දී ක්‍රියාත්මක වූ අතර, මෙම බලාගාර 2022 වසරේ දී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. 2019 වසරේ දී උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතියේ (මෙ.වො.120) සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතියේ (මෙ.වො.35) ඉදිකිරීම් කටයුතු සිදු වූ අතර, මෙම විදුලි බලාගාර 2020 වසරේ දී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂිත ය. තවද, සීතාවක ගංගා ජලවිදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 24), තල්පිටිගල ජලවිදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 15) සහ මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 30) සම්බන්ධයෙන් මූලික කටයුතු ද ක්‍රියාත්මක විය.

**2019 වසරේ දී රට තුළ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ගන්නා ලදී.** ජාතික විදුලිබල පද්ධතියට මෙ.වො. 100ක් එකතු කිරීමට අපේක්ෂිත මන්නාරම් සුළං විදුලි බලාගාර උද්‍යානයේ ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සහ ඉඩම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර, ඉදි කිරීම් කටයුතු 2019 වසරේ දී ආරම්භ කරන ලදී. ව්‍යාපෘති නිම කිරීම සහ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම 2020 වසරේ දී සිදු කිරීමට අපේක්ෂා කෙරේ. 2019 වසරේ දී පූනරීන් සූර්ය-සුළං දෙමුහුම් බලශක්ති උද්‍යානය සඳහා වන මූලික ශක්‍යතා අධ්‍යයනය ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතායතනය විසින් සිදු කරන ලදී. ඒ අනුව, ව්‍යාපෘතියේ පළමු අදියරේ දී මෙ.වො. 130ක සූර්ය බලශක්ති බලාගාරයක් මුල් වසර දෙකක කාලය තුළ ඉදි කිරීමටත්, ඉන් අනතුරුව එළඹෙන තෙවසර තුළ මෙ.වො. 238.5ක සුළං බලාගාරයක් සංවර්ධනය කිරීමටත් යෝජනා වී තිබේ. මේ අතර, සෑම බලාගාරයක් ම මෙ.වො. එකක ධාරිතාවයකින් යුක්ත සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ව්‍යාපෘති 35ක් ඉදිවෙමින් පවතින අතර, සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ව්‍යාපෘති 75ක් සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ කටයුතු 2019 වසරේ දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මේ අතර, 2019 වසරේ දී පාරිභෝගිකයන් 1,545ක් සූර්ය බල සංග්‍රාමයට සම්බන්ධ වූ අතර, මෙම ව්‍යාපෘතිය යටතේ මෙ.වො. 18ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත.

**2019 වසරේ දී විශ්වාසදායක, ආර්ථික වශයෙන් දැරිය හැකි සහ තිරසාර බලශක්ති සියලු ම පුරවැසියන් වෙත ලබාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය ක්‍රියාකාරීව කටයුතු කළේය.** ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය විසින් වාණිජ, කාර්මික හා ගෘහස්ථ අංශවල බලශක්ති සංරක්ෂණයට පහසුකම් සැපයීම අඛණ්ඩව කටයුතු කළ අතර, ඒ අනුව 2019 වසරේ දී බලශක්ති කළමනාකරුවන් හත් දෙනෙකු සඳහා ප්‍රතීතන ලබා දෙනු ලැබුණි. 2019 වසර අවසන් වන විට බලශක්ති කළමනාකරුවන් 223ක් ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇත. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ දී සාමාන්‍ය ජනතාව දැනුම්වත් කිරීම සඳහා ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය විසින් බලශක්ති අධ්‍යාපනය හා බලශක්ති සංරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන් සහ විදුලක ජාතික සම්මන්ත්‍රණය පවත්වන ලදී. තවද, වසර 2030 වන විට විදුලි උත්පාදනයෙන් සියයට 80ක් පුනර්ජනනීය සම්පත්වලින් උත්පාදනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාව සියයට 20කින් ඉහළ නැංවීම යන අභියෝගාත්මක ඉලක්ක සපුරාලීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය කටයුතු කළේය.

**2019 වසරේ දී විදුලිබල අංශය නියාමනය කිරීමට පියවර කිහිපයක් ගන්නා ලදී.** වසර තුළ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් රට තුළ විදුලි වාහන භාවිතය ඉහළ නැංවීම පිළිබඳව රජය සඳහා ප්‍රතිපත්ති උපදෙස් ලේඛනයක් සකස් කරන ලදී. ඒ අනුව, විදුලි වාහන සඳහා බදු ව්‍යුහය නැවත සලකා බැලීම, නාගරික සංවර්ධන සැලසුම්වල විදුලි වාහන ආරෝපන පහසුකම් සපයන ස්ථාන ඇතුළත් කිරීම, ගොඩනැගිලි සැලසුම් කිරීමේ ක්‍රියාවලිවල මූලික අවශ්‍යතාවක් ලෙස විදුලි වාහන ආරෝපණ පහසුකම්

3

**විශේෂ සටහන 6**

## තිරසාර වර්ධනය හා සංවර්ධනය බලගැන්වීම

### හැඳින්වීම

කාර්මික නිෂ්පාදනය, ප්‍රවාහනය සහ ගෘහ පරිභෝජනය ඇතුළු සියලු ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මූලික යෙදවුමක් වන බලශක්තිය ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ. ලොව පුරා වැඩිවන බලශක්ති පරිභෝජනය තුළින් ඇති වූ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ඉමහත් වුව ද, එවැනි ඉහළ බලශක්ති භාවිතය පාරිසරික පද්ධති හා සමාජය කෙරෙහි විශාල වශයෙන් බලපෑම් ඇති කරන්නේ මූලික වශයෙන් තිරසාර නොවන භාවිතයන් හේතුවෙනි. මෙම තිරසාර නොවන බලශක්ති භාවිතයන් හේතුවෙන් බලශක්ති ප්‍රභව වේගයෙන් ක්ෂයවීම පමණක් නොව, ජීවීන්ට මෙන්ම පරිසරයට ද අහිතකර බලපෑම් ඇති කළ හැකිය. බලශක්ති සඳහා ඇති මූලික අවශ්‍යතාවය වෙනස් කළ නොහැකි වුව ද, පොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති ප්‍රභවයන් මගින් ඇතිවන අහිතකර බලපෑම් හේතුවෙන්, වඩාත් තිරසාර බලශක්ති ප්‍රභව තෝරා ගැනීමේ අවශ්‍යතාවය ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුනා ගෙන ඇත. එබැවින්, බලශක්ති ප්‍රභවයන් කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම, එක්සත් ජාතීන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා වන මූලික අවශ්‍යතා ලෙස හඳුනා ගෙන ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක-7 යටතේ, සියලු රටවල් සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය ලබා දීමට කැප වී සිටිති. පුළුල් වශයෙන් ගත් කළ, විශේෂයෙන්ම කාර්මිකකරණය, ආර්ථික වර්ධනය, තිරසාර නගර, දරිද්‍රතාවය පිටු දැකීම, සෞඛ්‍ය, අධ්‍යාපනය මෙන්ම දේශගුණික විපර්යාස හා සම්බන්ධ ඉලක්ක ඇතුළුව, සැම තිරසාර සංවර්ධන ඉලක්කයක් ම පාහේ සාක්ෂාත් කර ගැනීමට තිරසාර බලශක්තිය උපකාරී වේ. ශ්‍රී ලංකාව ද අත්සන් තබා ඇති පැරිස් ගිවිසුම-2015 මගින්, කාබන් භාවිතය අධික ආර්ථික වර්ධනය තවදුරටත් තිරසාර සංවර්ධන මාවතක් නොවන බව පිළිගෙන තිබේ. එබැවින්, පිරිසිදු හා තිරසාර බලශක්ති ප්‍රභවයන් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ පදනම විය යුතුය.

තිරසාර බලශක්තිය යනු, පරිසර හිතකාමී ලෙස දැරිය හැකි මිලකට, වර්තමාන හා අනාගත පරම්පරාවන්ට ප්‍රමාණවත් සහ විශ්වාසදායක බලශක්තියක් ලබා දිය යුතු බව නිර්දේශ කරන බහුමාන සංකල්පයකි. තිරසාර බලශක්ති භාවිතයට පැතිකඩ තුනක් ඇතුළත් ය: පළමුව, හරිතාගාර වායු විමෝචනය සහ හානිකර හා විෂ සහිත අපද්‍රව්‍ය අවම කිරීම මෙන්ම ජෛව විවිධත්වයට අහිතකර බලපෑම් අවම කිරීම අරමුණු කරගත් පාරිසරික තිරසාර බව; දෙවනුව, දරිද්‍රතාවය තුරන් කිරීම ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ යහපැවැත්ම මෙන්ම බලශක්ති සුරක්ෂිතතාවය ද ඇතුළත් සමාජ තිරසාරභාවය; තෙවනුව, බලශක්ති ප්‍රභවයන්හි අඩු පිරිවැය සහ දැරිය හැකි බව සහතික කරන ආර්ථික තිරසාරභාවය, බලශක්ති සැපයුමේ විශ්වසනීයත්වය සහ බලශක්ති උත්පාදනයට අදාළව රැකියා උත්පාදනයයි. පුනර්ජනනීය බලශක්තිය සාමාන්‍යයෙන් තිරසාර බලශක්ති ප්‍රභවයක් ලෙස හැඳින්වුව ද, සෑම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක්ම තිරසාර වීම අත්‍යවශ්‍ය නොවේ. නිදසුනක් ලෙස, ජෛව ස්කන්ධය (bio mass) පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වන නමුත් ජෛව ස්කන්ධ නිෂ්පාදනය සඳහා වනාන්තර හෙළි කිරීම සහ ජල හිඟ ප්‍රදේශයක ජෛව ස්කන්ධ නිෂ්පාදනය සඳහා ශාක වගා කිරීම පාරිසරික වශයෙන් තිරසාර භාවිතයන් නොවේ. එබැවින්, පුනර්ජනනීය බලශක්තිය ද තිරසාර ලෙස භාවිතා කළ යුතුය. පාරිසරික, සමාජයීය හා ආර්ථික වශයෙන් ගත කළ, සියලුම බලශක්ති ප්‍රභවයන් සතුව වාසි සහ අවාසි ඇත. එබැවින්, රටකට තිබෙන සියලු බලශක්ති ප්‍රභවයන් සලකා බලා ඒවායේ ඇති වාසි සහ අවාසි සමාලෝචනය කිරීමෙන් පසු සුදුසු තිරසාර බලශක්ති සංයුතියක් තෝරා ගත යුතුය. මේ අතර, තිරසාර බලශක්ති භාවිතයේ දී බලශක්ති සැපයුම පමණක් නොව විශේෂයෙන්ම බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත බලශක්ති භාවිතය තුළින් බලශක්ති ඉල්ලුම වෙත ද යොමු වීම අවධාරණය කරයි.

**රූප සටහන වි.ස. 6.1**

**ශ්‍රී ලංකාවේ ප්‍රාථමික බලශක්තිය, ප්‍රභවය අනුව - 2017**




මූලය: ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2017, ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය

රටක ආර්ථික සංවර්ධනය හා බලශක්ති භාවිතය අතර ශක්තිමත් ධනාත්මක සම්බන්ධයක් පවතින අයුරින්ම හරිතාගාර වායු විමෝචනය සමඟ ද එවැනි සම්බන්ධයක් බොහෝ විට දක්නට ඇත. කෙසේ වෙතත්, පුනර්ජනනීය නොවන බලශක්තිවලට වඩා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට මෙම සහසම්බන්ධය අඩු කිරීමට සහ තිරසාර

සංවර්ධනයට දායක වීමට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. කෙසේ වෙතත්, රූප සටහන වි.ස. 6.1හි දැක්වෙන පරිදි, රටේ ප්‍රාථමික බලශක්ති සැපයුමෙන් සියයට 55ක් සඳහා පොසිල ඉන්ධන දායක වේ. මේ අතර, ශ්‍රී ලංකාවේ සමස්ත බලශක්ති ඉල්ලුම 2005 දී පෙටා ජූල්[1] 336.8 සිට 2017 වන විට පෙටා ජූල් 423.8ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එමගින් සමස්ත බලශක්ති ඉල්ලුම, වාර්ෂිකව සියයට 1.9කින් වර්ධනයක් වූ බව පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකා බලශක්ති තුලනය-2017 වාර්තාවට අනුව, මූලික වශයෙන් ඛනිජ තෙල් බලශක්ති ප්‍රභවය ලෙස භාවිතා කරන ප්‍රවාහන අංශය, රටේ බලශක්ති ඉල්ලුමෙන් සියයට 36කට පමණ දායක වේ. බලශක්ති සැපයුම අතින් ගත් කළ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විතීයික[2] බලශක්ති ප්‍රභවය වන විදුලිබලය මගින් රටේ සමස්ත බලශක්ති ඉල්ලුමෙන් සියයට 11.4ක් සපුරා ඇත (ශ්‍රී ලංකා බලශක්ති තුලනය-2017). කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය කාබන්-අධික ප්‍රාථමික බලශක්ති ප්‍රභවයන් මත දැඩි ලෙස රැඳී පවතින අතර, 2019 දී එම කාබන් අධික ප්‍රාථමික බලශක්ති ප්‍රභවයන් සමස්ත විදුලි උත්පාදනයෙන් සියයට 66කට දායක විය. රටේ ඉන්ධන තෙල් හා ගල් අඟුරු මත පදනම් වූ විදුලි උත්පාදනය වැඩිවීමත් සමග ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ කාබන් ඩයොක්සයිඩ් විමෝචන සාධකය[3] 2010 වසරේ දී කිලෝවොට් පැයකට කාබන් ඩයොක්සයිඩ් ග්‍රෑම් 315.8ක සිට 2017 වසර වන විට කිලෝවොට් පැයකට කාබන් ඩයොක්සයිඩ් ග්‍රෑම් 584.5ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස වසර හතක් තුළ විදුලිබල අංශයෙන් කාබන් ඩයොක්සයිඩ් විමෝචනය සියයට 85කින් වැඩි වී තිබේ. 2017 වසරේ දී කාබන් ඩයොක්සයිඩ් විමෝචන සාධකය මගින් පෙන්නුම් කරනු ලබන්නේ එම වර්ෂය තුළ විදුලිබල අංශය විසින් කාබන් ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් මිලියන 8.575ක් විමෝචනය කරන ලද බවය. මෙම ප්‍රවණතා මගින්, ප්‍රවාහන හා විදුලි උත්පාදනය සඳහා පිරිසිදු හා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරුවීමේ අවශ්‍යතාවය පෙන්නුම් කෙරෙන අතර, සමස්ත බලශක්ති අංශයේ තිරසාර බව තහවුරු කිරීම සඳහා, බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතිරිකිරීම් ක්‍රමවේද භාවිතයෙන් බලශක්ති ඉල්ලුමේ වර්ධනය පාලනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කෙරේ.

**විදුලිබල හා ප්‍රවාහන අංශවල තිරසාර බලශක්ති ප්‍රභවයන් ලෙස පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම**

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වන සූර්ය කිරණ, සුළං, භූ තාපය, සමුද්‍ර තරංග සහ වඩදිය බාදිය සාමාන්‍යයෙන් තිරසාර බලශක්ති ප්‍රභවයන් ලෙස සැලකේ. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ස්වාභාවික ක්‍රියාවලීන්ගෙන් උපදවන බැවින්, එම සම්පත් අනාගතයේ දී ලබා ගත හැකි බව සහතික කරමින් ඒවා නිරන්තරයෙන් ප්‍රතිපූරණය වේ. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් සිදු වන හරිතාගාර වායු විමෝචනය අවම හෝ ශුන්‍ය වේ. එබැවින් පුනර්ජනනීය බලශක්තිය වෙත යොමුවීම දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීමට උපකාරී වේ. සාමාන්‍යයෙන්, පොසිල ඉන්ධන වැනි පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන්ගේ මිල, ඉල්ලුම හා සැපයුම් තත්ත්ව හේතුවෙන් දැඩි ලෙස විචලනය වීමකට ලක් වන අතර භූ-දේශපාලනික ගැටුම්වලින් නිතර බලපෑම්වලට ලක් වේ. එබැවින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත විවිධාංගීකරණය වීම මගින් පොසිල ඉන්ධන සඳහා ඇති ඉල්ලුම අඩු කරන අතර එමගින් පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන් මිලදී ගැනීමේ පිරිවැය අඩු කෙරේ. ශ්‍රී ලංකාව විදුලිය උත්පාදනය සඳහා ආනයනය කරන ලද පොසිල ඉන්ධන මත දැඩි ලෙස රඳා පැවැත්ම හේතුවෙන්, වෙළඳ ශේෂය සහ විනිමය අනුපාතය කෙරෙහි බලශක්ති අංශය විශාල බලපෑමක් සිදු කරයි. තිරසාර පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරුවීම, රටේ බාහිර අංශය මත ඇති කරන බර බොහෝ දුරට ලිහිල් වීමට හේතු වනු ඇත.

තිරසාර සංවර්ධනය සඳහා වර්තමානයේ පවතින ප්‍රවණතාවත් සමග ගෝලීය දේශගුණික විපර්යාස අවම කිරීම සහ බලශක්ති සැපයුමේ සුරක්ෂිතතාවය ඇති කිරීමට පුනර්ජනනීය බලශක්ති මගින් සිදු කරන කාර්යභාරය ලොව පුරා පුළුල් ලෙස පිළිගැනීමට ලක්ව ඇත. ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති ආයතනයේ පුනර්ජනනීය ධාරිතා සංඛ්‍යාලේඛන-2019 වාර්තාවට අනුව, පුනර්ජනනීය බලශක්තින් 2018 දී ගෝලීය නව විදුලි උත්පාදන ධාරිතා එකතු කිරීම්වලින් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයකට දායක විය. ඒ අනුව, 2018 දී චීනය සහ ඇමරිකා එක්සත් ජනපදය විසින් ප්‍රමුඛත්වය ගෙන ගෝලීය සුළං විදුලි උත්පාදන ධාරිතාව ගිගාවොට් 49කින් වැඩි කර ඇත. මේ අතර, ගිගාවොට් 94ක් එකතු කිරීමත් සමග ලෝකයේ සූර්ය විදුලි උත්පාදන ධාරිතාව සියයට 24කින් වර්ධනය විය. 2018 වසරේ දී සියයට 11.4ක වර්ධනයක් වාර්තා කරමින්, නව පුනර්ජනනීය බලශක්ති ස්ථාපනයන්ගෙන් සියයට 61ක් සිදු කර ඇත්තේ ආසියාව මගිනි (International Renewable Energy Agency, 2019a). නමුත්, ඕෂනියාව සියයට 17.7ක වේගවත්ම වර්ධනයක් වාර්තා කළ අතර, එය ප්‍රධාන වශයෙන් ඕස්ට්‍රේලියාවේ සූර්ය බලශක්ති උත්පාදන ධාරිතාවේ විශාල වැඩිවීමක ප්‍රතිඵලයකි. තවද, පුනර්ජනනීය බලශක්ති භාවිතයේ වර්ධනය හේතුවෙන් 2018 වසරේ දී මෙට්‍රික් ටොන් 215ක කාබන් ඩයොක්සයිඩ් විමෝචන වළක්වා ඇති අතර, එයින් විශාල කොටසක් බලශක්ති ක්ෂේත්‍රයේ පුනර්ජනනීය බලශක්තිය වෙත මාරුවීම මගින් සිදු කර ඇත (International Energy

---

1 පෙටා ජූල් = ජූල් $10^{15}$

2 ද්විතීයික බලශක්තිය යනු වෙනත් බලශක්ති ප්‍රභවයන් යොදාගෙන බලශක්ති පරිවර්තන ක්‍රියාවලීන් හරහා නිර්මාණය කරගනු ලබන වඩාත් පහසු බලශක්ති ප්‍රභේදයන්ය.

3 ශ්‍රී ලංකාවේ බලශක්ති තුලනය-2017 වාර්තාවට අනුව, කාබන් ඩයොක්සයිඩ් විමෝචන සාධකය ගණනය කරනු ලබන්නේ එම වර්ෂයේ දී විදුලිබල ක්ෂේත්‍රයේ සමස්ත විමෝචන එම වසරේ දී නිෂ්පාදනය කරන ලද මුළු විදුලි ඒකක ගණනින් බෙදීමෙනි.

Agency, 2019b). ජල විදුලිය මත දැඩි ලෙස රැඳී සිට බ්‍රසීලය (ජාතික විදුලි ඉල්ලුමෙන් සියයට 80කට වඩා වැඩි), ඉහළ යන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා වෙනත් පුනර්ජනනීය තාක්ෂණයන් වෙත යොමු වී ඇති අතර, නියඟ වර්ෂවල දී රටේ බලශක්ති හිඟයක් මතු වීමට ඇති අවදානම එමගින් අවම කිරීමට ද අපේක්ෂා කරයි. මේ අතර, චිලී රාජ්‍යය 2025 වන විට පුනර්ජනනීය විදුලිය (ජල විදුලිය හැර) සඳහා සියයට 20ක ජාතික ඉලක්කයක් ඇති කරගෙන ඇත. ගල් අඟුරු විශාලතම ප්‍රාථමික බලශක්ති ප්‍රභවය ලෙස දිගටම පැවතුන ද, ඉන්දියාව වැඩි වැඩියෙන් පුනර්ජනනීය බලශක්තිය භාවිත කරමින් සූර්ය බලශක්තිය සඳහා ආයෝජනය වැඩි කර පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් ලෝකයේ ප්‍රමුඛයෙක් වීමට අරමුණු කරයි.

3

තවද, ලොව පුරා ප්‍රවාහන පද්ධති ද ක්‍රමයෙන් අඩු විමෝචන විකල්පයන් වෙත යොමු වෙමින් සිටී. ඒ අනුව විදුලියෙන් ධාවනය වන වාහන මගින් ගමනාගමනය රටවල් පුරා වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ලෝකයේ විදුලි මෝටර්රථ සංචිතය 2018 වසරේ දී මිලියන 5.1ක් ඉක්මවා ගිය අතර එය පෙර වසරට වඩා මිලියන 2ක වැඩිවීමකි. ලෝකයේ විශාලතම විදුලි මෝටර්රථ වෙළඳපොළ චීනය වන අතර, එයින් පසුව යුරෝපය සහ එක්සත් ජනපදය සිටින නමුත්, වෙනත් රටවල් ද විද්‍යුත් වාහන භාවිතය දෙසට යොමු වීමක් දක්නට ලැබේ (International Energy Agency, 2019c). නිදසුනක් වශයෙන්, චීනයට පසු ලෝකයේ විශාලතම විදුලි බස්රථ සමූහය චිලී රාජ්‍යය සතුව පවතියි. 2040 වන විට චිලී රාජ්‍යය සිය පොදු ප්‍රවාහන පද්ධතියෙන් සියයට සියයක් ද, 2050 වන විට පෞද්ගලික ප්‍රවාහන පද්ධතියෙන් සියයට 40ක් ද විදුලියෙන් ධාවනය කිරීමට අපේක්ෂා කරයි. එක්සත් රාජධානිය, නෙදර්ලන්තය සහ බෙල්ජියම ඇතුළු බොහෝ යුරෝපීය රටවල් සිය විදුලි බස්රථ සංඛ්‍යාව වැඩි කිරීමට කැපවී සිටිති. මීට අමතරව, ලොව පුරා විදුලි මෝටර් රථ සංඛ්‍යාවෙන් දළ වශයෙන් සියයට 8ක් පමණ ඩෙන්මාර්කය, ෆින්ලන්තය, අයිස්ලන්තය, නොර්වේ සහ ස්වීඩනය යන රටවල භාවිතා වේ. තවද, ලෝකයේ ඉහළම ඒක පුද්ගල විදුලි වාහන භාවිතය නෝර්වේ, අයිස්ලන්තය සහ ස්වීඩනයේ ඇත. තවත් දියුණු ආර්ථිකයන් බොහොමයක් අතර, නවසීලන්තය ද 2050 වන විට ශුන්‍ය වූ ශුද්ධ විමෝචන ආර්ථිකයකට යොමුවීම සඳහා ප්‍රතිපත්ති අනුගමනය කරමින් සිටියි (International Renewable Energy Agency, 2019c). කෙසේ වෙතත්, විද්‍යුත් වාහන භාවිතයේ තිරසාරභාවය රඳා පවතින්නේ වාහන ආරෝපණය කිරීමට භාවිතා කරන විදුලියේ කාබන් තීව්‍රතාව මතය. රටේ විදුලිබල නිෂ්පාදනය පොසිල ඉන්ධන මත බොහෝ දුරට රඳා පවතින්නේ නම්, විදුලි වාහනවලින් පවා විශාල කාබන් පියසටහනක් ඇති විය හැකිය.

ජල විදුලිය, සූර්ය හා සුළං බලශක්තිය වැනි පුනර්ජනනීය සම්පත් කිහිපයකින් ශ්‍රී ලංකාව පොහොසත්ය. රටේ විදුලි උත්පාදනයෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ළඟාකර ගෙන ඇත්තේ මූලික වශයෙන් ජල විදුලිය ද ඇතුළුව පුනර්ජනනීය සම්පත්වලිනි. කෙසේ වෙතත්, රටෙහි නිරන්තරයෙන් හා දැඩිව මතුවන නියං කාලපරිච්ඡේද හේතුවෙන් ජල විදුලිය අඩු විශ්වාසදායක බලශක්ති ප්‍රභවයක් බවට පත්ව ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පොසිල ඉන්ධන මත පදනම් වූ විදුලිබල උත්පාදනය පෙර නොවූ විරූ ලෙස ඉහළ ගොස් තිබේ. මේ අතර, අවට ප්‍රදේශවලට ඇති කරනු ලබන සමාජ හා පාරිසරික බලපෑම් හේතුවෙන්, විශාල ජලවිදුලි ව්‍යාපෘති වඩා සංකීර්ණ වී තිබේ. අනෙක් අතට, සූර්ය හා බලශක්තිය වැනි සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ශ්‍රී ලංකාව තුළ තවමත් පුළුල් ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැත. දූපතක් වන ශ්‍රී ලංකාවට මුහුදු රළ හා වඩදිය බාදිය මගින් විදුලිය උත්පාදනය කිරීමේ හැකියාවක් ඇතත්, මෙය මෙතෙක් මෙරට දී භාවිතයට නොගත් විභවයක්ව පවතී. කෙසේ වෙතත්, ආනයනය කරන ලද තෙල් හා වර්ෂාපතනය මත යැපීම දිගු කාලීනව අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත. ලං.වි.ම.යේ අවම පිරිවැය සහිත උත්පාදන විකාශන දිගු කාලීන සැලැස්මට අනුකූලව, 2030 අවසන් වන විට විදුලි බල උත්පාදනය සඳහා මහා පරිමාණ ජලවිදුලිය හැරුණු විට පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය වර්තමානයේ පවතින සියයට 10.7 සිට සියයට 15 දක්වා වැඩි කිරීමට ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන අධිකාරිය අරමුණු කරයි. ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන අධිකාරිය, ලං.වි.ම. සහ ලංකා විදුලිබල (පුද්.) සමාගම (ලෙකෝ) සමඟ එක්ව, රජය විසින් 2016 දී ප්‍රජා පාදක සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් වන සූර්ය බලශක්ති සංග්‍රාමය දියත් කරන ලදී. මෙම වැඩසටහන 2020 වන විට ජාතික විදුලිබල පද්ධතියට මෙ.වො. 200 ක් සහ 2025 වන විට මෙ.වො. 1,000ක් එක් කිරීමට අපේක්ෂා කරයි. මේ අතර, මන්නාරම සහ පුනරින් හි සුළං බලාගාර කිහිපයක් ඉදිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. අපද්‍රව්‍ය කළමනාකරණය රට තුළ බරපතල ගැටලුවක් වී ඇතත්, මේ දක්වා මෙරට ක්‍රියාත්මක කර ඇත්තේ අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ එක් ව්‍යාපෘතියක් පමණි. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උත්පාදනයේ වර්ධනය තවමත් මන්දගාමී මට්ටමක පවතින අතර, එබැවින් රටේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උත්පාදනයේ ධාරිතාවය වේගයෙන් ව්‍යාප්ත කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ සාමූහිකව ප්‍රයත්න දැරිය යුතුය.

**තිරසාර බලශක්ති ප්‍රභවයන් ලෙස සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවල ඇති සීමා**

වෙනත් ඕනෑම බලශක්ති ප්‍රභවයක් මෙන්ම සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවල ද තිරසාරභාවය සම්බන්ධයෙන් සීමාවන් ඇත. සූර්යබලය හා සුළංබලය

වැනි සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවල භාවිතය සඳහා ඇති මූලික බාධකය වන්නේ විදුලි බලාගාර ස්ථාපනය කිරීමට අදාළ ඉහළ ප්‍රාග්ධනයයි. මෙම ප්‍රභවයන් සඳහා සාමාන්‍යයෙන් විශාල ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ආරම්භයේ දී ම අවශ්‍ය වුව ද, දිගුකාලීන ආර්ථික ප්‍රතිලාභ අවිනිශ්චිත වන අතර ඒවා විදුලිබල ජනනය සඳහා ගෙවන ගාස්තු වැනි ජාතික ප්‍රතිපත්තිමය කරුණු මත යම්තාක් දුරකට රඳා පවතී. එබැවින් මූල්‍ය ආයතන විසින් පුනර්ජනනීය ව්‍යාපෘති අවදානම් සහගත යැයි සැලකීමට ඉඩ ඇති හෙයින් ව්‍යාපෘති සඳහා ණය ලබා දීමේ දී ඉහළ පොලී අනුපාත අය කරනු ඇත. සාමාන්‍යයෙන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් විමධ්‍යගත ජනන ආකෘතියක් ඇති කරන අතර, එබැවින් කුඩා ජනන මධ්‍යස්ථාන විශාල ප්‍රදේශයක් පුරා විහිදී පවතී. එවැනි ආකෘතිවල සම්ප්‍රේෂණ පිරිවැය සාපේක්ෂව ඉහළ වන අතර, ඒ හේතුවෙන් විදුලිය නිපදවන්නන්ට සහ අවසන් පාරිභෝගිකයින්ට මූල්‍යකරණය සැලකිය යුතු බාධකයක් විය හැකිය. සම්ප්‍රදායික නොවන බොහෝ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්වල සාමාන්‍ය උත්පාදන පිරිවැය ගල් අඟුරුවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බව තවමත් විශ්වාස කෙරෙන කරුණකි. කෙසේ වෙතත්, බලශක්ති ප්‍රසම්පාදනය සඳහා තරගකාරී ලංසු තැබීම, විශේෂයෙන් ගෘහස්ථ නිෂ්පාදකයන් වැනි සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිපදවන්නන් සඳහා රජය විසින් ලබා දෙන ප්‍රදාන සහ සහනාධාර, සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පැනල් ආනයනය සඳහා තීරුබදු නිදහස් කිරීම වැනි පියවර හරහා බොහෝ රටවලට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්ගේ පිරිවැය විශාල ලෙස අඩු කිරීමට මෑත වසරවල දී හැකි වී තිබේ. උදාහරණයක් ලෙස, ආනයනික ගල් අඟුරුවලින් බලශක්ති උත්පාදනය සඳහා වන පිරිවැයට සමාන හෝ අඩු පිරිවැයකින් සුළං බලශක්තිය නිපදවීමට ඉන්දියාවට හැකි වී තිබේ (Shrimali et al., 2015). එපමණක් නොව, 2010 වසරේ සිට 2018 වසර දක්වා කාලය තුළ දී ඉන්දියාවේ සූර්ය බලශක්ති බලාගාර පිහිටුවීමේ පිරිවැය සියයට 80කින් අඩු වී ඇති අතර, 2018 දී නව සූර්ය බලශක්ති බලාගාර සඳහා ලෝකයේ අඩුම ස්ථාපන පිරිවැය එරට වාර්තා කර ඇත (International Renewable Energy Agency, 2019b). මේ අතර, ලං.වි.ම.හි ඇස්තමේන්තුවල දක්වා ඇති ගල් අඟුරු බලාගාර උත්පාදන පිරිවැයට ගල් අඟුරු බලාගාරය සඳහා යෙදවූ පිරිවැය ඇතුළත් නොවන අතර, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සඳහා පිරිවැය ඇස්තමේන්තු කිරීමේ දී එම නිෂ්පාදකයින්ට ලං.වි.ම. විසින් ව්‍යාපෘති පිරිවැය ආපසු ගෙවීම ඇතුළත් කර ඇත. එබැවින් විවිධ බලශක්ති ප්‍රභවයන්ගේ පිරිවැය සංසන්දනය කිරීම සඳහා ලං.වි.ම.හි පිරිවැය ඇස්තමේන්තු කෙලින්ම භාවිතා කළ නොහැක. ඒ අනුව, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2017 වසරේ දී ශ්‍රී ලංකාවේ ගල් අඟුරු සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්හි පිරිවැය, පිළිවෙලින්, කිලෝ වොට් පැයකට එ.ජ. ඩොලර් ශත 9ක් සහ කිලෝ වොට් පැයකට එ.ජ. ඩොලර් ශත 11.33 ලෙස ගණන් බලා ඇත. ගල් අඟුරු විදුලිබල උත්පාදනය සඳහා වන පිරිවැය ඇස්තමේන්තුවට පරිසර හානි පිරිවැය ඇතුළත් නොවන හෙයින්, ශ්‍රී ලංකාවේ පවා පිරිවැය ඇස්තමේන්තු අනුව සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්ට වඩා ගල් අඟුරු පැහැදිලිවම ලාභදායී ලෙස සැලකිය නොහැකිය.

පුනර්ජනනීය බලශක්ති සම්පත් ලොව පුරා ලබා ගත හැකි වුව ද, මෙම සම්පත් බොහොමයක් ස්ථාවරව ලබාගත හැකි බලශක්ති ප්‍රභව නොවන අතර ඒවා වසර පුරා එක සේ නොපවතී. සූර්ය, සුළං, තරංග සහ උදම් බලශක්ති ප්‍රභවයන් කාලගුණය සහ දවසේ වේලාව අනුව ස්ථාවරව නොපැවතීමට ඉඩ ඇත. බොහෝ විදුලිබල සැපයුම් ජාල ඉදිකර ඇත්තේ, ඛනිජ තෙල් හෝ ගල් අඟුරු පදනම් කරගත් බලාගාර වැනි ස්ථාවර බලශක්ති ප්‍රභවයන්ට අනුකූල වන ආකාරයටයි. කෙසේ වෙතත්, මෙම ප්‍රභවයන්ගේ එකතුවක් භාවිතා කිරීමෙන්, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ අස්ථාවරභාවය සමස්තයක් ලෙස අඩු කළ හැකිය. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වැඩි වැඩියෙන් පද්ධතියට ඒකාබද්ධ වීමත් සමඟ, විදුලි ඉල්ලුමේ දෛනික විචල්‍යතාවයට ගැළපෙන බව සහතික කිරීම සඳහා විදුලිබල සැපයුම් ජාලයේ වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය වේ. තවද, දේශගුණය, භූ ලක්ෂණ සහ වෘක්ෂලතාදිය වැනි භූගෝලීය සීමාවන් ද පුනර්ජනනීය බලශක්ති බලාගාර ස්ථාපනය කිරීමට බලපායි. සූර්ය බලශක්ති භාවිතයට එරෙහිව ඇති අතිරේක අභියෝගය වන්නේ සූර්ය පැනලවල ඊයම්, ක්‍රෝමියම් සහ කැඩ්මියම් වැනි බැර ලෝහ අඩංගු වන බැවින් සෞඛ්‍ය හා පාරිසරික උපද්‍රව ඇති නොකර සූර්ය පැනල ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ බැහැර කිරීමයි. මෙය තරමක් මිල අධික ක්‍රියාවලියක් විය හැකිය.

**ඉදිරි දැක්ම**

ආර්ථික හා මානව සංවර්ධනය සඳහා තිරසාර බලශක්ති භාවිතය ඉතා වැදගත් වේ. විදුලිය හා ප්‍රවාහන අංශ බලශක්තිය බහුලව භාවිතා කරන ක්‍රියාකාරකම් වන බැවින් මෙම අංශවල තිරසාර බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගත් කළ, ශ්‍රී ලංකාව දිගු කාලීන ආර්ථික පිරිවැය මෙන්ම පරිසරය හා සමාජය මත බලශක්ති ප්‍රභවයන්ගෙන් ඇතිවන බාහිරතා සැලකිල්ලට ගනිමින් විදුලිබල උත්පාදනය සඳහා සුදුසු තිරසාර බලශක්ති සංයුතියක් සකස් කළ යුතුය. බලශක්ති උත්පාදනයේ සමස්ත පිරිවැය අඩු කිරීම සඳහා විවිධ බලශක්ති ප්‍රභවයන් භාවිතා කරන විදුලි නිෂ්පාදකයින් විසින් තරගකාරී ලංසු තැබීම දිරිමත් කළ යුතුය. ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත බෙහෙවින් රඳා පවතින හෙයින් තිරසාර බලශක්තිය වෙත යොමුවීමේ දී, පිරිවැය පිළිබිඹු කෙරෙන බලශක්ති මිලකරණය, විදුලි සැපයුම් ජාලවල වෙනස් කිරීම් සහ බලශක්ති සංරක්ෂණය වැනි පුළුල් අභියෝග රැසකට මුහුණ දීමට රටට සිදු වෙයි.

ඉන්ධන තෙල් හා ගල් අඟුරු සඳහා වන මූල්‍ය පිරිවැයට එම ප්‍රභවයන්ගේ පාරිසරික බලපෑම් නිසා මතුවන පිරිවැය ඇතුළත් නොවන බැවින්, පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට වඩා මූල්‍යමය වශයෙන් ආකර්ෂණීය වනු ඇත. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් තෙල් මිල තියුණු ලෙස පහත වැටීමට පෙර, ශ්‍රී ලංකාවේ බොහෝ ඛනිජ තෙල් නිෂ්පාදන ඔවුන්ගේ සැබෑ ආර්ථික පිරිවැය පිළිබිඹු නොකර සහනාධාර මිල ගණන් යටතේ පැවතුණි. එබැවින්, පුනර්ජනනීය නොවන ප්‍රභවයන්ට වඩා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මූල්‍යමය වශයෙන් ආකර්ෂණීය කිරීමට මූල්‍ය දිරිගැන්වීම් අවශ්‍ය වේ. බලශක්ති නිෂ්පාදකයන්ට ගෙවන ආකර්ෂණීය ගෙවීම්, ශුද්ධ මනු ක්‍රම, ආයෝජන බදු සහන, ව්‍යාපෘති ණය සඳහා සහනදායී පොලී අනුපාත, හරිත බැඳුම්කර සහ මෘදු ණය වැනි මූල්‍යමය මැදිහත්වීම් රටේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතා කළ හැකිය. අස්ථාවර බලශක්ති ප්‍රභවයන් මත වැඩි වශයෙන් යැපීම නිසා ඉල්ලුම හා සැපයුම් තත්ත්ව සමතුලිත කිරීම සඳහා විදුලිබල සැපයුම් ජාලයේ වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වේ. සමස්ත විදුලි උත්පාදනය සඳහා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි වන විට, අවශ්‍ය විටෙක අතිරික්ත ශක්තිය ගබඩා කර මුදා හැරීම සඳහා පොම්ප ගබඩා ජලවිදුලි නිෂ්පාදනය (pumped-storage hydroelectricity) සහ බැටරි වැනි බලශක්ති ගබඩා ක්‍රම ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, පොම්ප ගබඩා ජලවිදුලි නිෂ්පාදනය කඳුකරයට ආසන්න ස්ථානවල පමණක් භාවිතා කළ හැකි අතර බැටරි තාක්ෂණය තවමත් මිල අධිකය. එසේ වුව ද, උපස්ථ (backup) බලය නිපදවීම සඳහා ජල විදුලිය හෝ ස්වාභාවික වායුව වැනි අනුපූරක බලශක්ති ප්‍රභවයන් භාවිතා කළ හැකිය. මීට අමතරව, දවසේ නිශ්චිත වේලාවක දී විදුලිය සඳහා ඇතිවන ඉහළ ඉල්ලුම අඩු කිරීම සඳහා සුහුරු ජාල (smart grids) භාවිතය සහ බලශක්ති ඉල්ලුම කළමනාකරණය කිරීම මගින් අස්ථාවර සැපයුම් පිළිබඳ ගැටලුව විසඳිය හැකි වේ.

ශ්‍රී ලංකාවේ විදුලි උත්පාදනය සඳහා පුනර්ජනනීය නොවන ප්‍රභව කෙරෙහි වැඩි විශ්වාසයක් තබා ඇති හෙයින්, විද්‍යුත් වාහන භාවිතය මගින් අපේක්ෂිත පරිදි හරිතාගාර වායු විමෝචනය අඩු නොකෙරෙනු ඇත. රටේ විදුලි ධාරිතා සීමා සැලකිල්ලට ගෙන විදුලි වාහන භාවිතය ප්‍රවර්ධනය ප්‍රවේශමෙන් කළ යුතු වේ. කෙසේ වෙතත්, බලශක්ති ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිරසාර බලශක්ති භාවිතය සඳහා සහාය විය හැකිය. නිදසුනක් ලෙස, පොදු ප්‍රවාහන පද්ධතිවල කාර්යක්ෂමතාව, විශ්වසනීයත්වය සහ සුවපහසුව වැඩිදියුණු කිරීම, ඉන්ධන කාර්යක්ෂම වාහන සමූහය වැඩි කිරීම, වඩා හොඳ නාගරික සැලසුම් මගින් ගමනාගමනය අවම කිරීම, වඩා හොඳ රථවාහන කළමනාකරණය තුළින් මාර්ගස්ථ ඉන්ධන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, අඩු කාබන් ඉන්ධන ප්‍රවර්ධනය කිරීම සහ බයිසිකල් පැදීම සහ ඇවිදීම ඇතුළුව මෝටර් රථ නොවන ප්‍රවාහන ක්‍රමවේද වෙත යොමු වීමට ජනතාව දිරිගැන්වීම යනාදිය ප්‍රවාහන අංශයේ තිරසාර බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කළ හැකි පියවර කිහිපයකි. ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා තිරසාර බලශක්ති භාවිතය සඳහා භෞතික පද්ධති, ප්‍රතිපත්ති, නියාමන රාමු මෙන්ම බලශක්ති නිෂ්පාදනය හා පරිභෝජනය සම්බන්ධයෙන් ජනතාව අතර පවතින දැක්මේ සැලකිය යුතු පරිවර්තනයක් අවශ්‍ය වේ. මේ සඳහා රජය, පෞද්ගලික අංශය සහ සාමාන්‍ය ජනතාව විසින් තිරසාර බලශක්ති භාවිතය සහතික කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරිය යුතු අතර එමගින් තිරසාර ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඇති කර ගත හැක. මේ අතර, ප්‍රතිපත්තිමය නිශ්චිතභාවයක් ඇති කිරීම, හරිත බලශක්ති ආයෝජනය සම්බන්ධයෙන් පැහැදිලි මඟ පෙන්වීමක් ලබා දීම, එමගින් ලං.වි.ම. හා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා පිරිවැය පිළිබිඹු වන මිල ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම වැනි අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් දිරිගැන්වීම සඳහා බලශක්ති තිරසාරභාවය වෙනුවෙන් කැපවීම අත්‍යවශ්‍ය වේ.

---

මූලාශ්‍ර


1. Bishoge, O.K., Zhang, L., and Mushi, W.G. (2018) The Potential Renewable Energy for Sustainable Development in Tanzania: A Review, Clean Technol, 1, pp.70-88.
2. Güney, T. (2019) Renewable energy, non-renewable energy and sustainable development. International Journal of Sustainable Development & World Ecology. 6(5), pp 389-397.
3. International Energy Agency. (2019a) Southeast Asia Energy Outlook 2019. France: International Energy Agency.
4. International Energy Agency. (2019b) Global Energy & CO2 Status Report 2019. France: International Energy Agency.
5. International Energy Agency. (2019c) Global EV Outlook 2019. France: International Energy Agency
6. International Renewable Energy Agency. (2019a) Renewable Capacity Statistics-2019, Abu Dhabi: International Renewable Energy Agency.
7. International Renewable Energy Agency. (2019b) Renewable Power Generation Costs in 2018, Abu Dhabi: International Renewable Energy Agency.
8. Shrimali, G., Srinivasan, S., Goel, S., Trivedi, S. and Nelson, D. (2015) Reaching India's Renewable Energy Targets Cost-Effectively, CPI-ISB Working Paper, Climate Policy Initiative.
9. World Bank and International Finance Corporation. (2019) Sri Lanka Energy InfraSAP, Washington, DC 20433 : World Bank.
10. World Energy Council. (2019) World Energy Scenarios 2019. London: World Energy Council.

ඇතුළත් කිරීම, රජයේ ආයතන සඳහා විදුලි වාහන භාවිතය වැඩි කිරීම සහ වාහන නැවැත්වීමේ පොදු ස්ථානවල විදුලි වාහන ආරෝපන ස්ථාන පහසුකම් සඳහා පුද්ගලික ආයෝජන දිරි ගැන්වීම යෝජනා කර තිබේ. තවද, විදුලි කාර්මිකයින් සඳහා බලපත්‍ර ලබාදීමේ රාමුව 2019 වසරේ දී අවසන් කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ද්‍රවීකෘත ස්වාභාවික වායු කර්මාන්ත පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත වඩා සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මහජන අදහස් විමසීමක් සිදු කරන ලදී.

### මාර්ග සංවර්ධනය

**රටේ ප්‍රදේශ අතර සම්බන්ධතාවය පුළුල් කිරීමේ අරමුණින් රජය විසින් නව මාර්ග ඉදි කිරීමේ සහ පවත්නා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 2019 වසරේ දී ද අඛණ්ඩව සිදු කර ගෙන යන ලදී.** 2019 වසර අවසානය වන විට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලැබූ ජාතික මහා මාර්ගවල (A සහ B කාණ්ඩයේ මාර්ග) සමස්ත දිග දළ වශයෙන් කිලෝමීටර 12,220ක් වූ අතර, අධිවේගී මාර්ගවල මුළු දිග කිලෝමීටර 217.8ක් විය. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික මහා මාර්ග ජාලය සංවර්ධනය හා නඩත්තු කිරීම සහ අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා 2019 වසරේ දී රුපියල් බිලියන 155.2ක වියදමක් දරා ඇත. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 වසරේ දී අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රුපියල් බිලියන 55.5ක් සහ මහා මාර්ග සංවර්ධනය සඳහා රුපියල් බිලියන 71.8ක් වැය කර ඇති අතර පාලම් හා ගුවන් පාලම් ඉදි කිරීමට රුපියල් බිලියන 9.4ක් වැය කර ඇත.

**සලකා බලනු ලබන වසර තුළ දී, විදේශීය සහ දේශීය මූලාශ්‍රවලින් ලත් මූල්‍ය සහාය ඇතිව මාර්ග ඉදි කිරීම්, පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ම අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය ඇතිව 2019 මාර්තු මස අග දී උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ මැදවච්චිය සිට හොරොව්පතාන දක්වා වූ මාර්ගය පුනරුත්ථාපනය කිරීම ආරම්භ කරන ලදී. තවද, 2019 වසරේ දී නැගෙනහිර සහ උතුරු පළාත් සඳහා වූ ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන II (i-Road II) සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු අවසන් කරන ලද අතර, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතියෙහි බස්නාහිර පළාත සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු වසර තුළ දී අවසන් වෙමින් පැවතුණි. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3හි අදියර (I) සහ (II) යටතේ මාර්ග කොටස් හයක පුනරුත්ථාපන කටයුතු අවසන් කරන ලදී. පෑලියගොඩ, කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වානේ පාලම සහ බිහිසැව් පාලම (extradosed bridge) යන කොටස්වල ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් මෙම කාලය තුළ දී අවසන් කර ඇත. මේ අතර බදුල්ල-චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ පිබිදෙන පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන ද 2019 වසර තුළ ක්‍රියාත්මක විය. තවද, මග නැගුම වැඩසටහන සහ රන් මාවත් ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීමේ සහ ඉදිකිරීමේ වැඩසටහන යටතේ, 2019 වසරේ දී කිලෝමීටර 765.5ක දිගකින් යුත් මාර්ග කොටසක වැඩ අවසන් කරන ලදී.

3

**ජාතික අධිවේගී මාර්ග ජාලයේ ඉදිකිරීම් කටයුතු ද 2019 වසරේ දී අඛණ්ඩව සිදු කරන ලදී.** කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හා සම්බන්ධ කෙරෙන මාර්ග කොටසක් ද සහිතව කඩවත හා කෙරවලපිටිය අන්තර් හුවමාරු සම්බන්ධ කරන පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ (OCH) තුන්වන අදියර සම්පූර්ණ කර 2019 වසරේ නොවැම්බර් 09 වන දින මහජනතාව සඳහා විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතියට කිලෝමීටර 9.6ක දිගකින් යුත් මාර්ග කොටසක් අයත් වේ. තවද, මත්තල දක්වා දිවෙන අධිවේගී මාර්ග කොටසක් ද සහිතව මාතර සිට හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර 2020 පෙබරවාරි මස දී මහජනතාව සඳහා විවෘත කරන ලදී. මෙම අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම මගින් භාණ්ඩ සහ මගී හුවමාරුව පහසු වන ආකාරයට රටේ ප්‍රධාන වරායන් දෙක සහ ගුවන් තොටුපොළවල් සම්බන්ධ වී ඇත. මීට අමතරව, කිලෝමීටර 169ක දිගකින් යුතු මධ්‍යම අධිවේගී මාර්ගයේ සහ කිලෝමීටර 74ක දිගකින් යුතු රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ද 2019 වසරේ දී අඛණ්ඩව සිදු කෙරිණි. මේ අතර, භාවිතා කෙරෙන අධිවේගී මාර්ගවලින් උපයන ලද ආදායම 2018 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 8.4 හා සැසඳීමේ දී 2019 වසරේ දී රුපියල් බිලියන 8.6ක් විය. 2019 වසරේ දී දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් ගත් රථවාහන ප්‍රමාණය මිලියන 14ක් දක්වා සියයට 5.6කින් වර්ධනය විය. කෙසේ වෙතත් පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාර හේතුවෙන් ප්‍රවාහන කටයුතු අඩු වීම නිසා කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් මාර්ගයේ ගමන් ගත් රථවාහන ප්‍රමාණය පිළිවෙළින්, සියයට 1.9ක සහ සියයට 11.1ක පසුබෑමක්

පිළිබිඹු කළේය. මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් උසාවි නඩු කටයුතු විශාල සංඛ්‍යාවකට මුහුණ දීමට සිදුව ඇති අතර ඒවා මාර්ග යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතියට අහිතකර ලෙස බලපා ඇත. එබැවින්, මාර්ග ඉදි කිරීමේ ව්‍යාපෘතිවල ප්‍රමාද අවම කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීම සඳහා කාලෝචිත, කාර්යක්ෂම හා සක්‍රීය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රජය විසින් අනුගමනය කළ යුතුය.

**ජාතික මාර්ගවල නායයෑම් ආපදා අවම කිරීම සහ රථ වාහන තදබදය අවම කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගන්නා ලදී.** ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ මූල්‍ය ආධාර ඇතිව, ජාතික මාර්ගවල නායයෑම් ආපදා අවම කිරීම සඳහා උස් බිම් ප්‍රදේශවල හානි අවම කිරීමට සුදුසු පියවර ක්‍රියාවට නංවන ව්‍යාපෘතියක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 16.2ක් වන අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයකින් යුත් ස්ථාන 10ක් තෝරා ගෙන ඇත. මේ අතර, වැඩිදියුණු කිරීම සඳහා මංසන්ධි 156ක් හඳුනාගෙන ඇති අතර, දියුණු රථවාහන කළමනාකරණ පද්ධති ව්‍යාපෘතිය යටතේ කොළඹ අග නගර කලාපය තුළ ආලෝක සංඥා සහිත පදික මාරු ඉදිකිරීම සඳහා ස්ථාන 79ක් හඳුනා ගෙන ඇත. කිලෝමීටර 211.4ක මාර්ග කොටසක් ආවරණය වන පරිදි ව්‍යාපෘතිය සඳහා වන මූලික සැලසුම අවසන් කර ඇත. තවද, ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ප්‍රමුඛතා පදනමින් මංසන්ධි 133ක් වැඩිදියුණු කෙරෙනු ඇති අතර, එහි සවිස්තරාත්මක සැලසුම සකස් කර ඇත. ඒ අනුව, රථවාහන තදබදය අවම කිරීම, මාර්ග ආරක්ෂාව සවිමත් කිරීම සහ පොදු ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම මගින් කොළඹ අග නගර කලාපයේ ආර්ථික කටයුතුවලට සහය වීම ඉලක්ක කරගත් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සෙවීමේ ක්‍රියාවලියක රජය නිරතව සිටී.

### මාර්ගස්ථ මගී ප්‍රවාහනය

**පාස්කු ඉරු දින ප්‍රහාර හේතුවෙන් මගී ගමනාගමන කටයුතු අඩු වීම මූලිකවම හේතු කර ගෙන මාර්ගස්ථ මගී ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පොදු සහ පෞද්ගලික යන දෙඅංශයේ ම ප්‍රවාහන කටයුතුවල පසුබෑමක් දක්නට ලැබුණි.** පෙර වසර හා සැසඳීමේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) සතු බස්රථවල මුළු ධාවන කිලෝමීටර ගණන කිලෝමීටර මිලියන 431.3ක් දක්වා සියයට 3.4කින් පහළ ගිය අතර, මුළු මගී කිලෝමීටර ගණන, කිලෝමීටර බිලියන 12ක් දක්වා සියයට 22.7කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, 2018 වසර හා සැසඳීමේ දී පෞද්ගලික අංශයේ බස්රථවල ද ධාවන කිලෝමීටර ගණන සහ මගී කිලෝමීටර ගණන, පිළිවෙළින්, කිලෝමීටර බිලියන 1.1ක් දක්වා සියයට 2.3කින් සහ කිලෝමීටර බිලියන 54.2ක් දක්වා සියයට 2.2කින් පහළ ගියේය. පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී ශ්‍රී ලං.ග.ම. සතු සමස්ත බස්රථ සංඛ්‍යාව 7,251ක් දක්වා සියයට 4.3කින් ඉහළ ගිය අතර, ශ්‍රී ලං.ග.ම. මගින් මෙහෙයනු ලැබූ බස්රථවල සාමාන්‍යය 5,079ක් දක්වා සියයට 2.8කින් පහළ ගියේය. තවද, පෞද්ගලික අංශය සතු සමස්ත බස්රථ ප්‍රමාණය, 2018 වසරේ දී පැවති 20,030 සිට 19,979ක් දක්වා සියයට 0.3කින් සුළු වශයෙන් පහළ ගියේය. 2019 වසරේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් අතර සහ පළාත් තුළ බස්රථ ධාවනය සඳහා පෞද්ගලික අංශය වෙත ලබා දුන් බලපත්‍ර සංඛ්‍යාව, පිළිවෙළින්, 3,110ක් සහ 16,852ක් විය.

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2019 වසරේ දී ප්‍රවාහන කටයුතු පුළුල් කිරීම සඳහා අඛණ්ඩව අවධානය යොමු කළේය.** විශේෂ පොදු ප්‍රවාහන සේවා සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලං.ග.ම. හා එක්ව, සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය නම් වූ විශේෂ බස්රථ සේවා සැපයීම තවදුරටත් ක්‍රියාත්මක කළේය. පාසල් ළමුන් සඳහා විශ්වාසදායක හා ආරක්ෂිත සේවාවක් සපයන සිසු සැරිය බස් රථ සේවාව සඳහා 2019 වසරේ දී රුපියල් මිලියන 546.8ක මුදලක් වැය කර ඇත. සමස්තයක් ලෙස, සිසු සැරිය සේවය සඳහා බස් රථ 1,419ක් යොදවා තිබුණි. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාව සඳහා වැඩි වශයෙන් ප්‍රවාහන පහසුකම් සැලසීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරනු ලබන ගැමි සැරිය සේවය යටතේ නව සේවා 11ක් ආරම්භ කරන ලදී. ගැමි සැරිය සේවය සඳහා 2019 වසරේ දී රුපියල් මිලියන 2.7ක් වැය කර ඇත. රාත්‍රී කාලයේ දී පොදු ප්‍රවාහන සේවා සැපයීම සඳහා නිසි සැරිය බස් සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම සේවාව සඳහා 2019 වසරේ දී රුපියල් මිලියන 14.4ක් පමණ වැය කර ඇති අතර, වසර තුළ දී නිසි සැරිය වැඩසටහන යටතේ නව බස් රථ සේවා 6ක් යොදවන ලදී. තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී අන්තර් පළාත් බස් සේවා සඳහා මංගතව ආසන වෙන් කරවා ගැනීමේ පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක විය. බස් මාර්ග, දුම්රිය මාර්ග, දුම්රිය ස්ථාන සහ අනෙකුත්

පොදු ප්‍රවාහනය සම්බන්ධ තොරතුරු මහජනතාවට සැපයීම ඉලක්ක කර ගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2019 වසරේ දී ගූගල් සංක්‍රමණ (Google Transit) පහසුකම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. ආරම්භයේ දී බස්නාහිර පළාත තුළ මෙම පහසුකම ලබාගත හැකිවන අතර පසුව අනෙකුත් සියලු පළාත්වල එය ව්‍යාප්ත කෙරෙනු ඇත. මූලික අදියරේ දී පරිශීලකයින්ට පොදු ප්‍රවාහන සේවාවල කාලසටහන් ලබාගත හැකි වනු ඇති අතර, පසුව තත් කාලීන දත්ත සැපයීම සඳහා මෙම සේවාව වැඩිදියුණු කෙරෙනු ඇත. මේ අතර, 2019 නොවැම්බර් මාසයේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් අතර ධාවනය වන අධිවේගී බස්රථ ගාස්තු සඳහා විශේෂ සංශෝධනයක් සිදු කර ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් මස සිදු කරන ලද සංශෝධනයෙන් පසුව 2019 දී වාර්ෂික බස් ගාස්තු සංශෝධනයක් සිදු නොවීය.

**පොදු ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ආරම්භ කරන ලද වැඩසටහන් කිහිපයක්ම 2019 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණි.** 2019 වසරේ දී නව බස්රථ 334ක් යෙදවීම තුළින් බස්රථ ඇණිය සවිමත් කිරීමට ශ්‍රී ලං.ග.ම. කටයුතු කළේය. ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් වටිනාකම රුපියල් මිලියන 17.1ක් බැගින් වූ සුඛෝපභෝගී බස්රථ 9ක් මිලදී ගන්නා ලද අතර, එම බස්රථ බස් ඩිපෝ 6කට අනුයුක්ත කර ඇත. ඉන්දියානු ණය පහසුකමක් යටතේ බස්රථ 600ක් සහ 2019 වසර සඳහා වූ අයවැය යටතේ සුඛෝපභෝගී බස්රථ 80ක් මිලදී ගැනීමට ද පියවර ගන්නා ලදී.

**ආර්ථිකය තුළ ප්‍රවාහන අංශයේ සිදු වූ පසුබෑම හේතුවෙන් ශ්‍රී ලං.ග.ම. 2019 වසරේ දී දුර්වල මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කළේය.** විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2019 වසරේ දී ශ්‍රී ලං.ග.ම.හි මගී ගාස්තු මගින් උපයන ලද ආදායම සියයට 6.1කින් අඩු වීම හේතුවෙන්, සමස්ත ආදායම රුපියල් බිලියන 43.5ක් දක්වා සියයට 1.4කින් පහළ ගියේය. මේ අතර, මෙහෙයුම් වියදම් ද රුපියල් බිලියන 41.9ක් දක්වා සුළු වශයෙන් පහත වැටීම හේතුවෙන්, 2018 දී වාර්තා කළ රුපියල් බිලියන 2.2ක ලාභය හා සැසඳීමේ දී 2019 වසරේ දී මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 1.6ක් විය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසු පොදු සහ පෞද්ගලික අංශයේ බස්රථවල මගී ගමනාගමනය පහත වැටීම 2019 වසරේ දී ආදායම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවක් විය හැකිය. මේ අතර, 2019 වසරේ දී ලාභදායී නොවන මාර්ගවල සේවා පවත්වාගෙන යෑම සහ සහනාධාර වාර ප්‍රවේශ පත්‍ර සඳහා රජය විසින් ප්‍රදානය කර ඇති සහනාධාර රුපියල් බිලියන 5.5ක් බැගින් විය.

**පසුගිය වසරේ දී 480,799ක් වූ රථවාහන නව ලියාපදිංචිය 2019 වසරේ දී 367,303ක් දක්වා සියයට 23.6කින් පහළ ගියේය.** සියලු රථවාහන කාණ්ඩවල ලියාපදිංචියෙහි සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, මෝටර් රථ, බස්රථ සහ භාණ්ඩ ප්‍රවාහන වාහන නව ලියාපදිංචිය, පිළිවෙළින්, සියයට 52.7කින්, සියයට 45.5කින් සහ සියයට 44.3කින් පහළ ගියේය. මහ බැංකුව සහ රජය විසින් 2018 වසරේ දී රථවාහන ආනයනය සීමා කිරීමට ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 වසරේ මුල් භාගයේ දී රථවාහන නව ලියාපදිංචිය සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, 2019 වසර මැද භාගය වන විට ආන්තික තැන්පතු අවශ්‍යතා සහ සහන බලපත්‍ර යටතේ රථවාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ සීමා වැනි සමහර සීමාවන් ඉවත් කරන ලද අතර, ඒ හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී රථවාහන ලියාපදිංචිය ක්‍රමයෙන් ඉහළ ගියේය. රටේ ආදායම් මට්ටම ඉහළ යෑමත් සමඟ ගුණාත්මක හා සුවපහසු ප්‍රවාහන පද්ධති සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, ආර්ථිකයේ වෙනස් වන ඉල්ලුම සපුරාලීම සඳහා පොදු ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කර නොමැති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විශාල පිරිසක් පුද්ගලික වාහන භාවිතා කරති. සාර්ව විචක්ෂණ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග භාවිතා කර මෙරටට වාහන ආනයනය තාවකාලිකව සීමා කිරීමට හැකි වුවද මෙම ගැටලුව විසඳීම සහ ප්‍රමාණය ඉක්මවා වාහන ආනයනය හේතුවෙන් ඇතිවන බාහිර අසමතුලිතතා අවම කිරීම සඳහා දිගුකාලීන වශයෙන් පොදු ප්‍රවාහන පද්ධතිවල ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සිදු කළ යුතු වේ. ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු සහ පිරිවැය ඵලදායී පොදු ප්‍රවාහන ක්‍රම මගින් වෙළඳ ශේෂය වැඩිදියුණු වීම පමණක් නොව, තදබදය, පරිසර දූෂණය සහ ඉන්ධන නාස්තිය ද අවම වනු ඇත. තවද, මෙම කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම හේතුවෙන් කාලය ඉතිරි වන අතර, එමගින් පුද්ගලයින්ට ඵලදායී කටයුතු සහ විවේකය සඳහා වැඩි කාලයක් ගත කිරීමට හැකි වේ.

### 3.5 රූප සටහන
### රථවාහන නව ලියාපදිංචිය




මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3

## දුම්රිය ප්‍රවාහනය

**පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව මගී ගමනාගමනය සීමා වීම සහ දුම්රිය සේවකයින් විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ වර්ජන දෙකක් හේතුවෙන්, පෙර වසර හා සැසඳීමේ දී ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) මගී සහ භාණ්ඩ ප්‍රවාහනය යන දෙ අංශයේම කටයුතුවල පසුබෑමක් 2019 වසරේ දී වාර්තා කළේය.** 2018 වසරේ දී, කිලෝමීටර මිලියන 7.7ක් වූ දුම්රිය මගී ප්‍රවාහනය 2019 වසරේ දී කිලෝමීටර මිලියන 7.3ක් දක්වා සියයට 5.2කින් පහළ ගියේය. මේ අතර, 2018 වසරේ දී මෙට්‍රික් ටොන් කිලෝමීටර මිලියන 119.8ක් වූ භාණ්ඩ කිලෝමීටර ප්‍රමාණය 2019 වසරේ දී මෙට්‍රික් ටොන් කිලෝමීටර මිලියන 115.6ක් දක්වා සියයට 3.5කින් පහළ ගියේය.

**නව දුම්රිය මාර්ග ඉදි කිරීම, පවතින දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ දුම්රිය සේවා හා දුම්රිය ඒකක වැඩිදියුණු කිරීම තුළින් ශ්‍රී ලං.දු.සේ. 2019 වසරේ දී දුම්රිය සේවා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කළේය.** ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ දුම්රිය සේවා පුළුල් කිරීමේ අරමුණෙන් ශ්‍රී ලං.දු.සේ. වසර තුළ දී කිලෝමීටර 27ක දිගකින් යුතු මාතර සිට බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළේය. මේ අතර, සංඥා පද්ධතියක් ද සමග කටුනායක-කුරණ දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස සකස් කිරීමේ කටයුතු සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී අවසන් කරන ලදී. 2019 වසරේ දී ශ්‍රී ලං.දු.සේ. විසින් පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා වූ දුම්රිය මාර්ගය, මහනුවර, පේරාදෙණිය සහ කඩුගන්නාව යා කරන දුම්රිය මාර්ගය සහ පයාගල සිට අළුත්ගම දක්වා වූ දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ග ලෙස සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. තවද, ඉන්දියානු ණය පහසුකමක් යටතේ මහව සිට ඕමන්තේ දක්වා වූ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ කැළණිවැලි දුම්රිය නඩත්තු කටයුතු 2019 වසරේ දී අඛණ්ඩව සිදු කෙරිණි. මීට අමතරව, ශ්‍රී ලං.දු.සේ. විසින් මග්ගොන නව පාලමක් ඉදිකිරීමේ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී. 2019 වසරේ දී කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ (Consultancy work) කටයුතුවල ද ප්‍රගතියක් දක්නට ලැබුණි. දුම්රිය මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණෙන්, ශ්‍රී ලං.දු.සේ. මගින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට සමගාමීව දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළේය.

**මේ අතර, නව දුම්රිය ඒකක ආනයනය කිරීම සහ පවත්නා දුම්රිය ඒකක ප්‍රතිසංස්කරණය කිරීම මගින් ශ්‍රී ලං.දු.සේ. විසින් සිය දුම්රිය ඒකක සංචිතය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී.** 2019 වසරේ දී ශ්‍රී ලං.දු.සේ. විසින් උඩරට මාර්ගය සඳහා බලවේග කට්ටල පහක්, දුම්රිය එන්ජින් හතක්, අනෙකුත් ප්‍රදේශ සඳහා බලවේග කට්ටල පහක්, ඉන්ධන ප්‍රවාහනයට යොදා ගන්නා දුම්රිය ඒකක 30ක් සහ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය ඒකක 20ක් මිලදී ගන්නා ලදී. වසර තුළ දී කොළඹ සිට පොළොන්නරුව දක්වා සේවා දෙකක්, මරදාන සිට බෙලිඅත්ත දක්වා සේවා දෙකක් සහ කොළඹ කොටුව සිට කන්කසන්තුරේ දක්වා එක් සේවයක් ලෙස නව දුම්රිය සේවා පහක් හඳුන්වා දෙන ලදී. මේ අතර, ආසන වෙන් කිරීම සහ ආපනශාලා වැනි මගී පහසුකම් වැඩිදියුණු කිරීමට ද පියවර ගෙන තිබේ. වසර තුළ දී දිවයින පුරා දුම්රිය මාර්ගවල සංඥා සහ විදුලි සංදේශ පද්ධති සවිමත් කරන ලදී. ඒ අනුව, හරස් මාර්ග පද්ධති 200ක් ස්ථාපනය කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘතියක් යටතේ ශ්‍රී ලං.දු.සේ. විසින් නව ආරක්ෂිත හරස් මාර්ග පද්ධති 170ක් ස්ථාපනය කිරීම අවසන් කරන ලදී. තවද, මහව සිට ඕමන්තෙයි දක්වා නව සංඥා පද්ධතියක් ඉදි කිරීමේ මූලික කටයුතු වසර තුළ දී සිදු කරන ලදී.

**2019 වසර තුළ දී ද, ශ්‍රී ලං.දු.සේ. දුර්වල මූල්‍ය ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.දු.සේ. 2018 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 7ක අලාභය හා සැසඳීමේ දී වසර තුළ දී රුපියල් බිලියන 7.6ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්ම 2018 වසරේ ඔක්තෝබර් මාසයේ දී මගී ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන්

2019 වසරේ දී ශ්‍රී ලං.දු.සේ. රුපියල් බිලියන 7.9ක සමස්ත ආදායමක් වාර්තා කළ අතර, එය පෙර වසර හා සැසඳීමේ දී සියයට 6.6ක වර්ධනයකි. ඒ අනුව, 2018 වසර හා සැසඳීමේ දී සමස්ත ආදායමෙන් සියයට 80.9ක් පමණ වන මගී ගාස්තු 2019 වසර තුළ දී සියයට 7.8ක වර්ධනයක් පෙන්නුම් කළේය. වසර තුළ දී ජංගම සහ ප්‍රාග්ධන වියදම් ද, පිළිවෙළින්, රුපියල් බිලියන 15.5ක් සහ රුපියල් බිලියන 20.4ක් දක්වා, පිළිවෙළින්, සියයට 7.5කින් සහ සියයට 33.8කින් වර්ධනය විය. ජංගම වියදම් ඉහළ යෑමට සේවක දීමනා සියයට 8.8කින් වර්ධනය වීම බලපෑ අතර, ප්‍රාග්ධන වියදම් ඉහළ යෑමට දුම්රිය ඒකක මිලදී ගැනීම හේතු විය.

**මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා අඩු පිරිවැය පොදු ප්‍රවාහන මාධ්‍යක් ලෙස ශ්‍රී ලං.දු.සේ.ට සිය සේවා වැඩිදියුණු කිරීමට හැකියාවක් පවතින අතර, එමගින් නාගරික සහ තදාසන්න ප්‍රදේශවල මාර්ග තදබදය විශාල වශයෙන් අඩු කිරීමට හැකි වනු ඇත.** කෙසේ වෙතත්, මහජනතාවට සුවපහසු හා කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක් සැපයීම සඳහා දුම්රිය සේවය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. 2019 අවසානය වන විට ශ්‍රී ලං.දු.සේ. සතු දුම්රිය ඇණියෙන් සියයට 65ක් ම අවුරුදු 30කට වඩා පැරණි දුම්රිය වේ. එබැවින්, ඵලදායී මිනිස් පැය ගණන සහ බලශක්ති උපයෝජනය යන අංශවලින් සිදුවන පාඩු මග හරවා ගැනීම සඳහා පවත්නා දුම්රිය එන්ජින් හා මැදිරි සහ දුම්රිය මාර්ග නවීකරණය කිරීම අවශ්‍ය වේ. තවද, දුම්රිය සේවය ජනප්‍රිය සහ කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක් බවට පත් කිරීම සඳහා වැදගත් සාධකය වන්නේ සේවාවේ ඇති විශ්වසනීයත්වයයි. ශ්‍රී ලං.දු.සේ.යේ සමස්ත දුම්රිය මෙහෙයුම් සංඛ්‍යා ලේඛනවලට අනුව, 2018 වසර තුළ දී දුම්රියවලින් සියයට 48.4ක් නියමිත වේලාවට ධාවනය කර නොමැති අතර, දුම්රියවලින් සියයට 7.5ක් පැයකට වඩා ප්‍රමාද වී තිබේ. මේ අතර, එම කාල සීමාව තුළ නියමිත දුම්රියවලින් සියයට 4.9ක් අවලංගු කර ඇත. එබැවින්, මෙම ප්‍රමාදවීම් සහ අවලංගු කිරීම් සඳහා හේතු හඳුනාගෙන සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලං.දු.සේ. විසින් විසඳුම් සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, නාගරික ප්‍රදේශවල තදබදය සඳහා විසඳුමක් ලෙස, වාහන නවතා දුම්රියෙන් යෑමේ (park and ride) සංකල්පය දිරිගැන්වීම පිණිස දුම්රිය ස්ථාන ආසන්නව වාහන නතර කර තැබීම සඳහා රථගාල් පහසුකම් ඇති කළ යුතු වේ.

**3.4 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2018 (අ) | 2019 (ආ) | වර්ධන අනුපාතය % 2018 (අ) | වර්ධන අනුපාතය % 2019 (ආ) |
|---|---|---|---|---|
| 1. රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව) | 480,799 | 367,303 | 6.5 | -23.6 |
| බස් රථ | 2,957 | 1,613 | -11.2 | -45.5 |
| මෝටර් රථ | 80,776 | 38,232 | 106.2 | -52.7 |
| ත්‍රිරෝද රථ | 20,063 | 15,490 | -14.8 | -22.8 |
| ද්විත්ව කාර්ය වාහන | 16,931 | 13,459 | 1.1 | -20.5 |
| යතුරු පැදි | 339,763 | 284,301 | -1.3 | -16.3 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 9,371 | 5,223 | -18.0 | -44.3 |
| ඉඩම් වාහන | 10,282 | 7,666 | -21.2 | -25.4 |
| කොඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස | 656 | 1,319 | - | 101.1 |
| 2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 446 | 431 | -0.4 | -3.4 |
| මගී කිලෝමීටර් (මිලියන) | 15,541 | 12,012 | -1.7 | -22.7 |
| මුළු ආදායම (රු. මිලියන) | 44,103 | 43,490 | 4.6 | -1.4 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 41,935 | 41,934 | 4.6 | - |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | 2,168 | 1,556 | 4.2 | -28.2 |
| 3. ශ්‍රී ලංකා දුම්රිය සේවය | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 11,640 | 11,700 | -0.3 | 0.5 |
| මගී කිලෝමීටර් (මිලියන) | 7,710 | 7,310 | 2.9 | -5.2 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 120 | 116 | -17.3 | -3.5 |
| මුළු ආදායම (රු. මිලියන) | 7,413 | 7,901 | 14.4 | 6.6 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 14,381 | 15,464 | 2.1 | 7.5 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | (6,968) | (7,562) | -8.4 | 8.5 |
| 4. ශ්‍රීලංකන් ගුවන් සේවය | | | | |
| පියාසර කරන ලද පැය ගණන | 110,058 | 106,950 | 13.2 | -2.8 |
| මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන) | 16,180 | 15,509 | 14.2 | -4.1 |
| මගී ආසන පිරීමේ අනුපාතය (%) | 83 | 83 | 1.0 | -0.4 |
| බර පැටවීමේ අනුපාතය (%) | 75 | 74 | 1.9 | -1.2 |
| භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000) | 136 | 123 | 9.0 | -9.5 |
| සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 6,846 | 6,709 | -2.8 | -2.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## සිවිල් ගුවන් සේවය

**ප්‍රධාන වශයෙන් පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව සංචාරකයන්ගේ පැමිණීම අඩුවීම හේතුවෙන් 2019 වසරේ දී සිවිල් ගුවන් සේවා අංශයේ ඍණාත්මක ක්‍රියාකාරිත්වයක් වාර්තා විය.** පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව ආරක්ෂක හේතූන් මත ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම අඩු වීම හේතුවෙන් ගුවන් සමාගම් 11ක් මෙරටට සිදු කළ පියාසර වාර ගණන අඩු කරන ලද අතර, එමගින් 2019 වසරේ උතුරු අර්ධ ගෝලයේ ගිම්හාන සමයේ දී සතියකට සිදු කළ ගුවන් ගමන් වලින් 32ක් අවලංගු විය. ඒ අනුව, බණ්ඩාරනායක

3

ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හරහා සිදු කරන ලද මුළු මගී හැසිරවීම් ප්‍රමාණය 2018 වසරේ වාර්තා කරන ලද මිලියන 10.8ට සාපේක්ෂව, 2019 වසරේ දී මිලියන 9.9ක් දක්වා සියයට 8.3කින් පහළ වැටුණි. මේ අතර, භාණ්ඩ හැසිරවීම් ප්‍රමාණය ද පසු ගිය වසරේ වාර්තා කළ මෙට්‍රික් ටොන් 268,496 හා සැසඳීමේ දී මෙට්‍රික් ටොන් 246,406ක් දක්වා සියයට 8.2ක පහළ යෑමක් පෙන්නුම් කළේය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හරහා ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 71,973ක් දක්වා සියයට 3.4ක පහළ යෑමක් වාර්තා කළේය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව ශ්‍රී ලංකාව දක්වා සිදු කරනු ලබන තම මෙහෙයුම් බාධාවකින් තොරව සිදු කරගෙන යෑම සඳහා ගුවන් සමාගම් වෙත අනුබල දීම පිණිස රජය විසින් දිරි දීමනා කිහිපයක්ම පිරිනමන ලදී. මගීන් සඳහා වූ ගොඩ බැසීමේ බද්ද අඩු කරනු ලැබූ අතර, ඉන්ධන සහ ගුවන් යානා භූමිය මත හැසිරවීම් සඳහා දිරි දීමනා දෙනු ලැබීය. කෙසේ වෙතත්, 2019 වසර අග භාගය වන විට අපේක්ෂිත කාලයටත් වඩා ඉක්මනින් ගුවන් සමාගම් විසින් ඔවුන්ගේ ගුවන් ගමන් කාලසටහන් පෙර පැවති තත්ත්වයටම පත් කරන ලදී. මේ අතර, 2019 වසරේ දී මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මගින් සිදු කරන ලද ගුවන් යානා හැසිරවීම් ප්‍රමාණ, පිළිවෙළින්, 786ක් සහ 64ක් විය. සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමට ප්‍රතිචාර වශයෙන්, දේශීය ගුවන් මගී හැසිරවීම් ද, පසුගිය වසරේ වාර්තා කළ 30,725ක ප්‍රමාණය හා සැසඳීමේ දී, 20,584ක් දක්වා සියයට 33ක පසුබෑමක් පෙන්නුම් කළේය.

**විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018/2019 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගම රුපියල් බිලියන 33.1ක මූල්‍ය අලාභයක් වාර්තා කළේය.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2019/2020 මූල්‍ය වර්ෂයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් 2019 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවයක කාලය සඳහා රුපියල් බිලියන 15.0ක මූල්‍ය අලාභයක් වාර්තා කරන ලදී. ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි ව්‍යාපාර සැලැස්මේ කෙටිකාලීන සහ මධ්‍යකාලීන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පාස්කු ඉරු දින ප්‍රහාර සැලකිය යුතු බලපෑමක් එල්ල කළේය. මගීන් ප්‍රමාණය අඩු වීම හේතුවෙන් ප්‍රහාරවලින් පසු මාස හතරක කාලසීමාව තුළ ක්‍රියාත්මක වූ වැඩසටහනට ගුවන් ගමන් වාර අවලංගු කිරීම් සහ කුඩා ගුවන් යානා භාවිතා කිරීම වැනි පියවර මාලාවක් අයත් විය. ආදායම පහත වැටුණ ද අඩු ඉන්ධන මිල ගණන් සහ ඉන්ධන ප්‍රශස්තිකරණ පියවර හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගමට සිය මෙහෙයුම් වියදම අඩු කර ගැනීමට හැකි විය. බෙදා හැරීමේ පිරිවැයෙන් සැලකිය යුතු ඉතිරියක් ඇති කරමින්, සමස්ත ආදායම සඳහා ගුවන් සමාග මේ මංගත සෘජු විකුණුම් යාන්ත්‍රණය මගින් දක්වන දායකත්වය සියයට 16ක් දක්වා ඉහළ නැංවිණි. මේ අතර, 2019 වසරේ මැයි මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම දෙවන වරටත්, ලෝකයේ වඩාත්ම නියමිත වේලාවට ක්‍රියාත්මක වන ගුවන් සමාගම ලෙස නම් කෙරිණි. 2019 වසර අවසානය වන විට, ශ්‍රීලංකන් ගුවන් සමාගම සතුව පුළුල් බඳ සහිත ගුවන් යානා සහ පටු බඳ සහිත ගුවන් යානා 13ක් බැගින් ගුවන් යානා 26ක ඇණියක් පැවතුණි.

**ගුවන් සංවර්ධන ව්‍යාපෘති කිහිපයකට අදාළ ඉදිකිරීම් කටයුතු 2019 වසරේ දී අඛණ්ඩව සිදු විය.** පලාලි ගුවන් තොටුපොළ වැඩිදියුණු කරන ලද අතර, එය 2019 වසරේ ඔක්තෝබර් මාසයේ දී යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ලෙස නම් කරන ලදී. මේ අතර, බණ්ඩාරවෙල ගුවන් තොටුපොළ ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් සිදු කරන ලදී. මඩකලපුව ගුවන් තොටුපොළ සහ රත්මලාන ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් ලෙස වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු සිදු කෙරිණි. ප්‍රදේශීය ගුවන් තොටුපොළවල මෑතකාලීනව සිදු වූ සංවර්ධන කටයුතු සහ ඒවා ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් කටුනායක, රත්මලාන, මත්තල, මඩකලපුව සහ යාපනය යන ප්‍රදේශවල පිහිටා ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පහක් ශ්‍රී ලංකාවට හිමි වී ඇත.

**3.6 රූප සටහන**

**ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්**




මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**අමාත්‍ය මණ්ඩලය විසින් 2019 වසරේ දී ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය (NCAP) අනුමත කරන ලදී.** මෙම නව ප්‍රතිපත්ති රාමුව මගින් ප්‍රවේශය සහ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ පරමාර්ථය ඇතිව, අන්‍යොන්‍යතා පදනම මත ජාත්‍යන්තර වාණිජ ගමනාගමන කටයුතු සඳහා ශ්‍රී ලංකා ගුවන විවෘත කිරීමට යෝජනා කෙරේ. ඒ අනුව, මෙම ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ, දේශීය ගුවන් සමාගම්වලට නියමිත ගමන් වාර වැඩසටහනට අනුව ක්‍රියාත්මක වන ගුවන් සමාගම් වශයෙන් ජාත්‍යන්තර ගුවන් සේවා පවත්වා ගෙන යෑමට අවසර ලබා දීමට සහ නව දේශීය ගුවන් සමාගම්වලට ජාත්‍යන්තර ගමනාන්තවලට කුලී පදනම යටතේ මෙහෙයුම් සිදු කිරීමට අවස්ථාව සලසා දීමය. ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය මගින් විදේශීය ගුවන් සමාගම්වලට ශ්‍රී ලංකාව වෙත කුලී පදනම යටතේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා අනුබල ලබා දෙයි. ගුවන් තොටුපොළවල ගුවන් යානා භූමිය මත හැසිරවීමේ සේවා සපයන්නන් කිහිප දෙනෙකු හඳුන්වා දීමටත්, නව දේශීය ගගන යාත්‍රාංගන තැනීමටත් ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ.

## වරාය සේවා

**ප්‍රධාන වශයෙන්ම කොළඹ වරායේ කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයේ මෙහෙයුම් කටයුතුවල වර්ධනය හේතුවෙන් 2019 වසර තුළ දී වරාය අංශයේ ක්‍රියාකාරකම් වර්ධනය විය.** 2019 වසරේ දී පැමිණි නැව් සංඛ්‍යාව 4,198ක් දක්වා සියයට 3.1කින් පහත වැටී තිබුණ ද, 2018 වසරේ දී මෙහෙයවන ලද අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 7 හා සැසඳීමේ දී 2019 වසර තුළ කොළඹ වරාය විසින් අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 7.2ක් මෙහෙයවන ලදී. පෙර වසර හා සැසඳීමේ දී, නැවත ඇසිරීම් ද ඇතුළුව බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය 2019 වසරේ දී සියයට 4.4ක වර්ධනයක් වාර්තා කළ අතර, එය කොළඹ වරායේ සමස්ත බහලු මෙහෙයුම්වලින් සියයට 82.4ක් වේ. කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයේ මෙහෙයුම් කටයුතු පුළුල් වීම 2019 වසරේ දී බහලු ප්‍රතිනැව්ගත කිරීම් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී දේශීය අවශ්‍යතා සඳහා වූ බහලු මෙහෙයවීම් සියයට 5.2කින් පහත වැටුණි. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ භාණ්ඩ මෙහෙයුම් යන අංශවලින් ගත් කළ, කොළඹ වරායේ සමස්ත කාර්යසාධනය, පිළිවෙළින්, සියයට 2.6කින්, සියයට 3.6කින් සහ සියයට 1.8කින් වර්ධනය විය. විශාල නැව් හැසිරවීමේ හැකියාව ඇති ශක්තිමත් යටිතල පහසුකම්වලින් සමන්විත කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය, පෙර වසර හා සැසඳීමේ දී සියයට 8.1ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2019 වසරේ දී අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 2.9ක් මෙහෙයවන ලදී. කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයේ මෙම ඉහළ කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ නැංගුරම්ලීම සඳහා විශේෂයෙන්ම ගැඹුරු තටාක පහසුකම් පැවතීම සහ මහා පරිමාණයේ නැව් මෙහෙයවීමට හැකි නවීන උපකරණවලින් යුතු වීම නිසා කොළඹ වරායේ අනෙකුත් පර්යන්තවල නොමැති ඉහළ ධාරිතාවක් එම පර්යන්ත තුළ පැවතීම ය. මේ අතර, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තයේ සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය පෙර වසර හා සැසඳීමේ දී සියයට 0.7ක සුළු පසුබෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තයේ සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 2.1ක් විය. මේ අතර, ජය බහලු පර්යන්තය ද ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2019 වසරේ දී හසුරුවන ද බහලු ප්‍රමාණය අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 2.3ක් වන අතර, එය සියයට එකක සුළු පසුබෑමකි. ඒ අනුව, 2019 වසරේ දී කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය, කොළඹ වරායේ සමස්ත බහලු මෙහෙයුම්වලින්, පිළිවෙළින්, සියයට 40කට, සියයට 31.6කට සහ සියයට 28.4කට දායකත්වයක් දැක්වීය. මේ අතර, වසර තුළ දී කොළඹ ජාත්‍යන්තර

### 3.5 සංඛ්‍යා සටහන
### වරාය සේවා ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | 2018 | 2019 (අ) | වර්ධන අනුපාතය % 2018 | වර්ධන අනුපාතය % 2019(අ) |
|---|---|---|---|---|
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | 4,874 | 4,697 | -0.1 | -3.6 |
| කොළඹ | 4,331 | 4,198 | - | -3.1 |
| ගාල්ල | 84 | 43 | -3.4 | -48.8 |
| ත්‍රිකුණාමලය | 189 | 142 | -18.9 | -24.9 |
| හම්බන්තොට | 270 | 314 | 17.4 | 16.3 |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 104,934 | 106,979 | 11.8 | 1.9 |
| කොළඹ | 100,151 | 101,926 | 12.5 | 1.8 |
| ගාල්ල | 729 | 510 | 2.5 | -30.1 |
| ත්‍රිකුණාමලය | 3,560 | 3,304 | -8.7 | -7.2 |
| හම්බන්තොට | 494 | 1,239 | 131.7 | 150.8 |
| 3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 7,047 | 7,228 | 13.5 | 2.6 |
| 4. බහලු ප්‍රතිනැව්ගත කිරීම් (TEUs '000) (ආ) | 5,704 | 5,955 | 18.2 | 4.4 |

(අ) තාවකාලික
(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක

මූලයඃ ශ්‍රී ලංකා වරාය අධිකාරිය

බහලු පර්යන්තය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද බහලු ප්‍රතිනැව්ගත කිරීම්, පිළිවෙළින්, සියයට 12.5ක සහ සියයට 1.6ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය විසින් මෙහෙයවන ලද බහලු ප්‍රතිනැව්ගත කිරීම් 2019 වසරේ දී සියයට 2.1කින් පහත වැටුණි. 2019 වසරේ දී කොළඹ වරාය මගින් මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය සියයට 1.8ක වර්ධනයක් පිළිබිඹු කළේය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය මගින් මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 2.3ක සහ සියයට 1.9ක පසුබෑමක් පෙන්නුම් කළ අතර, කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය වසර තුළ දී සියයට 9.4ක වර්ධනයක් වාර්තා කළේය. ආසියානු භාණ්ඩ ප්‍රවාහන, සැපයුම් හා සැපයුම් දාම සම්මාන උළෙලේ දී අඛණ්ඩව තුන්වන වරටත්, 'අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 4 කට අඩු කාණ්ඩය' යටතේ, දකුණු ආසියාවේ හොඳම බහලු පර්යන්තය ලෙස කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය 2019 වසරේ දී තෝරා ගැනුණි. කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයේ මුළු බහලු මෙහෙයුම්වලින් සියයට 72කට දායකත්වය දක්වන අති විශාල බහලු ආධාරක හැසිරවිය හැකි දකුණු ආසියාවේ ප්‍රථම සහ එකම ගැඹුරු වරාය කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය වේ. තවද, ගෝලීය වරාය සැසිය මගින් පිරිනමනු ලබන '2019 වසරේ වරාය අධිකාරිය' සම්මානය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අඛණ්ඩව දෙවෙනි වරටත් 2019 වසරේ දී දිනා ගන්නා ලදී.

**හම්බන්තොට වරාය 2019 වසරේ දී භාණ්ඩ සහ රථවාහන මෙහෙයුම් දෙ අංශයෙන් ම සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** හම්බන්තොට වරායේ භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය, 2018 වසරේ වාර්තා කළ මෙ. ටො. මිලියන 0.5 හා සැසඳීමේ දී 2019 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 1.2ක් දක්වා සියයට 150.8ක සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කළේය. මේ අතර, 2019 වසරේ දී හම්බන්තොට වරාය මගින් සිදු කරන ලද වාහන ප්‍රතිනැව්ගත කිරීම් 373,925ක් දක්වා සියයට 155.4කින් සැලකිය යුතු ලෙස වැඩි වීම, එහි සිදු කළ වාහන මෙහෙයුම් ප්‍රමාණය 411,027ක් දක්වා සියයට 77.4ක වර්ධනයක් පෙන්නුම් කිරීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය. කෙසේ වෙතත්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ වාහන මෙහෙයුම් 85,225 හා සැසඳීමේ දී, 2019 වසරේ දී හම්බන්තොට වරාය මගින් දේශීය කටයුතු සඳහා සිදු කරන ලද වාහන මෙහෙයුම් ප්‍රමාණය 37,102 දක්වා සියයට 56.5ක පසුබෑමක් පෙන්නුම් කළේය. 2018 වසර අග භාගයේ දී වාහන ආනයනය අඩු කිරීමට රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හම්බන්තොට වරාය මගින් දේශීය කටයුතු සඳහා සිදු කරන ලද වාහන මෙහෙයුම්වල පසුබෑමට මූලිකවම හේතු විය.

**රටේ ප්‍රධාන වරායවල අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරන අතර ම මුහුදු ප්‍රවාහනය තුළින් ලෝකය සමඟ මෙරටට ඇති සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට රජය සහ වරාය හා සම්බන්ධ ආයතන විසින් අඛණ්ඩව පියවර ගන්නා ලදී.** 2019 වසරේ දී කොළඹ වරායේ බහලු මෙහෙයුම් ප්‍රමාණය, අඛණ්ඩව දෙවන වරටත්, අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 7 සීමාව ඉක්මවූ අතර, කොළඹ වරායේ බහලු පර්යන්ත තුන ම මෑත වසරවලදී සැලසුම් කරන ලද උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. ගෝලීය නැව් සමාගම් වැඩි වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා විශාල නැව් භාවිත කිරීම නිසා, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තවල සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තයේ විශාල යාත්‍රා මෙහෙයවීම සඳහා ධාරිතාව සීමිත වීම හේතුවෙන් කොළඹ වරායේ අනාගත වර්ධන විභවතාවට බාධා ඇති වී ඇත. එබැවින්, කොළඹ වරායේ ඵලදායී ධාරිතාව පුළුල් කිරීමට සහ නැගී එන වෙළඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් කලාපය තුළ තරගකාරිත්වය පවත්වා ගෙන යෑමට නැගෙනහිර බහලු පර්යන්තය සංවර්ධනය කිරීම සහ එහි මෙහෙයුම් කටයුතු කඩිනම් කිරීම වැදගත් වේ. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්මට අනුව, නැගෙනහිර බහලු පර්යන්තය සතුව මීටර 18ක ගැඹුරින් හා මීටර 1,200ක දිගින් යුතු තොටුපොළ බැම්මක් සහ අඩි විස්සට සමාන බහලු

**3.7 රූප සටහන**

**බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ඒකක මිලියන 2.4ක ධාරිතාවකින් යුතු අංගනයක් පවතී. මේ සම්බන්ධයෙන්, 2019 මැයි මාසයේ දී ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ ජපානය අතර සහයෝගිතා ගිවිසුමක් අත්සන් කරන ලදී. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ නැගෙනහිර බහලු පර්යන්තයේ මෙහෙයුම් කටයුතු 2020 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය. කොළඹ වරායේ වාර්ෂික බහලු හැසිරවීම ඉහළ නංවමින් ලොව හොඳම බහලු වරායන් 20 අතරට එක්වීම සඳහා නැගෙනහිර බහලු පර්යන්තය නව මහා පරිමාණ නෞකා සඳහා විවෘත කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මේ වන විටත් මීටර 440ක දිගකින් යුතු තොටුපොළ බැම්මක්, යාබදව පිහිටි අංගන භූමිය සහ නැගෙනහිර බහලු පර්යන්තයට සම්බන්ධ වීමට අදාළ පහසුකම් සංවර්ධනය කර ඇත. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ත්‍රිකුණාමල වරායේ නෞකා හැසිරවීමේ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පද්ධතිය හා එක්ව රාත්‍රී කාලයේ දී නෞකා හැසිරවීමේ කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. තවද, සංචාරක හා වෙළඳ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය වරායක් ලෙස ගාල්ල වරාය පුළුල් කිරීමේ කටයුතු රජය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා සිදු කරගෙන යනු ලැබේ.

**2019 වසරේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය වර්ධනය විය.** ඒ අනුව 2018 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 8.7ක ලාභයට සාපේක්ෂව, 2019 වසරේ දී රුපියල් බිලියන 16.2ක බදුවලට පෙර ලාභයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වාර්තා කළේය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ආදායම රුපියල් බිලියන 40.8ක් දක්වා සියයට 5.8කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම ද රුපියල් බිලියන 22.4ක් දක්වා සියයට 6.0කින් ඉහළ ගියේය.

### පණිවුඩ හුවමාරු සේවා

**දුරකථන හා අන්තර්ජාල සම්බන්ධතා මෙන්ම අගය එකතු කළ සේවා තවදුරටත් පුළුල් වීමත් සමඟ, 2019 වසරේ දී විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව වැඩිදියුණු විය.** සමස්ත ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව, 2018 වසර අවසානය වන විට පැවති සම්බන්ධතා මිලියන 32.5 සිට 2019 වසර අවසානය වන විට මිලියන 32.9ක් දක්වා ඉහළ ගිය අතර, ස්ථාවර රැහැන් දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව ද පෙර වසරේ පැවති අගයේ සිට මිලියන 1.2ක් දක්වා සියයට 2.4කින් ඉහළ ගියේය. පෙර වසරවල දක්නට ලැබුණු ස්ථාවර රැහැන් රහිත සම්බන්ධතාවල අඩු වීමේ ප්‍රවණතාව 2019 දී ද අඛණ්ඩව පැවති අතර, එම අගය සම්බන්ධතා මිලියන 1.1ක් දක්වා සියයට 16.8කින් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව සියයට 7.4කින් අඩු විය. මෙම ප්‍රවණතා සමඟ, පුද්ගලයින් 100 දෙනෙකුට ඇති සම්බන්ධතා සංඛ්‍යාව මගින් මනිනු ලබන ස්ථාවර දුරකථන ඝනත්වය සහ ජංගම දුරකථන ඝනත්වය, 2019 වසර අවසානය වන විට, පිළිවෙළින්, 10.5ක් සහ 150.8ක් විය. අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 26.9කින් වර්ධනය වූ අතර, ඒ අනුව 2019 වසර අවසානය වන විට අන්තර්ජාල ඝනත්වය 61.5ක් විය. තවද, ජනතාව අතර ජංගම දුරකථන ප්‍රචලිත වීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර දුරකථන ඝනත්වයේ වර්ධනයක් දක්නට නොලැබෙන අතර ඒ හේතුවෙන් ස්ථාවර අන්තර්ජාල සේවාවල වර්ධනය ද සීමා වී ඇත. මේ අතර, 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ සේවා සඳහා වූ බදු අඩු කිරීම විදුලි සංදේශ ක්ෂේත්‍රය තවදුරටත් ව්‍යාප්ත වීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**සමාලෝචනයට භාජනය වූ වසර තුළ දී ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමේ අරමුණින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් නොයෙකුත් පියවර ගෙන තිබේ.** ආර්ථිකයේ ප්‍රධාන අංශවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල් ක්‍රමවේද භාවිතය වේගවත් කිරීමට ශ්‍රී ලංකා ඩිජිටල් ආර්ථික ක්‍රමෝපායට අදාළ කටයුතු රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ එක්ව, තිරසාර ආර්ථික සංවර්ධනයට සහ වර්ධනයට සහාය වීම සඳහා ජාතික ඩිජිටල් ප්‍රතිපත්ති රාමුවක් (2020-2025 සඳහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් න්‍යාය පත්‍රය) සකස් කරන ලදී. මීට අමතරව, මෙරට සයිබර් ආරක්ෂණ පද්ධතියේ කේන්ද්‍රීය සංවිධානය වන ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (LCERT) සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් රජයේ ඩිජිටල් යෙදවුම් සහ යටිතල පහසුකම් සඳහා පවතින තර්ජන ආවේක්ෂණය කිරීම සඳහා ජාතික සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ තත්ත්වය තක්සේරු කිරීම සඳහා ජාතික සමීක්ෂණ ද පවත්වන ලදී.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් 2019 වසරේ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්ධනයට අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.** ඒ අනුව, පිරිමැසුම්දායී හා ආරක්ෂිත ආකාරයට රජයේ ආයතන 860ක් එකිනෙක

**3.8 රූප සටහන**
**දුරකථන ඝනත්වය**




මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



සම්බන්ධ කිරීම අරමුණු කරගත් ලංකා රාජ්‍ය ජාලය 2.0 ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කටයුතු කළේය. මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වසරේ දී දැරූ පිරිවැය රුපියල් මිලියන 674.9කි. ලංකා රාජ්‍ය ක්ලවුඩ් 2.0 ව්‍යාපෘතිය ඔස්සේ රජයේ විශාල දත්ත එකතුවක් නිර්මාණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කටයුතු කර ඇති අතර, 2019 වසර අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 96ක් ද ව්‍යාපෘතිය සඳහා වසරේ පිරිවැය රුපියල් මිලියන 102.3ක් ද විය. තවද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ තොරතුරු දැන ගැනීම සඳහා සේවකයින්ට සහ සේවා යෝජකයින්ට මංගත ප්‍රවේශය ලබා දීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2019 වසරේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් කළමනාකරණ පද්ධති ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කළේය. තවද, ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතිය, රජයේ ඩිජිටල් පරිවර්තනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මානව සම්පත් ධාරිතා ගොඩනැගීම, ජාතික අවකාශ දත්ත යටිතල පහසුකම් (National Spatial Data Infrastructure) - දෙවන අදියර, සුහුරු සමාජ සහ පුරවැසි ශක්‍යතා වර්ධන ව්‍යාපෘතිය සහ රජයේ ආයතනවල ඩිජිටල් ලේඛන කළමනාකරණ පද්ධතිය ඇතුළු තවත් ව්‍යාපෘති රාශියක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් 2019 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී. 2019 වසරේ දී රාජ්‍ය නිලධාරීන් සඳහා මෙරට ඩිජිටල්කරණය පිළිබඳව පුහුණු හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පවත්වන ලදී. මෙයට අමතරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශ්‍රම බලකායේ ඉල්ලුම හා සැපයුම විශ්ලේෂණය කිරීම සඳහා ජාතික තොරතුරු තාක්ෂණය - ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ශ්‍රම බලකා සමීක්ෂණයක් ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ අංශයේ වර්ධනයට දායක වීම සඳහා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මක කළේය. විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාකරන කොළඹ නෙළුම් කුළුණ ද 2019 වසරේ සැප්තැම්බර් මාසයේ දී විවෘත කරන ලදී. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනමක් මත හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමක් ද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිදු කළේය.

**ඵලදායීතාව වැඩිදියුණු කිරීම, සේවා විවිධාංගීකරණය කිරීම සහ වඩා හොඳ තත්ත්වයේ සේවා සැපයීම සඳහා දියුණු තාක්ෂණය යොදා ගැනීම යන කරුණුවල අවශ්‍යතාව අවධාරණය කරමින් තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය මන්දගාමී මට්ටමක පැවතීමක් දක්නට ලැබුණි.** 2019 වසරේ අවසානය වන විට ශ්‍රී ලංකාවේ තැපැල් පද්ධතිය ප්‍රධාන තැපැල් කාර්යාල 653කින්, උප තැපැල් කාර්යාල 3,409කින්, නියෝජිත තැපැල් කාර්යාල 307කින්, ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල 101කින් සහ වතු නියෝජිත තැපැල් කාර්යාල 4කින් සමන්විත විය. මෑත වසරවලදී මෙන්ම තැපැල්

**3.6 සංඛ්‍යා සටහන**
**විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2018 | 2019 (අ) | වර්ධන අනුපාතය % 2018 | 2019(අ) |
|---|---|---|---|---|
| 1. ස්ථාවර දුරකථන සේවා ('000) | 2,485 | 2,300 | -4.6 | -7.4 |
| රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව | 1,216 | 1,245 | 1.5 | 2.4 |
| රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව | 1,269 | 1,055 | -9.7 | -16.8 |
| 2. ජංගම දුරකථන ('000) | 32,528 | 32,884 | 15.4 | 1.1 |
| 3. අනෙකුත් සේවා | | | | |
| පොදු දුරකථන කුටි | 2,135 | 476 | -58.4 | -77.7 |
| අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව ('000) (ආ) | 10,563 | 13,408 | 78.9 | 26.9 |
| 4. දුරකථන ඝනත්වය (ඇ) | 161.6 | 161.4 | 12.5 | -0.1 |
| ස්ථාවර දුරකථන | 11.5 | 10.5 | -5.5 | -8.0 |
| ජංගම දුරකථන | 150.1 | 150.8 | 14.1 | 0.5 |
| 5. අන්තර්ජාල ඝනත්වය (ඇ) | 48.7 | 61.5 | 77.0 | 26.2 |

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඇ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දැක්වේ.

මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය තවදුරටත් දුර්වලව පැවතුණි. තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2019 වසරේ දී තැපැල් දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම රුපියල් බිලියන 8.4ක් දක්වා සියයට 8.9කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම් ද රුපියල් බිලියන 13.7ක් දක්වා සියයට 6.4කින් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, මෙහෙයුම් අලාභය, 2018 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 5.2ට සාපේක්ෂව 2019 වසරේ දී රුපියල් බිලියන 5.3ක් විය. මේ අතර, පිරිවැය අවමවන පිරිමැසුම්දායී ක්‍රමවේදයකින් කාර්යක්ෂම සහ උසස් තත්ත්වයේ රාජ්‍ය සේවාවක් සැපයීමේ අරමුණින් 2019-2023 සඳහා ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට තැපැල් දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, තැපැල් සේවකයින් විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 වසරේ දී තැපැල් සේවා කටයුතුවලට බාධා ඇති විය. පිරිවැය අඩු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ආදායම ඉහළ නැංවීම සඳහා නිසි ව්‍යුහාත්මක මිල යාන්ත්‍රණ යොදා ගැනීම මෙන්ම ලිපි සහ පාර්සල් වර්ග කිරීම, ඒවා ඇති ස්ථානය හඳුනාගැනීම හා ඒවායේ ගමන් මග දැන ගැනීම පිණිස තීරු බේත භාවිත කිරීම වැනි ඉහළ තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් ජාත්‍යන්තර තැපැල් සේවාවලට අනුකූලව සිය සේවා පුළුල් කිරීම හා විවිධාංගීකරණය කිරීම ඇතුළුව නව ක්‍රියාමාර්ග රැසක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කළ යුතුව ඇත.

## ජල සම්පාදනය හා වාරිමාර්ග

**නල ජලය සඳහා රටේ ඉහළ යන ඉල්ලුම සපුරාලීමට ජල සැපයුම් අංශය සිය සේවා පුළුල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය.** 2019 වසර අග වන විට මුළු සම්බන්ධතා ගණන මිලියන 2.4කට ළඟා වෙමින්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වසර තුළ දී නව ජල සම්බන්ධතා 108,850ක් ලබා දෙන ලදී. 2018 වසර අග වන විට, පිළිවෙළින්, සියයට 90.6ක් සහ සියයට 50.5ක් වූ පිරිසිදු පානීය ජල පහසුකම් සහ නල ජල පහසුකම් සඳහා වන ප්‍රවේශය, 2019 වසර අග වන විට, පිළිවෙළින්, සියයට 91.9ක් සහ සියයට 51.8ක් දක්වා ඉහළ ගියේය. මෙම තත්ත්වයන් යටතේ 2019 වසරේ දී සමස්ත නව ජල සම්බන්ධතා ප්‍රමාණය සියයට 4.7කින් ඉහළ ගියේය. මේ අතර, සමස්ත දිවයිනේ ම ආදායම් නූපදවන ජල සැපයුම් ප්‍රමාණයේ ප්‍රතිශතය 2018 වසරේ දී පැවැති සියයට 24.9 සිට 2019 වසරේ දී සියයට 25ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, 2019 වසරේ දී කොළඹ නගර සීමාව තුළ ආදායම් නූපදවන ජල සැපයුම් ප්‍රමාණය 2018 වසරේ පැවති සියයට 41.7 සිට සියයට 40.6 දක්වා පහළ ගියේය. ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක සේවා සැයීමේ අරමුණින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් බස්නාහිර පළාත සඳහා ගිරිදර ජල සැපයුම් ව්‍යාපෘතිය සහ දකුණු පළාත සඳහා කිරම-කටුවන ජල සැපයුම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. රුපියල් මිලියන 513ක දේශීය අරමුදල් යොදා ගෙන ක්‍රියාත්මක කෙරෙන ගිරිදර ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජල හිඟයෙන් පීඩා විඳින ගිරිදර සහ ඒ අවට ප්‍රදේශවලට පානීය ජලය සැපයීමයි. කිරම-කටුවන ජල සැපයුම් ව්‍යාපෘතිය යුරෝ මිලියන 10.5ක විදේශ අරමුදල්වලින් ක්‍රියාත්මක කෙරෙන අතර, එහි වැඩ අවසන් වූ විට වලස්මුල්ල සහ කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ආවරණය වන පරිදි සේවා පුළුල් කිරීමට අපේක්ෂිතය.



**පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 1.8 ක අලාභය හා සැසඳීමේ දී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2019 වසරේ දී රුපියල් බිලියන 2.1ක මෙහෙයුම් අලාභයක් පෙන්නුම් කළේය.** මූලික වශයෙන් වසර තුළ දී සපයන ලද සම්බන්ධතා ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් සමස්ත ආදායම රුපියල් බිලියන 26.1 දක්වා සියයට 5.1කින් වර්ධනය වූ අතර,

**3.7 සංඛ්‍යා සටහන**

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය**

| ශීර්ෂය | 2018 | 2019 (අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2018 | 2019(අ) |
| මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ) | 348 | 348 | 1.5 | - |
| වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන | 109,482 | 108,850 | -13.6 | -0.6 |
| සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ) | 2,328,654 | 2,437,504 | 4.9 | 4.7 |
| මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන) | 707 | 746 | 4.1 | 5.5 |
| ආදායම් නූපදවන ජලය (%) | | | | |
| කොළඹ නගරය | 41.7 | 40.6 | -3.5 | -2.6 |
| සමස්ත දිවයින | 24.9 | 25.0 | -1.2 | 0.1 |
| පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ) | 90.6 | 91.9 | 1.5 | 1.4 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඈ) | 50.5 | 51.8 | 2.6 | 2.6 |

(අ) තාවකාලික

මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

(ආ) වසර අවසානයේ දී

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2016 මත පදනම් වූ සංසන්දනාත්මක අගය සියයට 88.8 ක් වේ.

(ඈ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය රුපියල් බිලියන 29.4 දක්වා සියයට 6.3කින් ඉහළ ගියේය. තවද, පෙර වසර හා සැසඳීමේ දී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2019 වසරේ දී රුපියල් බිලියන 73.2ක ප්‍රාග්ධන වියදමක් දරනු ලැබූ අතර, එය පෙර වසර හා සැසඳීමේ දී සියයට 18.7ක වර්ධනයකි. 2012 ඔක්තෝබර් මාසයෙන් පසු ජල ගාස්තුවල කිසිදු සංශෝධනයක් සිදු කර නැත.

**ඇතැම් ප්‍රමුඛ වැඩසටහන් ද සමගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී කෘෂිකර්මය සහ ගෘහස්ථ අවශ්‍යතා සැපිරීම සඳහා වාරිමාර්ග ව්‍යාපෘති නඩත්තු කිරීමට සහ වැඩිදියුණු කිරීමට සාමූහිකව ප්‍රයත්න දරන ලදී.** පවුල් 50,000ක් සඳහා පහසුකම් සපයමින් හෙක්ටයාර 5,303කට වාරි ජලය සැපයීම ඉලක්ක කර ගනිමින් හැඩඔය ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. තවද, පවුල් 10,625කට ප්‍රතිලාභ සලසමින් හෙක්ටයාර 9,894කට වාරි ජලය සැපයීමට යෝධ වැව ව්‍යාපෘතිය යටතේ පෝෂක වැව් ප්‍රතිසංස්කරණය කිරීම ද ආරම්භ කරන ලදී. වසර තුළ දී රුපියල් මිලියන 6,564.4ක පිරිවැයක් දරමින් පවත්නා ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති 24ක කටයුතු සිදු කරගෙන යන ලද අතර, එයින් යාන්ඔය සහ කළුගල්ඔය ජලාශ සඳහා වැය කරන ලද මුදල, පිළිවෙළින්, රුපියල් මිලියන 4,263.3ක් සහ රුපියල් මිලියන 514.5ක් විය. දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමට ජල සම්පත් යටිතල පහසුකම්වලට ඇති හැකියාව ඉහළ නැංවීම සඳහා 2014 වසරේ දී ආරම්භ කරන ලද දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) කලාප නවයක් තුළ වාරිමාර්ග යෝජනා ක්‍රම 21ක් ආවරණය කරමින් 2019 වසර අග දක්වා තවදුරටත් ක්‍රියාත්මක විය. දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ අනුමත ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 5,374.4ක් වන අතර, 2019 වසර අවසන් වන විට ඉන් රුපියල් බිලියන 3,736.7ක් වැය වී තිබුණි. මේ අතර, 2019 අග වන විට කලාප 11ක ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම 22ක් ආවරණය කරමින් දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යනය යටතේ රුපියල් මිලියන 2,153.4ක් වැය කර තිබුණි. 2019 වසර අවසන් වන විට උමාඔය පහළ ගංගාධාර ව්‍යාපෘතිය සියයට 85ක භෞතික ප්‍රගතියක් වාර්තා කළ අතර, උමා ඔය ව්‍යාපෘතිය යටතේ ඇති ජලාශ සතරක් වන අලිකොටආර, දියරබා, පුහුල්පොල සහ හඳපානගල ජලාශ 2019 වසරේ ඔක්තෝබර් මස දී මහජනතාවට පවරා දෙන ලදී. ගොවි පවුල් 97,832කට සහන සලසමින් වාරි ජලය අවශ්‍ය ඉඩම් හෙක්ටයාර 72,882කට වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2017 වසරේ දී ආරම්භ කරන ලද ඵලදායිතාව ඉහළ නැංවීමේ සහ වාරිමාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වසර අග වන විට දිස්ත්‍රික්ක 14ක් තුළ මහා පරිමාණ ව්‍යාපෘති 40කට සහ මධ්‍යම පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම 40කට අදාළ කටයුතු ආරම්භ කරන ලදී. මෑතකාලීන වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් දක්නට ලැබුණු විවිධාකාර සමාජ, ආර්ථික, පාරිසරික සහ භූ විද්‍යාත්මක ගැටලු මගින් එවැනි කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍ය සවිස්තරාත්මක පූර්ව පාරිසරික තක්සේරු සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කෙරේ.

## 3.3 සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### සෞඛ්‍ය

**2019 වසර තුළ දී ද රාජ්‍ය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව හා භෞතික සම්පත්වල ආයෝජනය කිරීම රජය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා මිනුවන්ගොඩ ප්‍රාදේශීය රෝහලේ ස්ථාපනය කරන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථානය, මත්පැනට ඇබ්බැහිවූවන් සඳහා රඹුක්කන සහ අතුරුගිරියේ පිහිටුවන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ දියතලාව මූලික රෝහලේ ළමා මනෝ චිකිත්සක ඒකකය ඇතුළු විවිධ භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් 2019 වසරේ දී රජය විසින් නිම කරන ලදී. තවද, පේරාදෙණිය සහ කරාපිටිය ශික්ෂණ රෝහල් වැනි ප්‍රධාන රෝහල්වල වකුගඩු රෝග නිවාරණ ඒකක ඉදි කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. මේ අතර, මාතර දිස්ත්‍රික්කයේ මාතෘ සහ අලුත උපන් ළදරු සත්කාරක පහසුකම් පුළුල් කිරීම හා එම පහසුකම් වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමේ අරමුණින් කඹුරුගමුවේ නව දිස්ත්‍රික් මහ රෝහලේ දැනට පවතින ගොඩනැගිල්ල නැවත සැලසුම් කිරීමේ සහ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය දඅඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සෞඛ්‍ය අංශයේ පවතින තාවකාලික දත්තවලට අනුව 2019 වසර අවසානය වන විට පැවති රජයේ රෝහල් සංඛ්‍යාව 603ක් වූ අතර, එම රෝහල්වල සෑම පුද්ගලයින් 1,000කට 3.6ක් වන පරිදි ඇඳන් ප්‍රමාණයක් පැවතුණි. මේ අතර, 2019 වසර අවසානය වන විට රජයේ රෝහල්වල සෑම පුද්ගලයින් 1,203 දෙනෙකු සඳහා එක් සුදුසුකම් ලත් වෛද්‍යවරයෙක් සහ සෑම පුද්ගලයින් 570 දෙනෙකු සඳහා එක් හෙද සේවකයෙක් බැගින් සේවය කළහ. තවද, 2019 වසර අවසානය වන විට ඇඳන් 4,485ක සමස්ත ධාරිතාවක් සහිතව රජයේ ආයුර්වේද රෝහල් 105ක් පැවති අතර සුදුසුකම් ලත් වෛද්‍යවරු 1,759ක් එම ආයුර්වේද රෝහල්වල සේවය කළහ.

**2019 වසර තුළ දී බෝවන රෝග ව්‍යාප්ත වීම පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්ත ද නිතර මතුවන දේශීය වසංගත සහ ගෝලීය සෞඛ්‍ය උවදුරු මෙරටට සම්ප්‍රේෂණය වීමට ඇති ඉඩකඩ හේතුවෙන් රට දැඩි අවදානමකට මුහුණ දෙමින් සිටී.** ශ්‍රී ලංකාව මවගෙන් දරුවාට එච්.අයි.වී (Human Immunodeficiency Virus - HIV) සහ සිෆිලිස් (Syphilis) සම්ප්‍රේෂණය වීම තුරන් කළ රටක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2019 වර්ෂය තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී. 2017 වසරේ සිට මේ වන තෙක් ශ්‍රී ලංකාව තුළ මවගෙන් දරුවාට එච්.අයි.වී. ආසාදනය වූ බවට වාර්තා නොවූ පසුබිමක, සංජානනීය සිෆිලිස් රෝගී දරු උපත් ගණන සජීවී දරු උපත් 100,000කට දෙකක් පමණ මට්ටමේ දිගින් දිගටම පවත්වා ගෙන ඇති අතර, එය මෙම රෝගය තුරන් කර ඇති රටක් වශයෙන් සහතික කිරීමට පවත්වා ගත යුතු සජීවී දරු උපත් 100,000කට රෝගී දරුවන් 50ක් යන මට්ටමට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයකි. තායිලන්තය සහ මාලදිවයින යන රටවල්වලට පසු කලාපය තුළ මෙම සුදුසුකම අත්කරගත් තුන්වන රට ශ්‍රී ලංකාවයි. එමෙන්ම, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව සරම්ප තුරන් කළ සහ රුබෙල්ලා පාලනය කළ රටක් ලෙස සහතික කරන ලදී. ඒ අනුව, කලාපය තුළ සරම්ප තුරන් කළ සහ රුබෙල්ලා පාලනය කළ සිව්වන රට ශ්‍රී ලංකාවයි. කෙසේ වෙතත්, 2019 වසරේ අවසාන කාලය වන විට ඩෙංගු වසංගත තත්ත්වය වර්ධනය වූ අතර, පෙර වසරේ වාර්තා වූ පුද්ගලයන් 100,000කට ඩෙංගු රෝගීන් 238ක අගය හා සසඳන විට, 2019 වසර තුළ දී පුද්ගලයන් 100,000කට ඩෙංගු වසංගත රෝගීන් 482ක් පෙන්නුම් කරමින් රෝගීන් 105,049ක් වාර්තා වී ඇත. මේ අතර, ඩෙංගු රෝගීන්ගෙන් සියයට 50ක්ම වාර්තා වූයේ සිව්වන කාර්තුවේ දී ය. පසුගිය වසර ගණනාවක් මුළුල්ලේ මූලික අවස්ථාවේ ම රෝගය හඳුනාගැනීම සහ රෝගී තත්ත්ව සක්‍රීය ලෙස කළමනාකරණය තුළින් ඩෙංගු රෝගය අවම කිරීම සහ පාලනය කිරීම සඳහා රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මරණ අනුපාතිකය සියයට 0.15කට වඩා අඩු මට්ටමක පැවතුණි. පෙර වසරේ වාර්තා වූ රෝගීන් 5,257කට සාපේක්ෂව, 2019 දී මී උණ රෝගීන් සංඛ්‍යාව 6,021ක් දක්වා ඉහළ ගියේය. මී උණ රෝගය හා සම්බන්ධ මරණ අනුපාතය සියයට 1.68ක් විය. රත්නපුර, කළුතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලින් වැඩි ම මී උණ රෝගීන් සංඛ්‍යාවක් වාර්තා විය. 2018 වසරේ දී මෙන්ම, 2019 වසරේ දී ද සෘතුමය ඉන්ෆ්ලුවෙන්සා වසංගත තත්ත්වය උච්ච වූ අවස්ථා දෙකක් පැන නැගුණි. පළමු උච්ච අවස්ථාව මැයි සිට ජූලි දක්වා කාලය අතරත් දෙවැන්න ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය අතරත් නිරීක්ෂණය විය. ඉන්ෆ්ලුවෙන්සා රෝගය වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කළ රෝගීන් වැඩි ම සංඛ්‍යාවක් වාර්තා වූයේ නොවැම්බර් මාසයේ දී ය. 2019 වසරේ දී ආවේක්ෂණ මධ්‍යස්ථානවල බාහිර රෝගී අංශය වෙත පැමිණි සමස්ත රෝගීන් සංඛ්‍යාවෙන් සියයට දෙකක් නියෝජනය වූයේ ඉන්ෆ්ලුවෙන්සා රෝගය වැනි රෝග ලක්ෂණ පෙන්වූ රෝගීන් මගිනි. 2019 වසරේ දී ඉන්ෆ්ලුවෙන්සා රෝගය හේතුවෙන් මරණ 50ක් වාර්තා විය. මේ අතර, 2019 වසරේ දෙසැම්බර් මස අග දී චීනයේ පැන නැගුණු කොවිඩ්-19 වසංගතය, 2020 මාර්තු වන විට ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ වසංගතයක් බවට පත් විය. ශ්‍රී ලංකාවට වෙනත් රටවලින් කොවිඩ්-19 සම්ප්‍රේෂණය වීමට ඇති අවදානම වැඩිවීමත් සමඟ ම කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වැනි රටට ආගමන සිදු වන ස්ථානවල රෝග ආවේක්ෂණ කටයුතු සහ නිරෝධායන වැඩසටහන් ශක්තිමත් කරන ලදී. මෙම රෝගයේ කේන්ද්‍රස්ථානය වූ චීනයේ වූහාන් නගරයේ ඉගෙනුම ලබමින් සිටි සිසුන් තිස් දෙනෙකු මෙරටට ගෙන්වා ගත් අතර ඔවුන්ගෙන් කිසිවෙකුටත් කොවිඩ්-19 ආසාදනය වූ බවට වාර්තා නොවූවද ඔවුන් දියතලාව හමුදා කඳවුරේ දී නිරෝධායනයට ලක් කරන ලදී. කන්දකාඩු, පූනානි, දියතලාව, පොම්පෙමඩු, පනිච්චන්කර්නි, මීයන්කුලම්, බොරවැව, ගල්කන්ද, කහගොල්ල, දම්මින්න සහ රන්ටැඹේ ඇතුළු ස්ථාන කිහිපයක නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවන ලදී. 2020 මාර්තු 10 වන දින සිට ඉතාලිය, ඉරානය සහ දකුණු කොරියාව වැනි ඉහළ අවදානම් සහිත රටවලින් පැමිණෙන සියලු ම ගුවන් මගීන් මෙම නම් කරන ලද නිරෝධායන මධ්‍යස්ථානවල නිරෝධායනයට ලක් කරන ලදී. තවද, දකුණු කොරියාව, ඉරානය සහ යුරෝපීය රටවල් ඇතුළු ඉහළ අවදානම් සහිත රටවලින් පැමිණෙන පුද්ගලයින්ට සංචාරක සීමාවන් පනවනු ලැබුවේය. 2020 මාර්තු 19 දින සිට ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් වාණිජ මගී ගුවන් ගමන් සඳහා වසා දමන ලදී. තවද, ගෝලීය වශයෙන් කොවිඩ්-19 රෝගීන්ගේ ඉහළ යෑම සැලකිල්ලට ගෙන 2020 මාර්තු මාසයේ දී පැමිණෙන අවස්ථාවේ දී වීසා බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රමය (on arrival visa) ද අත්හිටවනු ලැබීය. තවද, කොරෝනා වෛරසය ක්‍රියාත්මක වීම වැළැක්වීම සඳහා දැනටමත් ආගමන සීමාවන් පනවා ඇති රටවල් සඳහා සහයෝගය දැක්වීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලාංකිකයන්ට විදේශ

3

**3.8 සංඛ්‍යා සටහන**

**සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|
| 1. රාජ්‍ය අංශය | | |
| රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය) | 612 | 603 |
| ඇඳන් සංඛ්‍යාව | 76,824 | 77,964 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 506 | 499 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව | 19,692 | 18,130 |
| සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව | 895 | 756 |
| හෙද සේවක සංඛ්‍යාව | 34,714 | 38,276 |
| උපස්ථායක සංඛ්‍යාව | 8,614 | 8,531 |
| 2. ආයුර්වේද | | |
| රෝහල් සංඛ්‍යාව | 104 | 105 |
| ඇඳන් සංඛ්‍යාව | 4,311 | 4,485 |
| සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව | 1,787 | 1,759 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ) | 25,431 | 25,783 |
| 3. රජයේ මුළු සෞඛ්‍ය වියදම (රු. බිලියන) | 218.5 | 244.3 |
| පුනරාවර්තන වියදම | 180.6 | 211.6 |
| ප්‍රාග්ධන වියදම | 37.9 | 32.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්

මූලයන්: සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

රැකියා සඳහා පිටත්වීමේ වාරණ පනවන ලදී. රට තුළ රෝගය පැතිරීම වැළැක්වීම සඳහා පාසල්, පෞද්ගලික උපකාරක පන්ති, ඉරිදා දහම් පාසල් සහ විශ්වවිද්‍යාල තාවකාලිකව වසා දමන ලදී. කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා ස්වයං නිරෝධායන සහ සමාජ දුරස්ථකරණ පියවර දැඩි ලෙස ක්‍රියාත්මක කෙරිණි. හදිසි තත්ත්ව යටතේ ප්‍රතිකාර ලබා දීම සඳහා දිවයින පුරා පිහිටි රජයේ රෝහල් 24ක පහසුකම් සලසන ලද අතර, කොවිඩ්-19 ආසාදිත බවට සැක සහිත රෝගීන් සඳහා රෝහල් 12ක් සූදානම් කරන ලදී. ශ්‍රී ලංකාව දේශීය වශයෙන් මැලේරියාව තොර කළ රටක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නමුත් 2019 වසරේ දී විදේශයන්හි දී මැලේරියා රෝගය ආසාදනය වී මෙරටට පැමිණි රෝගීන් 53ක් වාර්තා විය. මෑත කාලයේ දී දක්නට ලැබුණු මෙවන් ප්‍රවණතා මගින් ගෝලීය වසංගත ශ්‍රී ලංකාවට සම්ප්‍රේෂණය වීමේ අවදානම සහ මැලේරියාව සහ සරම්ප වැනි රට තුල මේ වන විට මර්ධනය කර ඇති බෝවන රෝග නැවත ඇතිවීමේ අවදානමක් පවතින බව ඉස්මතු කෙරේ.

**ආර්ථිකයට විශාල බරක් වන උග්‍ර හා නිදන්ගත බෝ නොවන රෝග වැළැක්වීම හා මර්ධනය කිරීම සඳහා රජය විසින් ගන්නා ප්‍රයත්න 2019 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, රටේ සිදුවන මරණවලින් සියයට 83ක්ම බෝ නොවන රෝග පාදක කොට ගෙන සිදු වන මරණ වන අතර, බෝ නොවන රෝග නිසා අඩු වයසින් මරණ ඇති වීමේ අවදානම සියයට 17ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. බෝ නොවන රෝග පදනම් කර ගෙන ඇති වන රෝගාබාධ හා මරණ හේතුවෙන් පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ සමස්ත ආර්ථිකයට සැලකිය යුතු සමාජ ආර්ථික පිරිවැයක් දැරීමට සිදු වේ. හෘද වාහිනී සම්බන්ධ රෝග, පිළිකා නිදන්ගත ස්වසන රෝග හා දියවැඩියාව රටේ සිදුවන සමස්ත මරණවලින්, පිළිවෙළින්, සියයට 34කට, සියයට 14කට, සියයට අටකට සහ සියයට නවයකට දායක වේ. ඒ අනුව, මෙම රෝග හතර සාමූහිකව ශ්‍රී ලංකාවේ මුළු මරණ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයකට දායක වේ. ලෝක බැංකුව සහ යුනිසෙෆ් ආයතනය තවත් සංවිධාන කිහිපයක් සමඟ සම්බන්ධව 2020 දී ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවකට අනුව, බෝ නොවන රෝග මගින් ශ්‍රී ලංකාවේ ආබාධිත ගැළපුම් ආයු කාලය[1] සඳහා දක්වන දායකත්වය 1990 වසරේ දී සියයට 53ක මට්ටමේ සිට 2017 වසරේ දී සියයට 77ක් දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර, බෝ නොවන රෝග නිසා ඇතිවන ආබාධිත ගැළපුම් ආයු කාලය සියයට 36කින් වර්ධනය වී ඇත. එබැවින්, ප්‍රධාන උග්‍ර හා නිදන්ගත බෝ නොවන රෝග හා සම්බන්ධව වෙනස් කළ හැකි අවදානම් සාධක (දුම්කොළ, මධ්‍යසාර, සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර සහ ශාරීරික අකර්මණ්‍ය බව) සහ පරිවෘත්තීය අවදානම් සාධක (අධික රුධිර පීඩනය, අධි රුධිර සීනි මට්ටම, අධි රුධිර කොලෙස්ටරෝල්) පාලනය කිරීම සඳහා අවදානම් අඩු කිරීමේ විවිධ වැඩසටහන් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන්, පාසල්, රැකියා සහ ප්‍රජා කණ්ඩායම් ආශ්‍රිතව උග්‍ර හා නිදන්ගත බෝ නොවන රෝගවල අවදානම් සාධක සහ මෙම රෝග කල්තියා හඳුනාගැනීමේ වැදගත්කම පිළිබඳව සෞඛ්‍ය අධ්‍යාපන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී. තවද, 2019 වසරේ දී හෘද රෝග, ආඝාතය, අධි රුධිර පීඩනය, දියවැඩියාව, නිදන්ගත වකුගඩු රෝග, රක්තවාත රෝග, නිදන්ගත ස්වසන රෝග සහ ස්ථූලතාවය වැනි තෝරාගත් නිදන්ගත බෝ නොවන රෝග සඳහා භෞතික ක්‍රියාකාරකම් හා ආහාර පිළිබඳ මාර්ගෝපදේශන මෙන්ම දියවැඩියාව, අධික බර, ස්ථූලභාවය සහ ලුණු අඩු කිරීමේ උපායමාර්ග පිළිඳව ප්‍රාථමික සෞඛ්‍ය සපයන්නන් මාර්ගෝපදේශන සකස් කර බෙදා හරින ලදී. 2019 වසරේ දී මෙරට නිදන්ගත

1 ආබාධිත ගැළපුම් ආයු කාලය යනු නිරෝගී ජීවිතයක් අහිමි වූ වසර ගණන මනින මිණුම් දණ්ඩකි. ජනගහනය තුළ සියලු ආබාධිත ගැළපුම් ආයුකාලයන්ගේ එකතුව තුළින් රෝග නිසා ආර්ථිකය මත පැටවෙන සමස්ත බර පෙන්නුම් කරන අතර, එමගින් මුළු ජනගහනය ම රෝග සහ ආබාධිත බවින් තොරව වයස්ගත වන තෙක් ජීවත් වීම යන පරිපූර්ණ සෞඛ්‍ය තත්ත්වය සහ ජනගහනයේ වත්මන් සෞඛ්‍ය තත්ත්වය අතර පවතින පරතරය මනිනු ලබයි.

**3.9 රූප සටහන**

**සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම්**




මූලයන්: මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව

වකුගඩු රෝග ව්‍යාප්තිය සියයට 0.94ක් ලෙස වාර්තා වූ අතර, වැඩිම නිදන්ගත වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූයේ අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක වලිනි. නිදන්ගත වකුගඩු රෝගීන් රුධිර කාන්දුකරණ (dialysis) පහසුකම් සපයන රාජ්‍ය ආයතන 77න් එකක ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2019 වසර අවසන් වන විට රජයේ රෝහල්වල රුධිර කාන්දුකරණ යන්ත්‍ර 454ක් ක්‍රියාත්මක විය. 2019 වසරේ දී හෝමාගම මූලික රෝහල සහ මීගමු දිස්ත්‍රික් මහ රෝහල තුළ නව රුධිර කාන්දුකරණ ඒකක ක්‍රියාත්මක කරන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ පිළිකා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ ආයතනයට අනුව, ශ්‍රී ලංකාව තුළ අවුරුදු 75ක් වීමට පෙර පිළිකා වර්ධනය වීමේ අවදානම සහ පිළිකා හේතුවෙන් මිය යෑමේ අවදානම, පිළිවෙළින්, සියයට 9.1ක් සහ සියයට 5.5ක් විය. රජය විසින් දිස්ත්‍රික්ක 17ක පිළිකා වැළැක්වීම සහ කල්තියා හඳුනාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර, රෝග වැළැක්වීම සහ අවදානම් අධික පුද්ගලයින් හඳුනාගැනීම සඳහා පරීක්ෂා කිරීම පිළිබඳ සෞඛ්‍ය සේවකයින් දැනුවත් කිරීම සඳහා ශක්‍යතා වර්ධන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද, මහරගම අපේක්ෂා රෝහල ඇතුළු පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා පිළිකා ප්‍රතිකාරක යන්ත්‍ර සහ උපකරණ ලබා දෙන ලදී.

**2019 වසරේ දී ද පෞද්ගලික අංශය වෙතින් සෞඛ්‍ය සේවා සැපයීමේ දී වැදගත් කාර්යභාරයක් සිදු විය.** සමස්ත ඇඳන් 5,147කින් සමන්විත ලියාපදිංචි බටහිර වෛද්‍ය පෞද්ගලික රෝහල් 207ක් 2019 වසර අවසන් වන විට පැවතුණි. 2019 වසර අවසන් වන විට පූර්ණ කාලීන පෞද්ගලික සාමාන්‍ය වෛද්‍ය සේවා/බෙහෙත් ශාලා/වෛද්‍ය සායන 194ක්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන/පරීක්ෂණ මධ්‍යස්ථාන/ දිවා කාලයේ දී ක්‍රියාත්මක වන වෛද්‍ය මධ්‍යස්ථාන/විශේෂඥ උපදේශන සේවා 181ක්, පෞද්ගලික වෛද්‍ය විද්‍යාගාර 413ක්, අර්ධ කාලීන පෞද්ගලික සාමාන්‍ය වෛද්‍ය සේවා/බෙහෙත් ශාලා/වෛද්‍ය සායන 394ක්, අර්ධ කාලීන පෞද්ගලික දන්ත සෞඛ්‍ය මධ්‍යස්ථාන 20ක් සහ පෞද්ගලික වෛද්‍ය ගිලන් රථ සේවා 10ක් ශ්‍රී ලංකාව ඇතුළත ලියාපදිංචි කර තිබිණි. නිදහස් සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සැමට ලබා දීමට රජය අඛණ්ඩව ක්‍රියා කළ ද රාජ්‍ය මූල්‍ය සංරෝධන සහ වියපත් වන ජනගහනයේ ශීඝ්‍ර වැඩි වීම හේතුවෙන් රජයේ සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් වෙන් කර දීමේ හැකියාව සීමා වී ඇති අතර ම, ජනගහනය තුළ ආදායම ඉහළ යෑමත් සමඟ පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට ඇති අභිරුචිය ඉහළ යමින් පවතී. එබැවින් රටේ සෞඛ්‍ය සේවා ඉල්ලුම සපුරාලීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පෞද්ගලික ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම, ප්‍රමිතිය සහතික කරනු පිණිස ශක්තිමත් නියාමන සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් පිහිටුවීම සහ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීම වැනි ක්‍රමවේද අත්‍යවශ්‍ය වේ. සියලුම වැඩිහිටි පුද්ගලයන්ගේ ඉහළ යන සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ රෝහල්වල ප්‍රමාණවත් පහසුකම් නොමැති නිසා, වියපත් වන ජනගහනයේ වර්ධනය, බෝ නොවන රෝග ව්‍යාප්තිය ඉහළ යෑම සහ ගෘහස්ථ ආදායම් මට්ටම් ඉහළ යෑම සමඟ පෞද්ගලික අංශය මගින් සිදු කරන වැඩිහිටියන් සඳහා වන වෘද්ධ වෛද්‍ය හා සහන සත්කාර සේවා වෙත කෙරෙන ආයෝජන තවදුරටත් ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ.

### අධ්‍යාපනය

**සියලු දරුවන්හට අධ්‍යාපනය සඳහා සම ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් 2019 වසරේ දී ද රජය විසින් සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් හා මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී.** ඒ අනුව, සමාලෝචනයට ලක්වන වසර තුළ දී ළඟම පාසල හොඳම පාසල වැඩසටහන සඳහා වූ අයවැය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය යටතේ රුපියල් බිලියන 12.9ක් වැය කරමින් නව පන්ති කාමර, විද්‍යාගාර, පුස්තකාල ආදී විවිධ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කරන ලදී. ළඟම පාසල හොඳම පාසල ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ පළාත් පාසල්වල

3

යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 13,995ක් සහ ජාතික පාසල්වල එවැනි ව්‍යාපෘති 2,312ක් ආරම්භ කර ඇත. 2019 වසර අවසන් වන විට පළාත් පාසල්වල සහ ජාතික පාසල්වල ව්‍යාපෘතිවලින්, පිළිවෙළින්, සියයට 86ක් සහ සියයට 68ක් නිම කර තිබේ. මේ අතර, 2019 වසරේ දී ගුරුවරුන් 6,389 ක් බඳවා ගත් අතර, ඉන් 3,411ක් පළාත් පාසල්වලට අනුයුක්ත කර ඇත. තවද, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප සහ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මගින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පාසල් 8,500ක ගුරු ඇගයීම් සිදු කරන ලදී.

**2019 වසරේ දී පාසල් මගින් ලබා දෙන විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත (STEM) සහ වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට රජය විසින් විවිධ පියවර ගන්නා ලදී.** මේ සඳහා, සමාලෝචනයට ලක්වන කාලය තුළ දී විෂයමාලා සංවර්ධන කටයුතු සහ ඉගැන්වීම් සඳහා අතිරේක සම්පත් සකස් කිරීම සිදු විය. මේ අතර, රජය විසින්, ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව, ගණිත නොවන ගුරුවරු සිය දෙනෙකු සඳහා ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් පාඨමාලාවක් පැවැත්වූ අතර ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන ගුරුවරු 900ක් සහ සංයුක්ත ගණිතය උගන්වන ගුරුවරු 91ක් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. තවද, 2019 වසරේ දී අලුතින් බඳවා ගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරු සිය දෙනෙකු සඳහා ජාතික අධ්‍යාපන ආයතනයෙහි දී පුහුණුව ලබා දුන් අතර, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් තවත් ගුරුවරුන් තිස් දෙනෙකු පරිගණක ක්‍රමලේඛන භාෂා සහ දත්ත සමුදායන් පිළිබඳව පුහුණු කරවන ලදී. මීට අමතරව, 2019 වසරේ දී අන්තර්ජාල ආරක්ෂණ සූදානම සඳහා ප්‍රධාන පුහුණුකරුවන් 114 දෙනෙකු පුහුණු කෙරිණි. මෙම ප්‍රධාන පුහුණුකරුවන් විසින් ඔවුන්ගේ කලාපවල අනෙකුත් ගුරුවරු සයිබර් ආශ්‍රිත සිදුවීම් පාලනය කිරීම සම්බන්ධයෙන් පුහුණු කරවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ඉංජිනේරු තාක්ෂණය සහ සැලසුම් හා තාක්ෂණවේද ගුරුවරු සඳහා රොබෝ විද්‍යාව පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මේ අතර, 2013 දී තාක්ෂණවේද විෂය ධාරාව හඳුන්වා දීමේ සිට අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ (අ.පො.ස. උසස් පෙළ) තාක්ෂණවේද විෂය ධාරාවට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. ඒ අනුව, 2019 වසරේ දී පාසල් 447ක සිසුන් 19,750කට තාක්ෂණවේද විෂය ධාරාව ඉගෙනීමේ අවස්ථාව ලැබී ඇත. සමාලෝචනයට ලක්වන වසර තුළ, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය සමග එක්ව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ තාක්ෂණවේද විෂය ධාරාව සඳහා නව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීමට රජය විසින් කටයුතු අරඹන ලදී. තවද, තාක්ෂණවේද විෂය ධාරාව අ.පො.ස. (උසස් පෙළ) සඳහා ඉගෙන ගන්නා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල පදනම් කරගෙන ශිෂ්‍යත්ව 1,000ක් ලබා දෙන ලදී. මේ අතර, 2019 වසරේ දී *13* වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහනේ තුන්වන අදියර ක්‍රියාත්මක විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරු 120 දෙනෙකු ජාතික වෘත්තීය සුදුසුකම් 3 සහ 4 මට්ටමේ පරිගණක දෘඩාංග හා ජාලකරණය විෂයමාලාව පිළිබඳව පුහුණු කර ඇත.

**සාමාන්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඉහළ යමින් තිබුණ ද, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට අදාළ නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණ මේ දක්වා දුර්වල මට්ටමක පවතී.** 2019 වසර අවසන් වන විට රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල් (ජාත්‍යන්තර පාසල් හැර) 118ක් සහ පිරිවෙන් 796ක් විය. 2019 වසරේ දී පෞද්ගලික පාසල් (ජාත්‍යන්තර පාසල් හැර) සහ පිරිවෙන්වල ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව, පිළිවෙළින්, 139,070ක් සහ 64,802ක් විය. රජය විසින් අනුමත කරන ලද මෙම පෞද්ගලික පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ වපසරියට යටත් වන අතර, එබැවින් ඒවා රජයේ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති අනුගමනය කිරීමට බැඳී සිටී. 2019 වසරේ දී ජාත්‍යන්තර පාසල් 389ක් විසින් සිසුන් 140,223කට සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයට අනුව, මෙම ජාත්‍යන්තර පාසල්වලින් හතක් පමණක් ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති අතර, ඉතිරි පාසල් සමාගම් පනත යටතේ සමාගම් ලෙස ලියාපදිංචි කර ඇත. මේ අතර, සිසුන්ට සාමාන්‍ය පාසල් අධ්‍යාපනය ලබා දෙන ආගමික ආයතන රාශියක් තිබුණි.[2] නිදසුනක් වශයෙන්, 2020 පෙබරවාරි මස අවසානය වනවිට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ මද්‍රාසා පාසල් 1,495ක්[3] සහ අරාබි විද්‍යාල 317ක් ලියාපදිංචි කර ඇත. කෙසේ වෙතත්, පවතින නෛතික රාමුවේ ඇති දුර්වලතා හේතුවෙන් මෙම ජාත්‍යන්තර පාසල් සහ ආගමික පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ වපසරියට යටත් නොවේ. එබැවින්, ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව, මෙම පාසල්වල උගන්වනු ලබන විෂයමාලා, ගුණාත්මක ප්‍රමිතීන් සහ පිළිගත හැකි තරග විභාග මගින් මෙම පාසල්වල සිසුන් ඇගයීමට ලක් කරන්නේ ද

2 ආගමික අධ්‍යාපනය පමණක් ලබා දීම සඳහා පන්සල්, කතෝලික පල්ලි සහ මුස්ලිම් පල්ලි මගින් සති අන්තයේ පවත්වනු ලබන ආගමික පාසල් හැර

3 සති අන්තයේ පමණක් පවත්වන මද්‍රාසා පාසල් මෙම සංඛ්‍යාවට අයත් නොවේ.

### 3.9 සංඛ්‍යා සටහන
### සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 11,044 | 11,083 |
| රජයේ පාසල් | 10,175 | 10,169 |
| ප්‍රාථමික පාසල් | 3,890 | 3,883 |
| ද්විතීයික පාසල් | 6,285 | 6,286 |
| ඉන්, ජාතික පාසල් | 353 | 373 |
| වෙනත් පාසල් | 869 | 914 |
| පිරිවෙන් | 763 | 796 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 106 | 118 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,538,148 | 4,493,756 |
| රජයේ පාසල් | 4,214,772 | 4,149,661 |
| වෙනත් පාසල් | 202,907 | 203,872 |
| පිරිවෙන් | 60,875 | 64,802 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 142,032 | 139,070 |
| ජාත්‍යන්තර පාසල් | 120,469 | 140,223 |
| 3. මුළු ගුරුවරු සංඛ්‍යාව | 272,998 | 272,063 |
| රජයේ පාසල් | 247,334 | 243,365 |
| වෙනත් පාසල් | 14,151 | 15,130 |
| පිරිවෙන් | 6,832 | 7,082 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 7,319 | 8,048 |
| ජාත්‍යන්තර පාසල් | 11,513 | 13,568 |
| 4. නව ඇතුළත්කර ගැනීම් (ඈ) | 328,632 | 328,776 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | | |
| රජයේ පාසල් | 17 | 17 |
| වෙනත් පාසල් | 14 | 13 |
| ජාත්‍යන්තර පාසල් | 10 | 10 |
| 6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි) | 91.86 | ලැ.නො. |
| 7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි) | 95.27 | ලැ.නො. |
| 8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) | 95.38 | ලැ.නො. |
| 9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 8 | 8 |
| 10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව | 2,027 | 2,954 |
| 11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 19 | 19 |
| පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව | 12,900 | 16,411 |
| වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව | 1,650 | 4,247 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ).
(ඈ) රජයේ පාසල් සඳහා පමණි.

මූලය: අධ්‍යාපන අමාත්‍යාංශය

යන්න පිළිබඳව අධීක්ෂණය කිරීමට කිසිදු යාන්ත්‍රණයක් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැත. පෞද්ගලික අංශය හරහා අධ්‍යාපනය ලබා ගැනීමට යොමු වන සිසුන් සඛ්‍යාව වැඩි වීම සැලකිල්ලට ගනිමින්, මෙම පාසල්වල සිසුන්ට ඵලදායී වැඩිහිටි දිවියක් ගත කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දෙන බව සහතික කිරීමටත්, මෙම පාසල් විසින් සපයනු ලබන අධ්‍යාපන සේවා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුතු බව තහවුරු කිරීමටත්, සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන පෞද්ගලික ආයතනවලට අදාළ නෛතික රාමුව සහ අධීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

**පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව රජය විසින් රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හරහා තෘතීයික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශය වැඩි කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.** 2018 අගෝස්තු මාසයේ දී පවත්වන ලද අ.පො.ස. උසස් පෙළ විභාගයෙහි ප්‍රතිඵල මත පදනම්ව උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම සහ කඩඉම් ලකුණු නිකුත් කිරීම 2019 ජූලි මාසයේ දී අවසන් කරන ලදී. ඒ අනුව, අතිරේක හා විශේෂ බඳවා ගැනීම් හැරුණු විට, සිසුන් 30,830ක් රජයේ විශ්වවිද්‍යාල සඳහා තෝරා ගන්නා ලදී. 2018/19 අධ්‍යයන වර්ෂය තුළ නව අධ්‍යයන පාඨමාලා දෙකක් හඳුන්වා දෙන ලදී. මේ අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පීඨ පහක්, නව දෙපාර්තමේන්තු 47ක්, මූලික උපාධි පාඨමාලා දෙකක්, එක් බාහිර උපාධි පාඨමාලාවක්, විශේෂ මූලික උපාධි පාඨමාලා පහක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 34ක් අලුතින් අනුමත කරන ලදී. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය වපසරියට අයත් වන උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයන්ට ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍යාධාර ලබා දුන්නේය. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් 14 දෙනෙකුට ඔවුන්ගේ ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සඳහා රුපියල් මිලියන 75ක් අනුමත කරන ලදී. මේ අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය අභ්‍යන්තර හා බාහිර වශයෙන් තත්ත්ව සහතික කිරීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාල සමඟ එක්ව ක්‍රියා කළේය. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල 15හි ම ඇති අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකක සමඟ සමීපව කටයුතු කරන ලදී. 2019 තුන්වන කාර්තුව වන විට අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකක 11ක් විසින් උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියෙහි ඉලක්කය සපුරා ඇත. 2019 වසරේ දී බාහිර තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආයතනික සමාලෝචන සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය වෙත විශ්වවිද්‍යාල හතරකින් ස්වයං ඇගයීම් වාර්තා

3

**3.10 සංඛ්‍යා සටහන**

**විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)**

| ශීර්ෂය | 2018 (ආ) | 2019 (ඇ) |
|---|---|---|
| 1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව | 15 | 15 |
| 2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | 19 | 19 |
| 3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ) | | |
| විශ්වවිද්‍යාල (ඉ) | 93,787 | 95,920 |
| ආයතන | 3,680 | 3,706 |
| විවෘත විශ්වවිද්‍යාලය | 24,453 | 25,165 |
| 4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල) | | |
| අධ්‍යයන | 6,003 | 6,116 |
| අනධ්‍යයන | 12,650 | 12,727 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | 17.8 | 17.7 |
| 6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත්වීමේ අනුපාතය (අවුරු 1923) (ඈ) | 7.5 | 7.5 |
| 7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම | | |
| ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%) | 64.40 | 62.87 |
| සුදුසුකම් ලැබූවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%) | 19.25 | ලැ.නො. |
| 8. උපාධිලත් සංඛ්‍යාව (ඊ) | 36,983 | ලැ.නො. |
| ප්‍රථම උපාධි | 26,024 | ලැ.නො. |
| පශ්චාත් උපාධි | 10,959 | ලැ.නො. |
| 9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත්වීම (උ) | 31,451 | ලැ.නො. |
| 10. විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | 163,160 | 167,992 |

මූලය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ.
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.
(ඊ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ.
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.

ලැබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය විසින් 2019 දෙසැම්බර් මාසයේ දී ඇගයීම් කටයුතු සඳහා එක් ස්ථානීය සංචාරයක් සම්පූර්ණ කරන ලදී. 2019 වසරේ මැද භාගයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කර දියත් කරන ලද අතර, පුහුණු සැසිවල සටහන්, බාහිර සමාලෝචන වාර්තා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි තත්ත්ව සහතික සඳහා වන චක්‍රලේඛ හා ප්‍රකාශන සහ වෙනත් අදාළ ප්‍රවෘත්ති හා සිදුවීම් පිළිබඳව එම වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන කිරීම සිදු වේ. නවක වදය සහ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසනය සම්බන්ධ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පැමිණිලි සම්බන්ධව ක්‍රියාකරන කේන්ද්‍රීය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව දුරකථන, විද්‍යුත් මංගත (Online), විද්‍යුත් තැපැල්, පුද්ගලික සහ ලිඛිත යන ආකාර ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ශ්‍රී ලංකා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහාය ඇතිව, සිසුන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට හදිසි අවස්ථාවල දී උප කුලපති, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අදාළ පුද්ගලයින් දැනුම්වත් කිරීම සහ ඔවුන්ගෙන් උපකාර ලබා ගැනීම සඳහා හදිසි ආරක්ෂිත ජංගම යෙදුමක් හඳුන්වා දෙන ලදී. නවක වදය සහ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසාකාරී සිදුවීම් හේතුවෙන් විශ්වවිද්‍යාල පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට දැඩි බලපෑමක් ඇති කෙරෙන අතර, එමගින් සිසුන් බඳවා ගැනීම හා උපාධි ප්‍රදානය ප්‍රමාද වීම් සහ අධ්‍යයන කටයුතු සඳහා බාධාවීම් සිදු වේ. තවද, මෙවැනි සිදුවීම් නිසා විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වීමට අපේක්ෂා කරන නවකයින් අධෛර්යමත් වීමක් සිදු වන අතර, එමගින් තෘතීයික අධ්‍යාපනය සඳහා ලියාපදිංචි ප්‍රමාණයට බලපෑමක් සිදු වේ. එවැනි සිදුවීම්වල ප්‍රතිවිපාක අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට ප්‍රධාන වශයෙන් බලපානුයේ ඔවුන්ට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හරහා විකල්ප තෘතීයික අධ්‍යාපනයක් වෙත යොමු විය නොහැකි නිසාවෙනි. එබැවින්, පුද්ගලික රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා පවතින ඉල්ලුම ඉහළ යන

**3.11 සංඛ්‍යා සටහන**

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2018 | 2019 (අ) |
|---|---|---|
| 1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ) | 1,147 | 1,290 |
| රාජ්‍ය | 525 | 582 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 622 | 708 |
| 2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව | 2,089 | 2,691 |
| රාජ්‍ය | 1,593 | 2,099 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 496 | 592 |
| 3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව | 61,150 | 78,007 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 8,818 | 11,199 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 13,755 | 11,387 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 20,810 | 25,696 |
| ජාතික තරුණ සේවා සභාව | 1,780 | 1,933 |
| පෞද්ගලික ආයතන | 15,987 | 27,792 |

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

### විශේෂ සටහන 7

## මැදි ආදායම් උගුලෙන් මිදීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

දුප්පත් රටක තත්ත්වයෙන් පහසුවෙන් මිදුණු බොහෝ රටවල් මැදි ආදායම් මට්ටමට ළඟා වූ පසු ආර්ථික වර්ධන වේගය මන්දගාමී වන ස්වරූපයක් අත් විඳ ඇත. එක් අතකින්, මෙම රටවලට අඩු වැටුප් සහිත, ශ්‍රමය බහුලව යොදාගෙන නිපදවන අනුකරණ වෙළෙඳ භාණ්ඩ අපනයනය කරන දුප්පත් ආර්ථිකයන් සමඟ තරග කිරීමට නොහැකි වී තිබේ. අනෙක් අතට, ඉහළ ඵලදායිතාවයකින් යුතු නිපුණ ශ්‍රමයක් භාවිත කරමින් නිපදවන නවෝත්පාදන මත පදනම් වූ භාණ්ඩ අපනයනය කරන දියුණු ආර්ථිකයන් සමඟ ද තරග කිරීමට මෙම රටවල් අසමත් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම මැදි ආදායම් ලබන රටවල් සම්පත් මත පදනම් වූ වර්ධනයක සිට ඵලදායිතාව මත පදනම් වූ වර්ධනයක් දක්වා නිසි කලට සංක්‍රමණය නොවන අතර, මෙම තත්ත්වය 'මැදි ආදායම් උගුල' ලෙස හැඳින්වේ. මැදි ආදායම් උගුලෙන් මිදීම ශ්‍රී ලංකාවට ද අභියෝගාත්මක වන නමුත්, ඉන් මිදීම තිරසාර ඉහළ වර්ධන මාවතක් කරා ළඟා වීමට අත්‍යවශ්‍ය වේ.

ලෝක බැංකුවේ වර්ගීකරණයට අනුව, 1997 දී ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් සීමාව ඉක්මවා ගිය ද, මෙරට ඉහළ මැදි ආදායම් මට්ටමට ළඟා වීමට තවත් වසර 21ක් ගත විය. සියයට 5ක වාර්ෂික වර්ධන වේගයකින්[1] මෙරට වර්ධනය වන්නේ නම් ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වීමට තවත් වසර 22-23ක් අවශ්‍ය වනු ඇත. එබැවින්, තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීමට අවශ්‍යවන ආර්ථික වර්ධනය කේන්ද්‍රීය කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හා උපාය මාර්ගික සැලසුම් සමඟ ම සාර්ව ආර්ථික ස්ථායීතා ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක නොකරන්නේ නම්, ශ්‍රී ලංකාව ද වසර 40කට වඩා වැඩි කාලයක් මැදි ආදායම් උගුලක් තුළ සිර වී සිටීමට සිදුවනු ඇත.

මැදි ආදායම් අවධියේ දී ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධක රැසක් තිබුණ ද, මානව ප්‍රාග්ධනය රැස්කිරීමටත් එමගින් රටේ තරගකාරිත්වය ඉහළ නැංවීමටත් විධිමත් අධ්‍යාපන ක්‍රමයක් තිබීම සෑම විටම අතිශයින් ම වැදගත් වේ. විධිමත් අධ්‍යාපන ක්‍රමයක් මගින් ශ්‍රම බලකාය අලෙවි කළ හැකි නිපුණතාවලින් සන්නද්ධ කරවන අතර, නවෝත්පාදන හා ඵලදායීතා වර්ධනයට දිරිදෙනු ලැබේ. බොහෝ විට රටක රාජ්‍ය ආයෝජන තුළින් අරමුණු කරනුයේ සාමාන්‍ය අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමයි. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික මට්ටමේ අධ්‍යාපනය නොමිලේ ලබා දීමේ අධ්‍යාපන ප්‍රතිපත්තියක් 1945 සිට අනුගමනය කළ අතර, වර්තමානයේ දී මෙරට පුරුෂ සාක්ෂරතාවය (2018 දී සියයට 93.4ක් ලෙසත්) සහ ස්ත්‍රී සාක්ෂරතාවය (2018 දී සියයට 91.6ක් ලෙසත්) යන දෙඅංශයෙහි ම සාක්ෂරතා අනුපාත ආකර්ෂණීය ඉහළ මට්ටමක පවතී. මානව සංවර්ධනය අතින් කලාපීය සෙසු රටවල් අභිබවා යාමට ඉහළ සාක්ෂරතා මට්ටම වැදගත් වුව ද, රූප සටහන වි.ස. 7.1හි දැක්වෙන පරිදි, රටකට මැදි ආදායම් අවදියේ දී ආර්ථික වර්ධනය වේගවත් කිරීමට මූලික වන නවෝත්පාදන හා තරගකාරිත්වය අතින් ශ්‍රී ලංකාව තවමත් පසුගාමී වේ.

**රූප සටහන වි.ස. 7.1**

**ගෝලීය නවෝත්පාදන දර්ශකය - 2019 සහ ගෝලීය තරගකාරිත්ව දර්ශකය - 2019 අනුව ශ්‍රේණිගත කිරීම්[2]**




මූලයන් : ගෝලීය නවෝත්පාදන ශ්‍රේණිගත කිරීමේ වාර්තාව - 2019
ගෝලීය තරගකාරිත්ව ශ්‍රේණිගත කිරීමේ වාර්තාව - 2019

ආර්ථික සංවර්ධනයත් සමග ආර්ථිකයේ නිපුණතා හා සම්බන්ධ අවශ්‍යතා ද කාලයත් සමග පරිණාමයකට ලක් වේ. එබැවින් මානව හා ආර්ථික සංවර්ධනයෙහි සමගාමී ප්‍රගතියක් අත් කර ගැනීම සඳහා රටක අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ආයෝජන, ආර්ථිකයේ පරිණාමය වන නිපුණතා අවශ්‍යතා සමග සුදුසු ලෙස ගලපා සක්‍රීයව වෙනස් කළ යුතුය. අධ්‍යාපන ක්‍රමය ආර්ථික වර්ධන අවශ්‍යතා සමග නොගැලපේ නම්, ඉදිරි ආර්ථික වර්ධනයට බාධාවන ආකාරයට දිගින් දිගට ම මතුවන නිපුණතා පරතර සහ නොගැළපීම්වලට මුහුණ දීමට රටට සිදුවනු ඇත. දිගින් දිගටම පවතින නිපුණතා පරතර සහ නොගැළපීම ආකාර තුනකින් ආර්ථික වර්ධනයට බාධා කළ හැකිය: පළමුව, අවශ්‍ය නිපුණ ශ්‍රමය නොමැතිව සමාගම්වලට තම මෙහෙයුම් පුළුල් කිරීමට සහ ගෝලීය වෙළඳපොළ තුළ තරග කිරීමට නොහැකි වනු ඇත; දෙවනුව, සිය තාක්ෂණයන් වැඩි දියුණු කිරීමට අපොහොසත් වන විට ගෝලීය අගයදාමයේ පහළ තලවලට සමාගම් සීමාවනු ඇත; තෙවනුව, නිපුණ ශ්‍රමයක් නොමැතිකම විදේශ සෘජු ආයෝජන ගලා ඒම අධෛර්යමත්

1 2013 සිට ශ්‍රී ලංකාවේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 5ක් හෝ ඊට වඩා අඩුවෙන් පැවතිණ.

2 ගෝලීය නවෝත්පාදන දර්ශකයෙහි සහ ගෝලීය තරගකාරිත්ව දර්ශකයෙහි අඩු අගයක් මගින් රටක ඉහළ නව්‍යතාවයක් සහ තරගකාරීත්වයක් පිළිබිඹු කරනු ලැබේ.

3

3

කිරීමට හේතුවනු ඇත. මැදි ආදායම් උගුලෙන් මිදුණු සිංගප්පූරුව සහ දකුණු කොරියාව වැනි රටවල්, කලින් කලට අධ්‍යාපන අංශයේ විශාල ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇති අතර, ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමය විකාශය වෙමින් පවතින ආර්ථිකයේ අවශ්‍යතාවන් සමඟ පෙළ ගැස්වීමට අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය ආයෝජන අදියරෙන් අදියර ක්‍රියාත්මක කර ඇත. නිදසුනක් වශයෙන්, 1965 සිට 1978 කාලය තුළ සිංගප්පූරුවේ අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සැමට ප්‍රවේශයක් සැපයීමටත් ශ්‍රමය මුල් කරගත් නිෂ්පාදන සඳහා අත්‍යවශ්‍ය තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීමටත් ප්‍රයත්න දරන ලදී. එහෙත් සිය කලාපීය රටවල්වලින් ශ්‍රමය මුල් කරගත් අපනයන සඳහා පැවති තරගය තියුණු වීමත් සමග, 1980 දශකයේ දී, සිංගප්පූරුව ප්‍රාග්ධනය මුල් කරගත් නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාවලින් ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමට අවධානය යොමු කළේය. 1990 දශකයේ සිට සිංගප්පූරුව ක්‍රමයෙන් දැනුම පදනම් කරගත් ආර්ථිකයක් බවට පරිවර්තනය විය. ඊට සමගාමීව, නව විශ්වවිද්‍යාල පිහිටුවීම, විදේශීය විශ්වවිද්‍යාල සමග හවුල්කාරිත්ව ගොඩනැගීම සහ නව්‍යකරණය තුළින් ශ්‍රම ඵලදායීතාව වැඩි දියුණු කිරීම වැනි කටයුතු මගින් තෘතීයික අධ්‍යාපනය සවිමත් කිරීම කෙරෙහි රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිවල අවධානය යොමු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකවේ ආර්ථිකය තුළ මෙවැනි සාර්ථක රටවල අධ්‍යාපන පද්ධතියේ සිදු කරන ලද ප්‍රතිසංස්කරණ, සුදුසු වෙනස්කම් කිරීමකින් තොරව ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි වන්නේ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම, ආර්ථිකයේ ව්‍යුහය, සංස්කෘතිය සහ අධ්‍යාපනය සඳහා වෙන් කළ හැකි මූල්‍ය අවකාශය වැනි සමාජ හා ආර්ථික සාධක, එවැනි සාර්ථක රටවල සාධකවලට වඩා බෙහෙවින් වෙනස් බැවිනි. එබැවින්, ආර්ථික ව්‍යුහය, දිගින් දිගටම පවතින නිපුණතා පරතර සහ නොගැලපීම් මෙන්ම අනාගත වර්ධන විභවයන් සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන ක්ෂේත්‍රය නැවත ඇගයීමකට ලක් කළයුතු තීරණාත්මක අවධියක අද ශ්‍රී ලංකාව සිටින අතර, මැදි ආදායම් උගුලෙන් ගැලවීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ රටේ ආර්ථික සංවර්ධන අරමුණුවලට අනුකූලව පෙළගැස්විය යුතුය.

### ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ගැටලු

### උසස් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවැති රජයයන් සිසුන්ට නොමිලේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා දීමට උත්සාහ කළ ද, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති සීමිත සම්පත් ප්‍රමාණය, බහුතරයක් තරුණ පිරිසට උසස් අධ්‍යාපනය ලැබීමේ අවකාශයට බාධා ඇති කරයි. 2018 වසරේ දී ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය සඳහා දළ බඳවා ගැනීමේ අනුපාතය හුදෙක් සියයට 19.6ක් විය. 2018 වසරේ දී ඉහළ මැදි ආදායම් සහ පහළ මැදි ආදායම් ලබන රටවල්වල තෘතීයික අධ්‍යාපනය සඳහා දළ බඳවා ගැනීමේ අනුපාත, පිළිවෙළින්, සියයට 53ක් සහ සියයට 24.8ක් වූ අතර, එමගින් පෙන්නුම් කෙරෙනුයේ තෘතීයික අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සාමාන්‍ය පහළ මැදි ආදායම් ලබන රටකට ද වඩා බොහෝ පසුගාමී මට්ටමක පවතින බවය.

ආර්ථික සංවර්ධනයත් සමග, රටක් ගෝලීය වෙළඳපොළ තුළ තරගකාරීව සිටීමට උසස් තාක්ෂණයන් අනුගමනය කළ යුතුය. මේ සඳහා, රට තුළ, විශේෂයෙන්ම විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍රයන් පිළිබඳ සාක්ෂරතාව ඇති සේවකයින්ගෙන් සමන්විත ඉහළ නිපුණතා සහිත ශ්‍රම බලකායක් තිබිය යුතුය. කියවීමේ හා ලිවීමේ හැකියාව පමණක් සලකා බලනු ලබන සමස්ත සාක්ෂරතා අනුපාතය ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමක පැවතුන ද, නවෝත්පාදනයන් මගින් මෙහෙයවනු ලබන වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා රටේ පවතින විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍ර පිළිබඳ සාක්ෂරතා මට්ටම ප්‍රමාණවත් නොවේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ උපාධි ප්‍රදානය කරන විෂයයන් අතරින් කලා හා මානව ශාස්ත්‍ර විෂයයන් කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන අතර විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන් කෙරෙහි අඩු නැඹුරුවක් දක්වයි. 2018 වසරේ දී, විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍රවල මූලික උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ විශ්විද්‍යාල සිසුන්ගේ ප්‍රතිශතය සියයට 14.8ක් විය. සංඛ්‍යා සටහන වි.ස.7.1 මගින් දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍ර සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රමාණය කාර්මික රටවල් හා අනෙකුත් මැදි ආදායම් ලබන රටවලට වඩා අඩු මට්ටමක පවතී.

**සංඛ්‍යා සටහන වි.ස.7.1**

**තෘතීයික අධ්‍යාපන මට්ටමින් විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිතය යන ක්ෂේත්‍ර සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශත**

| රට [අ] | ප්‍රතිශතය (%) |
|---|---|
| හොං කොං (2017) | 38 |
| ජර්මනිය (2018) | 46 |
| ඉන්දියාව (2018) | 39 |
| ඉන්දුනීසියාව (2018) | 34 |
| ඊශ්‍රායලය (2017) | 40 |
| මැලේසියාව (2018) | 43 |
| මියන්මාරය (2017) | 48 |
| පිලිපීනය (2017) | 39 |
| දකුණු කොරියාව (2017) | 48 |
| තායිලන්තය (201) | 31 |

මූලය: යුනෙස්කෝ - UIS දත්ත ගබඩාව

සටහන : (අ) අදාළ වසර වරහන් තුළ ඇත

තෘතීයික අධ්‍යාපනය සඳහා සිසුන් ඇතුළත්වීම හා ශ්‍රම ඉල්ලුම අතර පවතින නොගැළපීම, උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති අනුපාතයන්ගෙන් පිළිබිඹු වේ. 2016/2017 වසරවල දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වන ලද උපාධිධාරීන්ගේ පසු විපරම් අධ්‍යයනයට අනුව, රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් බිහි වූ ප්‍රාසාංගික කලාව, කලා හා කළමනාකරණ යන ක්ෂේත්‍රවල උපාධිය ලැබීමෙන් වසර 2-3කට පසුව ද උපාධිධාරීන්ගේ විරැකියා අනුපාතය, පිළිවෙලින්, සියයට 57.1ක්, සියයට 50.4ක් සහ සියයට 27.7ක් වූ අතර, මෙමගින් පෙන්නුම් කරන්නේ කුසලතා හා වෙළඳපොළ ඉල්ලුම අතර පවතින පරතරයයි. අනෙක් අතට, විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍රවල, විශේෂයෙන් ම සම සෞඛ්‍ය විද්‍යා, ඉංජිනේරු විද්‍යා, විද්‍යා සහ කෘෂිකර්ම උපාධිධාරීන්, පිළිවෙළින්, සියයට 95.7ක, සියයට 92.2ක, සියයට 83.0ක සහ සියයට 82.6ක ඉහළ රැකියා අනුපාතයක් වාර්තා කර ඇත. විශ්වවිද්‍යාලවලින් විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු විද්‍යා සහ ගණිත අංශවලට අයත් නොවන උපාධිධාරීන්ගේ අතිරික්ත සැපයුමක් පැවතුන ද, රැකියා වෙළඳපොළ තුළ ඇතැම් ක්ෂේත්‍ර හා සම්බන්ධව නිපුණතා පරතර දක්නට ලැබේ. නිදසුනක් ලෙස, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පවත්වන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළ යන නිපුණතා පරතරය පෙන්නුම් කරමින්, 2014 වසරේ දී 6,246ක් වූ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධිධාරීන් සඳහා ඇති ඉල්ලුම 2019 වසර වන විට 21,216ක් දක්වා ඉහළ ගොස් ඇතත්, 2014 වසරේ දී 7,010ක් වූ සමස්ත තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ගේ සැපයුම 2019 වසර වන විට 12,307ක් දක්වා පමණක් ඉහළ ගොස් ඇත.

දැනුම බෙදා හැරීම මෙන්ම පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් නව දැනුම නිර්මාණය කිරීමේ පුරෝගාමීන් වීම ද විශ්වවිද්‍යාල මගින් අපේක්ෂා කෙරේ. පර්යේෂණ මගින් නිර්මාණය වන දැනුම ප්‍රායෝගික යෙදුම් බවට පරිවර්තනය කර තාක්ෂණය දියුණු කිරීමට සහ ඵලදායිතාව ඉහළ නැංවීමට යොදාගත හැක. කෙසේ වෙතත්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන පර්යේෂණවලට වඩා ඉගැන්වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන හෙයින් තෘතීයික අධ්‍යාපන ආයතන විසින් සිදු කරනු ලබන පර්යේෂණ කටයුතුවල අදාළත්වය සහ තීව්‍රතාවය සැලකිය යුතු ලෙස අඩුය. ශ්‍රී ලංකාව තුළ පවතින අඩු පර්යේෂණ තීව්‍රතාවය හේතුවෙන්, 2019 වසරේ දී 'උපුටා දැක්වීමේ ලේඛන එච් දර්ශකය' (Citable Documents H index)[3] මගින් ශ්‍රී ලංකාව 75 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කර ඇති අතර, එයට සාපේක්ෂව චීනය, ඉන්දියාව, මැලේසියාව, පකිස්තානය, ඉන්දුනීසියාව, වියට්නාමය සහ බංග්ලාදේශය යන රටවල් උපුටා දැක්වීමේ ලේඛන එච් දර්ශකයේ 13 වැනි, 21 වැනි, 43 වැනි, 50 වැනි, 55 වැනි, 57 වැනි සහ 63 වැනි ස්ථානයන් හි පසු වූහ. මේ අතර, 2018 වසරේ දී ශ්‍රී ලංකාවාසීන් විසින් ඉදිරිපත් කරන ලද පේටන්ට් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාව, ජනගහනය මිලියන එකක් සඳහා අයදුම්පත් 15ක් විය. කෙසේ වෙතත්, චීනය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල් ශ්‍රී ලංකාවට වඩා බොහෝ ඉදිරියෙන් සිටිමින් ජනගහනය මිලියන එකක් සඳහා, පිළිවෙළින්, පේටන්ට් බලපත්‍ර අයදුම්පත් 1,000ක්, 276ක් සහ 35ක් ඉදිරිපත් කර ඇත.

3 උපුටා දැක්විය හැකි ලිපි ලේඛන ප්‍රමාණය සහ උපුටා දැක්වීම් සංඛ්‍යාතය පදනම් කරගෙන සකස් කෙරෙන 'උපුටා දැක්වීමේ ලේඛන එච් දර්ශකය' මගින් රටක පර්යේෂණ කටයුතුවලින් සිදුවන බලපෑම මනිනු ලැබේ. දර්ශකයෙහි පහළ අගයකින් පෙන්නුම් කරනු ලබන්නේ රටේ පර්යේෂණ කටයුතුවල ඉහළ ඵලදායිතාව සහ බලපෑමයි.

**සාමාන්‍ය අධ්‍යාපනය**

තෘතීයික අධ්‍යාපනය සඳහා විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍රවල අඩු සිසුන් ප්‍රමාණයක් ඇතුළත් වීමෙන් පිළිබිඹු වන්නේ ඉහළ ද්විතීයික (උසස් පෙළ) අධ්‍යාපනය සඳහා සිසුන් ඇතුළත් වීමේ රටාව සහ ඉහළ ද්විතීයික හා පහළ ද්විතීයික (සාමාන්‍ය පෙළ) අධ්‍යාපනයේ දී ගණිතය හා විද්‍යා විෂයයන් සම්බන්ධයෙන් සිසුන්ගේ දුර්වල කාර්යසාධනයයි (රූප සටහන වි.ස.7.2 රූප සටහන වි.ස.7.3). 2018 වසරේ දී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා මුහුණ දුන් පාසල් අයදුම්කරුවන්ගෙන් සියයට 32ක් ගණිතය විෂය අසමත් වීම හේතුවෙන් සාමාන්‍ය පෙළ විභාගය අසමත් වී හෝ කොන්දේසි මත සමත් වී ඇත. එවැනි සිසුන්ගෙන් බහුතරයක් පාසල් හැර යන අතර, ගණිත විෂය බොහෝ උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන බැවින් ඔවුන් වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමු වීම ද සීමා වනු ඇත. විද්‍යා අධ්‍යාපනය පිළිබඳ සැලකීමේ දී, ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පාසල් සංගණනය- 2017ට අනුව, මෙරට ඇති පාසල් 10,194 අතරින් පාසල් 2,847ක උසස් පෙළ පන්ති පවත්වනු ලැබුව ද, විද්‍යා විෂය ධාරාව ඇත්තේ පාසල් 1,029ක (එනම් උසස් පෙළ පන්ති සහිත පාසල්වලින් සියයට 36ක) පමණි. උසස් පෙළ විද්‍යා පන්ති සම්බන්ධයෙන් සැලකිය යුතු කලාපීය විෂමතා ද පවතී. නිදසුනක් ලෙස, මධ්‍යම, වයඹ, ඌව සහ උතුරු මැද පළාත්වල උසස් පෙළ පන්ති සහිත පාසල් අතරින් උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ඇති පාසල් ප්‍රතිශත, පිළිවෙළින්, සියයට 26ක්, සියයට 29ක්, සියයට 29ක් සහ සියයට 33ක් ලෙසින් අඩු අගයක පවතී. සාමාන්‍ය අධ්‍යාපනය හරහා උරුමවන මේ ගැටලුව, විශ්වවිද්‍යාල මට්ටමින් විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය යන ක්ෂේත්‍රවලට අයත් නොවන පාඨමාලා තෝරා ගැනීම බවට පරිවර්තනය වේ.

මේ අතර, ඉහළ යන ගෝලීයකරණය, තාක්ෂණික දියුණුව සහ සේවා මත පදනම් වූ රටක් වීම හේතුවෙන් ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය පුද්ගලයෙකුට රැකියාවක් හිමිවීමට බලපාන ප්‍රධාන නිර්ණායකයක් බවට පත්ව ඇත. ලෝක බැංකුවේ සේවා නියුක්තිය හා ඵලදායිතාව සඳහා නිපුණතා

3

**රූප සටහන 7.2**

**2018 වසරේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙහි විෂයයන් අනුව පාසල් අපේක්ෂකයින්ගේ කාර්යසාධනය**




මූලයඃ විභාග දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 7.3**

**2018 වසරේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙහි විෂයයන් අනුව පාසල් අපේක්ෂකයින්ගේ (ප්‍රථමවරට පෙනී සිටින) කාර්යසාධනය**




මූලයඃ විභාග දෙපාර්තමේන්තුව

සමීක්ෂණය-2012ට අනුව, ඉහළ නිපුණතාවයෙන් යුත් සේවාදායකයන් හට ඉංග්‍රීසි භාෂා කුසලතා තිබිය යුතු යැයි සේවා යෝජකයින්ගෙන් සියයට 80ක් අපේක්ෂා කරන අතර, සේවා යෝජකයින්ගෙන් සියයට 40ක් අඩු නිපුණතා ඇති සේවා දායකයන්ගෙන් ද ඒ හා සමාන කුසලතා අපේක්ෂා කරති. එනමුත්, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙහි ඉංග්‍රීසි භාෂා විෂය සඳහා ඇති අඩු සාමාර්ථ අනුපාතයන්ගෙන් පෙන්නුම් කරනුයේ ශ්‍රම වෙළඳපොළට ඇතුළුවන පිරිස අතර ඉංග්‍රීසි ප්‍රවීණතාවයේ ඇති ඌන බවයි.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙහි දී විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් පිළිබඳ සිසුන්ගේ දුර්වල කාර්යසාධනයට එම විෂයයන් සම්බන්ධයෙන් ප්‍රවීණ ගුරුවරුන්ගේ[4] හිඟය සහ ගුරුවරුන් අනුයුක්ත කිරීමේ ගැටලු හේතු වී ඇත. ජාතික මට්ටමින් විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි ගුරුවරුන් සැපයුම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති සංඛ්‍යාව ඉක්මවා ගිය ද, විද්‍යා හා ගණිත විෂයයන් සඳහා ප්‍රවීණ ගුරුවරුන් ගණන නිර්දේශිත ප්‍රමාණයට වඩා අඩු අගයක් වේ (Arunatilake and Abayasekara, 2017, pp.16-17). ගුරුවරුන් අනුයුක්ත කිරීමේ ගැටලු පෙන්නුම් කරමින් ජාතික හා පළාත් පාසල්වල මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ද ප්‍රවීණ ගුරුවරුන් සැපයුමේ සැලකිය යුතු විෂමතා පවතී. නිදසුනක් ලෙස, ජාතික පාසල්වල අවශ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක විද්‍යා ගුරුවරුන් සිටින අතර, පළාත් පාසල්වල මෙම ගුරුවරුන්ගේ හිඟයක් පවතී. බස්නාහිර, මධ්‍යම, දකුණු හා වයඹ පළාත්හි ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරුවරුන් අවශ්‍ය පමණට වඩා වැඩියෙන් සිටිය ද, වෙනත් පළාත්වල ඇති පාසල්වල මෙම විෂය සඳහා ප්‍රවීණ ගුරුවරුන්ගේ හිඟයක් දක්නට ඇත (Arunatilake and Abayasekara, 2017, pp.16-17).

**කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය**

මූලික වශයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින සම්පත් හිඟකම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන්ගෙන් බහුතරයක් විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට අපොහොසත් වන බැවින්, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරනුයේ ශ්‍රම වෙළඳපොළට ඇතුළු විය හැකි නවකයින් පුහුණු කිරීම සහ පවත්නා ශ්‍රම බලකායේ කුසලතා වර්ධනය කිරීමයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු ක්ෂේත්‍රය විවිධ දුර්වලතාවලින් පීඩා විඳින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, රටේ නිපුණතා ඉල්ලුම සපුරාලීම සම්බන්ධයෙන් මෙම අංශයේ කාර්යක්ෂමතාව අඩු මට්ටමක පවතී. වර්තමානයේ දී, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය බෙහෙවින් ඛණ්ඩනය වී ඇති අතර, රාජ්‍ය හා රාජ්‍ය නොවන අධ්‍යාපන සැපයුම්කරුවන් විශාල සංඛ්‍යාවක් (2019 වසර අවසන් වන විට ලියාපදිංචි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන 1,290ක් විය) සහ විවිධ පාලක ආයතන ගණනාවක් මෙන්ම ඔවුන්ගේ නියාමන මණ්ඩල හා ක්‍රියාපටිපාටි සහිතවීම නිසා ඒවා අතර සම්බන්ධීකරණය ද දුර්වල වේ. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය තුළ කේන්ද්‍රීය සැලසුම් යාන්ත්‍රණයක් නොමැති බැවින්, පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම, ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සහ තත්ත්ව ප්‍රමිති සහ ප්‍රතීතන ක්‍රම රටෙහි වර්ධන ප්‍රතිපත්ති හා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සමග නොගැළපේ. වෘත්තීය අවශ්‍යතා මත පුහුණු ප්‍රමිතීන් නිර්ණය කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය හඳුන්වා දී ඇතත්, බොහෝ පෞද්ගලික කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන ප්‍රතීතනය හෝ ලියාපදිංචි කර නොමැති බැවින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පද්ධතියේ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය තවමත් සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක නොවේ. මේ අතර, කාර්මික හා වෘත්තීය

4 යම්කිසි විෂයයකට අදාළව උපාධියක් ඇති හෝ එම විෂය ඉගැන්වීම සඳහා විශේෂයෙන්ම පුහුණුව ලබා ඇති ගුරුවරු

අධ්‍යාපන හා පුහුණු අංශය ද සුදුසුකම් ලත්, විශේෂයෙන් කාර්මික පළපුරුද්ද සහිත, පුහුණු කාර්ය මණ්ඩල හිඟයෙන් පීඩා විඳියි. එයට අමතරව, බොහෝ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සැලසුම් කිරීමේ දී සහ පුහුණු වැඩසටහන් ලබා දීමේ දී සේවායෝජකයන්ගේ සහභාගීත්වය අවම වන හෙයින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුවෙහි රැකියා සඳහා ඇති අදාළත්වය පහළ මට්ටමක පවතී. මේ අතර, තාක්ෂණික ක්ෂේත්‍රයේ රැකියා හා සම්බන්ධව පවතින වැරදි සමාජ දැක්ම මෙන්ම වෘත්තීය පුහුණුව ලබා ඇති පුද්ගලයින්ට ඇති රැකියා අවස්ථා පිළිබඳ දැනුමක් නොමැතිකම හේතුවෙන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සඳහා සිසුන්ගේ ඉල්ලුම අඩු මට්ටමක පවතී. මෑතක දී, රජය විසින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාග කඩ ඉම අසමත් වූ තරුණ පිරිසට ‘13 වසරක සහතික කළ අධ්‍යාපන’ ප්‍රතිපත්තිය තුළින් ජාතික තලයේ වෘත්තීය සුදුසුකම් ලැබෙන අධ්‍යාපනයක් ලැබීමට අවස්ථාව සලසා දීමට ප්‍රයත්න දරන ලදී. කෙසේ වෙතත්, විශේෂයෙන් ම කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන පද්ධතිය වඩාත් අවශ්‍ය වන ග්‍රාමීය ප්‍රදේශවල සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල හිඟකම නිසා මෙම වැඩසටහන තවමත් ප්‍රාථමික අවධියේ පසු වේ.

**ඉදිරි දැක්ම**

මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉතා දුර්වල වී ඇත්තේ තාවකාලික වශයෙන් ගෝලීය සහ දේශීය වශයෙන් මතුවන බාධා හේතුවෙන් පමණක් නොව, ශ්‍රම වෙළඳපොළ ගැටලු වැනි ආර්ථිකයේ දිගින් දිගටම පවතින ව්‍යුහාත්මක බාධක නිසාවෙනි. මෙතෙක් පැවති රජයයන් විසින් ක්‍රියාවට නංවන ලද අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් සිසුන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ ද, වර්තමානයේ දී ගෝලීය වශයෙන් තරඟකාරී වීමට හා එමගින් මැදි ආදායම් උගුලෙන් ගැලවීම සඳහා ශ්‍රී ලංකාව විසින් ආර්ථික සංවර්ධන අරමුණු සමග පෙළ ගැසුණු අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම වෙත අවධානය යොමු කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් ගත් කළ, අධ්‍යාපන ක්‍රමය තුළින් විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍ර මෙන්ම ගෝලීය වෙළඳපොළ සමග සම්බන්ධතා ගොඩනැගීමේ දී අත්‍යවශ්‍ය ඉංග්‍රීසි සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම වෙත ද අවධානය යොමු කළ යුතු වේ. එබැවින්, ශ්‍රී ලංකාවට විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍රයන්හි සාක්ෂරතාවකින් හෙබි ශ්‍රම බලකායක් ගොඩනැගීම පිණිස අධ්‍යාපනයේ සියලු මට්ටම් සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

සාමාන්‍ය අධ්‍යාපන මට්ටමේ දී, ආර්ථික සංවර්ධන අරමුණු සඳහා විෂයමාලාවල ඇති අදාළත්වය සහ අධ්‍යාපනය ලබාදීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම කෙරෙහි අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කළ යුතුය. මේ අතර, සියලුම පාසල්වල උසස් පෙළ මට්ටමේ විෂයධාරා පරාසය පුළුල් කළ යුතු අතර, විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු හා ගණිත සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්පත් හා පුහුණු කාර්ය මණ්ඩල පාසල් හරහා සමානව බෙදා හැරීම කළයුතු වේ. සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු හා ගණිතය මෙන්ම ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම අත්‍යවශ්‍ය වේ. ජාතික පාසල් සහ පළාත් පාසල් සඳහා සම්පත් වෙන් කිරීම මූලික වශයෙන් සිදු කරනු ලබන්නේ, පිළිවෙළින්, මධ්‍යම රජය සහ පළාත් සභා හරහා වන අතර, එමගින් පාසල් අතර භෞතික සම්පත් බෙදාහැරීමේ දී හා ගුරුවරුන් අනුයුක්ත කිරීමේ දී අනිවාර්යයෙන්ම ඇඩි විෂමතා හටගනී. එබැවින්, මධ්‍යගත දත්ත ගබඩාවක් හරහා සම්පත් හා ගුරු මණ්ඩල අවශ්‍යතා සහ පාසල් මට්ටමින් පවතින අඩුපාඩු නිරීක්ෂණය කළ යුතුය. තවද, සම්පත් බෙදා හැරීම හා ගුරුවරුන් අනුයුක්ත කිරීම, අවශ්‍යතා මත පදනම්ව, කේන්ද්‍රීය සැලසුම් යාන්ත්‍රණයක් තුළින් සිදු කළ යුතුය. විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍රවල ගුරුවරුන්ට අඩු පහසුකම් සහිත පාසල්වල වැඩ කිරීම වෙනුවෙන් දිරිගැන්වීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. අඩු පහසුකම් සහිත පාසල්වල ඩිජිටල් තාක්ෂණික සම්පත් වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීම තුළින් ආර්ථිකය තුළ ඩිජිටල් බෙදීම අවම කිරීම පමණක් නොව, නිපුණ ගුරු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී දරුවන්ට වඩා හොඳ ඉගෙනුම් අත්දැකීම් ලබා දීමට මෙම තාක්ෂණයන් ඵලදායී ලෙස භාවිතා කළ හැකිය. ඩිජිටල් මාධ්‍ය ඔස්සේ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි කිරීම සඳහා වෙනත් රටවල් මෙම ක්‍රමවේදය සාර්ථකව භාවිතා කර ඇත.

තෘතීයික අධ්‍යාපනය සඳහා අඩු සහභාගීත්වයක් ලැබීමට එක් හේතුවක් වන්නේ අධ්‍යාපනය සඳහා රජයේ වියදම් වැඩි කිරීම සඳහා ඇති මූල්‍ය අවකාශය සීමිත වීමයි. රාජ්‍ය අංශයට පමණක් ආර්ථිකයේ කුසලතා ඉල්ලුම සපුරාලිය නොහැකි නිසා, උසස් අධ්‍යාපනයට සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට ඇතුළත් වීමේ අනුපාතය ඉහළ නැංවීම පිණිස, ශක්තිමත් තත්ත්ව සහතික සහ ප්‍රතීතන යාන්ත්‍රණයක සහාය ඇතිව, තෘතීයික අධ්‍යාපනය ලබාදීම පිණිස පෞද්ගලික අංශයේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. තවද රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට නොහැකි වූ සිසුන්හට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හරහා උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගැනීම පිණිස ඔවුන් දිරිමත් කිරීම සඳහා සහනදායී අධ්‍යාපන ණය ක්‍රමයක්[5] ප්‍රවර්ධනය කළ යුතුය. විද්‍යාගාර

5 තෘතීයික අධ්‍යාපනයට සහාය වීම සඳහා බොහෝ රටවල් අධ්‍යාපන ණය ක්‍රම භාවිතා කරයි. නිදසුනක් වශයෙන්, 1989 වසරේ සිට ඕස්ට්‍රේලියාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය නොමිලේ ලබා නොදුන් නමුත් සිසුන්ට මූල්‍යමය ආධාර සැපයීම සඳහා ශිෂ්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක විය. වර්තමානයේ දී, උසස් අධ්‍යාපන ණය වැඩසටහන (HELP) මගින් සිසුන්ට රැකියා කරන තෙක් ඔවුන්ගේ අධ්‍යාපන ණය ආපසු ගෙවීම් කල්දැමීමට ඉඩ ප්‍රස්ථාව ලබා දේ. බදු ගෙවීම් ක්‍රමය හරහා කාලයත් සමග ණය ආපසු ගෙවීම අනිවාර්ය වේ.

3

සහ උපකරණ වැනි සම්පත්වල මිල අධික හෙයින් විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍රයන්හි සිසුවෙකු සඳහා අධ්‍යාපන/පුහුණු පිරිවැය සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පවතින නමුත්, එක් ආයතනයක සිටින සීමිත සිසුන් /පුහුණුවන්නන් සංඛ්‍යාව නිසා සම්පත් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත නොහැකි වේ. එබැවින්, විශේෂයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය තුළින්, පුහුණු ආයතන කිහිපයක් අතර සම්පත් හවුලේ භාවිතා කිරීම, එක් සිසුවෙකුගේ පුහුණු පිරිවැය අඩු කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමයක් වනු ඇත.

විශ්වවිද්‍යාලවලින් උපාධිය ලබා ගැනීමට ගතවන කාලය දිගුවීමට හේතුවන අධ්‍යාපන ක්‍රමයේ ඇති බාධක විසඳීම තුළින් රැකියා වෙළඳපොළට ඇතුළුවීමේ දීර්ඝ ප්‍රමාදය සැලකිල්ලට ගෙන උසස් අධ්‍යාපනය හැදෑරීමට යොමු නොවන බොහෝ සිසුන් තෘතීයික අධ්‍යාපන වැඩසටහන් සඳහා ඇතුළු කරගැනීමට දිරිගැන්වෙනු ඇත. පාසලෙන් රැකියාවට කෙටි කලක් තුළ දී සංක්‍රමණය වීම මගින් ශ්‍රම වෙළඳපොළට අලුතින් පිවිසෙන පිරිස තරුණ වියේදී ම රැකියා ආරම්භ කරන බවට සහතික කෙරේ. පොදුවේ ගත් කළ, උගත් තරුණ පිරිස වඩාත් නව්‍යකරණයෙන් යුත්, වෙනස්වීම් සඳහා විවෘත හා වඩා ඉහළ අවදානම් දරන පිරිසක් වන අතර, මෙම ගුණාංග නව්‍යකරණය ප්‍රමුඛ සංවර්ධනය සඳහා අවශ්‍ය ශ්‍රම බලකායේ අත්‍යවශ්‍ය ගුණාංග වේ. විභාග ප්‍රතිඵල සහ සිසුන් ඇතුළත් කර ගැනීමේ පරිපාලනමය අකාර්යක්ෂමතාව අඩු කිරීම, ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සංගම් ක්‍රියාකාරකම් හේතුවෙන් විශ්ව විද්‍යාල පද්ධතියට සිදුවන බාධා වැළැක්වීම සහ හැකි නම් පාසල් අධ්‍යාපනය ලබන වසර ප්‍රමාණය අඩු කිරීම මගින් ශ්‍රී ලාංකික උපාධිධාරීන්ගේ සාමාන්‍ය වයස සැලකිය යුතු ලෙස අඩු කළ හැකිය. මෙයට අමතරව, අධ්‍යාපනය සඳහා දීර්ඝ කාලයක් ගත කිරීමට අකමැති සිසුන් සඳහා සාමාන්‍ය උපාධි පාඨමාලා වැඩසටහන් තුළ ඩිප්ලෝමා පාඨමාලා වැනි කෙටි කාලීන විකල්ප ද ජනප්‍රිය කළ යුතුය. සම මට්ටමේ අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා විවිධ ක්‍රමවේද හඳුන්වා දීම, රැකියා හා අධ්‍යාපනය අතර මෙන්ම අධ්‍යාපන වැඩසටහන් අතර සංක්‍රාන්තිවලට ඉඩ සැලසීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ නම්‍යශීලී බවක් ඇති කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම මගින් තෘතීයික අධ්‍යාපනය සඳහා ශිෂ්‍ය සහභාගීත්වය තවදුරටත් ඉහළ නැංවිය හැකිය.

ශිෂ්‍ය හා ඉගැන්වීම් කාර්ය මණ්ඩලය හුවමාරු කර ගැනීම සහ සහයෝගීතා පදනමින් පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල උසස් අධ්‍යාපන ආයතන පිළිගත් විදේශීය උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතන සමඟ හවුල්කාරිත්ව ගොඩනගා ගත යුතුය. තවද, වෙළඳපොළ ඉල්ලුමට අනුකූලව පර්යේෂණ කටයුතුවල නිරතවීමට සහ පර්යේෂණ සොයාගැනීම් බෙදාහැරීම සහ වාණිජකරණය සඳහා දේශීය හා විදේශීය සමාගම් සමඟ සම්බන්ධතා ගොඩනැගීම අත්‍යවශ්‍ය වේ. පර්යේෂණ ප්‍රකාශන පමණක් නොව, පර්යේෂණ කටයුතුවල වාණිජකරණය සහ ප්‍රතිපත්තිමය වටිනාකම මත පදනම්ව මනිනු ලබන පර්යේෂණ කටයුතුවල බලපෑම ද සැලකිල්ලට ගනිමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාලවල පර්යේෂණ ප්‍රතිපාදන ප්‍රදාන කමිටු විසින් පර්යේෂණ ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

උපාධිධාරීන්ගේ විචාරාත්මක චින්තනය, සංජානන සහ රැකියාවකින් රැකියාවකට හුවමාරු කළහැකි කුසලතා (Cognitive and transferable skills) වර්ධනය කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන ආයතන විසින් තවත් අන්තර්ක්ෂේත්‍ර උපාධි වැඩසටහන් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන්, විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍ර නොවන උපාධි පාඨමාලා සඳහා ගණිතය, සංඛ්‍යානය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ වැනි විෂය ධාරාවන් ඇතුළත් කිරීමෙන් එම උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවෙනු ඇත. කලාව සමඟ ඒකාබද්ධ වීමෙන් නිර්මාණාත්මක ආකාරයකින් විද්‍යාව, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන විෂයයන්ගෙන් සමන්විත අධ්‍යාපනයක් සඳහා සිසුන්ට ඉඩප්‍රස්ථා ලබා දීමේ අරමුණ ඇතිව වර්තමානයේ දී රජය විසින් සාමාන්‍ය හා උසස් අධ්‍යාපන අංශ සඳහා විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු, ගණිත සහ කලා විෂයයන්ගෙන් සමන්විත අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. කලා උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම ද මෙම ප්‍රතිපත්තිය මගින් අරමුණු කෙරේ.

උසස් අධ්‍යාපන හා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශ ශක්තිමත් කිරීම සඳහා දැනුම හා නිපුණතා සංවර්ධන උපාය මාර්ග වරින් වර සමාලෝචනය කිරීම පිණිස විවිධ පාර්ශ්වකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණයත්, තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතන ක්‍රමවේදය ශක්තිමත් කිරීම සහ එය රාජ්‍ය හා රාජ්‍ය නොවන යන දෙඅංශයේ ම උසස් අධ්‍යාපන සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනයන් සඳහා පොදුවේ ක්‍රියාත්මක කිරීමත්, ඉල්ලුම මත පදනම් වූ අධ්‍යාපන පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සඳහා සේවා යෝජකයින්ගේ ක්‍රියාකාරී මැදිහත්වීමත්, ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ගොඩනැගීමත් අත්‍යවශ්‍ය වේ. කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ මග පෙන්වීම යටතේ පෞද්ගලික අංශයේ කෙටිකාලීනව තීව්‍ර පුහුණුවක් ලබා දෙන ව්‍යාපෘතිවල වැඩ කිරීමට සිසුන් දිරිමත් කිරීම සිසුන්ට වැඩ කිරීමට පළපුරුද්ද ලබා ගැනීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් විය හැකිය. මේ අතර, සේවා යෝජකයන් අතර සමීක්ෂණ මෙන්ම විශ්වවිද්‍යාල සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු උපාධිධාරීන්

පිළිබඳ පසු විපරම් අධ්‍යයනයන් මගින් ශ්‍රම වෙළඳපොළ වෙනස්වීම් නිරන්තරයෙන් තක්සේරු කිරීමට සහ ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්වල අදාළත්වය සහතික කිරීම සිදු කරනු ඇත.

ආර්ථිකයේ විවිධ අංශයන් පුරා තාක්ෂණික විප්ලවය ඇති කිරීම සහ මානව සම්පත් ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් ශක්තිමත් වර්ධනයක් අත්කර ගැනීමට රජය අපේක්ෂා කරයි. රජයේ අපේක්ෂිත වර්ධන ඉලක්ක සපුරා ගැනීමට සහ ගෝලීය වෙළඳපොළ තුළ රටේ තරගකාරිත්වය ඉහළ නැංවීමට විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත යන ක්ෂේත්‍ර තුළ කුසලතා හා මනා දැනුමක් ඇති, විවේචනාත්මක හා නිර්මාණාත්මක චින්තනයෙන් නිපුණ සහ ගෝලීය භාෂාමය කුසලතා දක්වන ආර්ථික වර්ධනයට සහාය දක්වන ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඉතා වැදගත් වේ.

---

මූලාශ්‍ර:

1. Arunatilake, N. and Abayasekara, A., (2017) Are there Good Quality Teachers for All Classrooms in Sri Lanka? Human Resources Development Series No. 07, Colombo: Institute of Policy Studies.
2. Eichengreen, B., Park, D. and Shin, K. (2013) Growth Slowdowns Redux: New Evidence on the Middle-Income Trap. Working Paper No. 18673, Cambridge, MA: National Bureau of Economic Research
3. Gill, I.S and Kharas, H. (2015) The middle income trap turns ten Policy Research Working Paper No.7403 Washington, DC 20433: World Bank.



පසුබිමක රජයේ විශ්වවිද්‍යාලවල තරගකාරිත්වය රැක ගැනීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මෙවැනි සිදුවීම් වැළැක්වීමට ශිෂ්‍යයන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය සංගම් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සාමූහික ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වේ. නවක වදය සම්බන්ධයෙන් තීරණාත්මක ක්‍රියාමාර්ග ගැනීමට රජය විසින් මෑත කාලයේ දී ගත් ප්‍රයත්න ප්‍රශංසනීය වන අතර එම ක්‍රියාවලිය නොකඩවා පවත්වා ගත යුතු වේ.

**රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින සීමිත ඉඩ ප්‍රස්ථා හමුවේ ආර්ථිකයේ ශ්‍රම වෙළඳපොළේ වෙනස්වන ඉල්ලුම සපුරාලීම සඳහා පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන ද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව, 2019 වසර අවසන් වන විට උපාධි පාඨමාලා 146ක් පවත්වාගෙන යන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 18ක් පැවතුණි.** මෙම උපාධි පාඨමාලා මගින් මානව සම්පත් කළමනාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර පරිපාලනය, ඉංජිනේරු විද්‍යාව සහ නැනෝ සහ උසස් තාක්ෂණ ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරනු ලැබේ. 2019 වසරේ ජූනි මාසයේ දී උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික හා ප්‍රතීතන කොමිෂන් සභා පනත් කෙටුම්පත ගැසට් කරන ලද අතර, එය අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් හා නිරීක්ෂණ සඳහා යොමු කරන ලදී. මේ අතර, විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිතය විෂයයන් සමඟ කලා (STEM+A) විෂයයන් ඉගැන්වීම සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙතින් නව යෝජනා ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. මෙම නව යෝජනාවේ පරමාර්ථය වන්නේ විද්‍යා, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත උපාධිධාරීන් ප්‍රමාණය ඉහළ නංවන අතර ම, සාම්ප්‍රදායික නොවන ආකාරයකින් කලාව ඒකාබද්ධ කිරීම හරහා සිසුන්ගේ විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිත අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට ඉඩප්‍රස්ථාව ලබා දීමයි. විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු සහ ගණිත යන විෂයයන් විෂය මාලාවට ඇතුළත් කිරීමෙන් කලා සිසුන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීමට ද පිටිවහලක් ලැබේ. මේ අතර, සෑම වසරකම පෞද්ගලික අධ්‍යාපන නියෝජිතයින් හරහා සැලකිය යුතු පිරිසක් අධ්‍යාපනය සඳහා විදෙස්ගත වුව ද, මෙම නියෝජිතයින්ගේ ක්‍රියාකාරකම් රජය විසින් නිරීක්ෂණය නොකෙරේ. අසර්බයිජානයේ මෑත කාලයේ දී සිදු වූ සිසු මරණ සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මෙරටට පැමිණීමට නොහැකි වූ විදේශයන්හි අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින් මගින් අවධාරණය කෙරෙනුයේ රජය විසින් ශිෂ්‍යයන්ගේ විදෙස්ගතවීම් අධීක්ෂණය කිරීමේ වැදගත්කම ය.

**2019 වසරේ දී කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය විසින් තරුණ පරපුරට ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කර ගැනීමට අඛණ්ඩව පහසුකම් සැලසූ අතර, එමගින් පවත්නා ශ්‍රම බලකායේ කුසලතා වර්ධනය නංවාලීමට කටයුතු කරන ලදී.** 2019 වසර අවසානය වන විට රජයේ ආයතන 582කින් සහ පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන 708කින් සමන්විත කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය තුළ ලියාපදිංචි වූ ආයතන 1,290ක් විය. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන විෂය ක්ෂේත්‍ර තුළ පුළුල් පරාසයක් ආවරණය කරමින් මෙම ආයතන මගින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා 2,691ක් පිරිනමන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ, මෙකට්‍රොනික්ස් තාක්ෂණය, ගොඩනැගිලි ඉදිකිරීම්, ලෝහ හා සැහැල්ලු ඉංජිනේරු තාක්ෂණය

සහ සංචාරක යනාදී ක්ෂේත්‍ර හතක් යටතේ නව පාඨමාලා 15ක් රාජ්‍ය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන විසින් හඳුන්වා දී ඇත. 2019 වසරේ දී රාජ්‍ය කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන විසින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සඳහා සිසුන් 35,599ක් අලුතින් බඳවා ගන්නා ලදී. 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ රාජ්‍ය අංශයේ තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාලවල ආලේඛ්‍ය සැලසුම්කරණ (graphic designing), ඉදිකිරීම්, වෙබ් සැලසුම්කරණ, මෝටර් රථ හා විදුලි කාර්මික පාඨමාලා සඳහා සිසුන් 798 දෙනෙකු බඳවා ගන්නා ලදී. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් 78,007ක් නිකුත් කරනු ලැබ ඇති අතර ඉන් 33,483ක් කාන්තාවන් විසින් ලබා ගෙන ඇත. වසර තුළ දී පුද්ගලික අංශය විසින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් 27,792ක් නිකුත් කරන ලදී. මේ අතර, කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය හරහා ලබා ගත හැකි ඉඩ ප්‍රස්ථා පිළිබඳව සිසුන්, පාසල් අධ්‍යාපනයට සමු දුන් පිරිස්, දෙමාපියන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීම සඳහා රජය විසින් විවිධ දැනුම්වත් කිරීමේ වැඩමුළු, වෘත්තීය මාර්ගෝපදේශන සේවා සහ විවෘත දින වැඩසටහන් රැසක් පවත්වන ලදී. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට ඇතුළත් වීම සඳහා වරප්‍රසාද නොලත් පුද්ගලයන් සහ කාන්තාවන් දිරිගැන්වීම පිණිස වැඩසටහන් කිහිපයක් පවත්වන ලද අතර, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව ලත් කාන්තාවන් සාම්ප්‍රදායික නොවන හා නැගී එන ක්ෂේත්‍රවලට බඳවා ගැනීම හා රැකියාවන්හි ස්ථානගත කිරීම සඳහා දිරිගැන්වීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තවද, ව්‍යවසායකත්වයට සහයෝගය දැක්වීම සහ දිරිගැන්වීම පිණිස ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය (SEPI) පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩමුළු කිහිපයක් වෘත්තීය පුහුණුවන්නන් සහ සිසුන් වෙනුවෙන් පවත්වන ලදී. එසේ වුවද, පාසල් අධ්‍යාපනයට සමු දුන් පිරිසට ශ්‍රම බලකායේ වඩාත්ම ඵලදායී අංශය වීමට හැකියාවක් ඇති හෙයින් ඔවුන් අතර කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය ජනප්‍රිය කරවීම සඳහා වඩාත් සාමූහික ප්‍රයත්න අවශ්‍ය වේ. එබැවින්, සීමාවාසික පුහුණුව සහිතව රැකියා වෙළඳපොළට සරිලන ආකාරයේ පාඨමාලා පැවැත්වීම තුළින් පාසල් අධ්‍යාපනයට සමු දුන් පිරිස් වැඩි ප්‍රමාණයක් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කර ගැනීමට හැකි වනු ඇත.

### නිවාස හා නාගරික සංවර්ධනය

**රජය විසින් නිවාස හා නාගරික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණෙන් ව්‍යාපෘති කිහිපයක් ම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය නගර වැසියන්ගේ යටිතල පහසුකම් සහ ජීවන තත්ත්වය නංවාලීම සඳහා කුඩා නගර සංවර්ධන වැඩසටහන (සුබිත පුරවර) ක්‍රියාත්මක කරන ලදී. 2019 දෙසැම්බර් මස අවසන් වන විට, මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 1,439ක් නිම කරන ලදී. 2019 වසරේ දී ද කොළඹ නගරය සහ එයට තදාසන්න ප්‍රදේශවල පැල්පත්, මුඩුක්කු සහ අබලන් වූ නිවාසවල වෙසෙන ජනතාව නැවත පදිංචි කිරීමේ අරමුණින් නව නිවාස ඒකක ඉදි කිරීම සඳහා නාගරික පුනර්ජනන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක විය. රුපියල් බිලියන 9.1ක ප්‍රතිපාදන සහිත මෙම ව්‍යාපෘතිය විසින්, 2019 වසර අවසන් වන විට සියයට 85ක භෞතික ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. මැදි ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පාන්තික පවුල්වලට නගර මධ්‍යස්ථාන ආසන්නයේ පදිංචිවීම සඳහා නිවාස ඒකක 500,000ක් ලබා දීමට නියමිතය. මේ අතර ගංවතුරින් වන භෞතික හා සමාජ ආර්ථික බලපෑම අවම කිරීම සහ කොළඹ අගනගරාශ්‍රිත කලාපයේ දේශීය යටිතල පහසුකම් හා සේවා වැඩිදියුණු කිරීම අරමුණු කරගත් කොළඹ අගනගරාශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2019 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වුනු අතර මෙම ව්‍යාපෘතිය 2020 වසර මැද භාගය වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. 2019 වසරේ දී අනුරාධපුර, මහනුවර, යාපනය සහ ගාල්ල යන නගරයන්හි උපායමාර්ගික නගර සංවර්ධන වැඩසටහනට අයත් ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. නාගරික සහ ඒ ආසන්න ප්‍රදේශවල නිවාස සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පැවතිණි. ඒ අනුව, කොළඹ නගරය, කොළඹ අගනගරාශ්‍රිත කලාපය, මහනුවර, ගාල්ල, යාපනය සහ අනෙකුත් ප්‍රධාන නාගරික ප්‍රදේශ සඳහා විශේෂ අවධානයක් සහිතව, සියලු නාගරික ප්‍රදේශවල නිවාස සංවර්ධන සනත්වය නියාමනය අරමුණු කරගෙන පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් සිටී. මේ අතර, 2020 ජනවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ගමට ගෙයක්-රටට හෙටක් නිවාස ව්‍යාපෘතිය යටතේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකම එක් දුප්පත් පවුලක් සඳහා නිවාසයක් බැගින් නිවාස 14,022ක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. 2019 වසරේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස ඒකක 31,171කින් සමන්විත උදා ගම්මාන ව්‍යාපෘතීන් 1,321ක් අරඹන ලදී. උදා ගම්මාන ව්‍යාපෘතිය යටතේ ආදර්ශ

3

ගම්මාන වැඩසටහන මගින් පවුල් 14,594ක් සඳහා නිවාස පහසුකම් ලබා දෙන ලදී. තවද, උතුරු හා නැගෙනහිර පළාත්වල පවුල් නැවත පදිංචි කිරීම සඳහා නව නිවාස 12,625ක් වෙන් කරන ලදී. උදා ගම්මාන ව්‍යාපෘති යටතේ ග්‍රාම ශක්ති උදා ගම්මාන වැඩසටහන සහ බෝගස්වැව නිවාස වැඩසටහන ද ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මේ අතර, ජීවිත අහිමි වූ හෝ ආබාධිත වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ පවුල්වලට නිවාස පහසුකම් සැපයීම අරමුණු කොට 2019 වසරේ දී විරු සුමිතුරු නිවාස වැඩසටහන යටතේ නිවාස 680ක් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී. 2019 වසර තුළ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් යළි පිබිදෙන උදා ගම්මාන වැඩසටහන, වකුගඩු රෝගයෙන් පීඩා විඳින රෝගීන් සඳහා නිවාස ලබාදීම, සම්පත් සෙවණ වැඩසටහන සහ ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය වැනි තවත් නිවාස ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දේපළ අයිතිවාසිකම් නොමැති රජයේ නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු 1,160ක් සහ බදු ඔප්පු 64ක් නිකුත් කරන ලදී. මේ අතර, 2019 වසරේ දී නිවාස ඉදිකිරීම් සඳහා ඉඩම් කට්ටි 30,515ක් වෙන් කෙරුණි. මීට අමතරව, ස්වභාවික ව්‍යසනවල බලපෑම අවම කිරීම සහ තිරසාර මානව ජනාවාස සංවර්ධනය කිරීම යන සංකල්ප ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රජය විසින් ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

**2019 වසර තුළ දී නාගරික ප්‍රවාහන කටයුතු වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදු කරන ලදී.** රජය විසින් ප්‍රාදේශීය ගමනාගමන අවශ්‍යතාවන්ට අනුකූලව ලංකාවේ බස්නාහිර කලාපයේ සැමට එක සේ ප්‍රතිලාභ ලැබෙන ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීමට පියවර ගැනිණි. ඒ අනුව 2019 වසරේ දී කඩවත බහුවිධ ගමනාගමන මධ්‍යස්ථානය සහ පොල්දූව අතුරු මාර්ග-තෙවන අදියර ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මේ අතර, 2019 වසරේ දී ද, සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය යටතේ මාලබේ සිට කොටුව දක්වා කුළුන මතින් දිවෙන දුම්රිය මාර්ගයට අදාළ මූලික කටයුතු අඛණ්ඩව සිදු විය. ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සියෙහි (ජයිකා) සහයෝගය ඇතිව, මෙම ව්‍යාපෘතිය යටතේ භෞතික ඉදිකිරීම් 2021 මැයි මාසයේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

**මෑතක දී කොළඹ අගනගරාශ්‍රිත කලාපයේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී ඇති වූ බාධා මගින් නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරේ.** පුත්තලම් දිස්ත්‍රික්කයේ ආරුවක්කාලු සනීපාරක්ෂක කසළ අංගනය ඉදිකිරීම සහ එම කසළ අංගනය වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා කැළණියේ කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම මගින් නාගරික ප්‍රදේශවල දිගු කාලීන තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැකසීම සඳහා කොළඹ අගනගරාශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. මෙම සනීපාරක්ෂක කසළ අංගනය සැලසුම් කර ඇත්තේ දිනකට මෙ.ටො. 1,200ක අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ය. දිනකට අපද්‍රව්‍ය මෙ.ටො. 600ක් පමණක් හැසිරවිය හැකි ආරුවක්කාලු සනීපාරක්ෂක කසළ අංගනය තවමත් ඉදිවෙමින් පවතින නමුත්, කෙරවලපිටිය අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ධාරිතාව ඉක්මවා ඇති හෙයින් ආරුවක්කාලු කසළ අංගනය විසින් අපද්‍රව්‍ය භාර ගැනීම 2019 අගෝස්තු 08 වන දින සිට ආරම්භ කරන ලදී. කෙසේ වෙතත් සම්පූර්ණ භූමියේ ඉදිකිරීම් අවසන් නොකර, විශේෂයෙන් කාන්දුකරණ පවිත්‍රාගාරය (Leachate Treatment) නොමැතිව මෙහි කසළ බැහැර කිරීම හානිකර විය හැක. එබැවින්, කාන්දුකරණ පවිත්‍රාගාරය ද ඇතුළුව පිළිගත හැකි මට්ටමකට කසළ අංගනය සංවර්ධනය කරන තෙක් 2019 දෙසැම්බර් 18 වන දින සිට මෙම කසළ අංගනය මගින් කසළ භාර ගැනීම අත්හිටුවා ඇත. මේ අතර, 2019 වර්ෂයේ දී කසළ හුවමාරු මධ්‍යස්ථානවල ඉදිකිරීම් සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ද සිදු කෙරිණි. එපමණක් නොව, නාගරික පරිසරයේ වැඩිවන ඝන අපද්‍රව්‍ය කමනාකරණය කිරීමට රජය විසින් මීතොටමුල්ලෙහි ඇති කසළ අංගනය පිළිසකර කිරීම, කෙරවලපිටියේ කොම්පෝස්ට් කම්හල සහ කෙරවලපිටියේ සහ කරදියාන පිහිටි අපද්‍රව්‍ය මගින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘති ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පළමු අපද්‍රව්‍ය මගින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය 2020 පළමු භාගයේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

**2019 වසරේ දී, සියලු නවීන පහසුකම් සහිත ජාත්‍යන්තර තලයේ නගරයක් ගොඩනැගීමේ අරමුණෙන් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු විය.** 2019 වසරේ ජනවාරි මස වන විට ඉඩම් ගොඩකිරීමේ කටයුතු අවසන් කල අතර, වරාය නගරයෙහි ඉඩම් කොළඹ දිස්ත්‍රික්කයේ කොටසක් ලෙසත් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙසත් ප්‍රකාශයට පත් කරන ලදී. 2019 වසරේ දී මෙහි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ආරම්භ කළ නමුත්, සමාලෝචනයට ලක් වන කාලසීමාව තුළ ව්‍යාපෘතිය

සඳහා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි විය. එබැවින්, රජය විසින් ආයෝජන ඉක්මනින් ආකර්ෂණය කර ගැනීම සඳහා ශක්තිමත් ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. ඒ අනුව, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා 2020 ජූලි මාසයේ දී සිංගප්පූරුවේ පැවැත්වීමට නියමිත ජගත් පුරවර සමුළුවේ දී වරාය නගරය දියත් කිරීමට සැලසුම් කර ඇත.

## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

**ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් පිළිබිඹු වන පරිදි, ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම පසුගිය දශක කිහිපය තුළ අඛණ්ඩව පහත වැටී ඇති අතර, එය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධන ප්‍රවණතාවන්ට අනුකූලව වේ.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2019ට අනුව රටේ ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 4.1ක් වූ නමුත්, දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස් තවදුරටත් රට පුරා දක්නට ලැබිණි. පළාත් මට්ටමින් ඉහළ ම ජනගහන දරිද්‍රතා දර්ශකය උතුරු පළාතින් (සියයට 7.7) වාර්තා වූ අතර, දිස්ත්‍රික් මට්ටමින් ඉහළ ම ජනගහනය දරිද්‍රතා දර්ශකය වන සියයට 18.2 කිලිනොච්චියෙන් වාර්තා විය. සමස්ත දරිද්‍රතාවයට පළාත් වශයෙන් මූලිකව ම දායක වූ මධ්‍යම, සබරගමුව, නැගෙනහිර සහ බස්නාහිර යන පළාත්වල මුළු දිළිඳු ජනගහනයෙන් සියයට 58.6ක් ජීවත් වන අතර, එමගින් දරිද්‍රතාවයෙන් පෙළෙන 494,596ක පිරිසක් නියෝජනය වේ. ගෘහ ආදායම් අසමානතාවය මැනීමට යොදා ගන්නා ගිනි සංගුණකය, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2012/13 දී පැවති 0.48 සිට 2016 වසරේ දී 0.45ක් දක්වා සුළු වර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, දරිද්‍රතා රේඛාවට මඳක් ඉහළින් ජීවත් වන දිළිඳු නොවන විශාල පිරිසක් නැවතත් දරිද්‍රතාවට ඇද වැටීමේ ඉහළ අවදානමක් පවතී. නිල දරිද්‍රතා රේඛාවේ අගය සියයට 10කින් (රුපියල් 4,166 සිට රුපියල් 4,582.60ක් දක්වා) ඉහළ දැමුවහොත් ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 6.1ක් දක්වා ඉහළ යනු ඇත. ඒ අනුව, 400,000කට අධික පිරිසක් දරිද්‍රතා රේඛාවට ඉහළින් ඇති සියයට 10ක පරාසකට අයත් වේ. මෙම පුද්ගලයින් පවුලේ සාමාජිකයෙකුගේ අසනීපයක් හෝ ස්වාභාවික විපතක් වැනි ගැටලුකාරී තත්ත්වයන් මත දිළිඳු භාවයට පත් වීමට ඇඩි අවදානමක් ඇත.

**3.12 සංඛ්‍යා සටහන**
**ජනගහන දරිද්‍රතා දර්ශකය (%)**

| අංශය | 2002 | 2006/07 | 2009/10 | 2012/13 | 2016 |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **22.7** | **15.2** | **8.9** | **6.7** | **4.1** |
| නාගරික | 7.9 | 6.7 | 5.3 | 2.1 | 1.9 |
| ග්‍රාමීය | 24.7 | 15.7 | 9.4 | 7.6 | 4.3 |
| වතු | 30.0 | 32.0 | 11.4 | 10.9 | 8.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණය - 2016 අනුව, ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සියයට 2.4ක් විය.** අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජීවන තත්ත්වය යන පැතිකඩ තුනක් ආවරණය වන ලෙස සමානව බර තැබූ දර්ශක 10ක් භාවිත කරමින් බහුමාන දරිද්‍රතාවය මනිනු ලැබේ. පාසැල් අධ්‍යාපනය ලද අවුරුදු ගණන, පාසල් පැමිණීම, පෝෂණය, ළමා මරණ, විදුලි පහසුකම්, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂාව, නිවසේ ගෙබිම, ආහාර පිසීමේ ප්‍රධාන ඉන්ධනය සහ නිවස සතු වත්කම් මෙම දර්ශකයන්ට ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සැලකිය යුතු ලෙස අඩු අගයක් පෙන්නුම් කළ ද, ජනගහනයෙන් සියයට 11.9ක්, එනම් මිලියන 2.5ක පිරිසක්, බහුමාන දරිද්‍රතාවයට ඇද වැටීමේ ඉහළ අවදානමක් පවතින අතර, 2016 වසරේ දී ජනගහනයෙන් සියයට 0.2ක් ඇඩි බහුමාන දරිද්‍රතාවයකින් පෙළුණි.

**2019 වසරේ දී ද රජය විසින් විවිධ සමාජ සහනාධාර, සමාජ ආරක්ෂණ ජාල සැපයීම සහ දරිද්‍රතාවය පිටු දැකීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කර ගෙන යන ලදී.** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන ගිය සමාජ සහනාධාර වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියේ සුවිශේෂී අංග වේ. 2019 වසරේ අයවැය යටතේ තවත් පවුල් 600,000කට සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමට අනුමත වූ නමුත් 2019 අගෝස්තු මාසය වන විට අළුතින් සමෘද්ධි ප්‍රතිලාභ ලබාදී ඇත්තේ පවුල් 433,594කට පමණි. සමස්ත දරිද්‍රතා මට්ටම සාපේක්ෂව අඩු අගයක පැවතුණද, අළුතින් එකතු වූ පවුල් සංඛ්‍යාවත් සමඟ ශ්‍රී ලංකාවේ පවුල්වලින් සියයට 33කට පමණ සමෘද්ධි ප්‍රතිලාභ ලැබේ. තවද, ගර්භනී සහ කිරි දෙන මව්වරුන් සහ දරුවන් සඳහා අත්‍යවශ්‍ය ආහාර හා පෝෂණ ආධාර රජය විසින් අඛණ්ඩව ලබා දෙන ලදී. 2019 වසරේ දී ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ ආහාර මලු සැපයීම සඳහා රුපියල් මිලියන 5,279ක් ද, පෙර පාසල් ළමුන් 83,515ක් සඳහා උදෑසන ආහාර සැපයීම සඳහා රුපියල් මිලියන 327.2ක් ද වැය කරන ලදී.

**3.13 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම**

| වර්ෂය | දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන | | පෝෂණ දීමනා වැඩසටහන | | වියළි සලාක වැඩසටහන |
|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව (අ) | වටිනාකම (රු. මිලියන) (ආ) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (අ) | වටිනාකම (රු. මිලියන) | වටිනාකම (රු. මිලියන) |
| 2015 | 1,453,078 | 39,994 | 101,200 | 2,422 | 118 |
| 2016 | 1,407,235 | 40,740 | 337,554 | 5,746 | 111 |
| 2017 | 1,388,242 | 39,707 | 372,407 | 5,408 | 84 |
| 2018 | 1,384,021 | 39,239 | 329,047 | 5,490 | 58 |
| 2019 | 1,800,182 | 44,660 | 300,246 | 5,279 | 105 |

(අ) වසර අවසානයේ දී
(ආ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය



තවද, ආර්ථික අපහසුතා ඇති පෙර ළමා වියේ සිසුන් 22,303කගේ අධ්‍යාපන ගාස්තු වෙනුවෙන් රුපියල් මිලියන 79.9ක් වියදම් කරන ලදී. මේ අතර, සමෘද්ධි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 317,722ක් අතර රුපියල් බිලියන 1.2ක මුදලක් බෙදා හරින ලදී. මීට අමතරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා ණය ප්‍රවේශ වැඩි කිරීමේ අරමුණෙන් සමෘද්ධි බැංකු සමිති විසින් ප්‍රතිලාභීන් 693,551ක් වෙත රුපියල් බිලියන 53.4ක ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සපයන ලදී. අනිවාර්ය ඉතුරුම් හිමියන් සඳහා ධනසවිය නම් නව ක්ෂණික ණය ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර, සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම සඳහා ධනාභිමානී ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. 2019 වසරේ දී ආර්ථික අපහසුතා ඇති පවුල් සවිබල ගැන්වීමේ අරමුණින් සත්ව පාලනය, ධීවර, ස්වයං රැකියා, කාර්මික සංවර්ධන සහ ආදර්ශ ගම්මාන ව්‍යාපෘති යන ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති 6,011ක් රුපියල් මිලියන 504.9ක් වැය කරමින් නිම කරන ලදී. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2016ට අනුව, රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය දරිද්‍රතාවය අවම කිරීම සඳහා වඩාත්ම ඵලදායී සමාජ ආධාර වැඩසටහන වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය නොමැති වුවහොත් ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 5.7ක් දක්වා ඉහළ යන නමුත්, සමෘද්ධි සහනාධාර වැඩසටහන නොමැති වීමෙන් ජනගහන දරිද්‍රතා දර්ශකය ඉහළ යනුයේ සියයට 4.3ක් දක්වා පමණි. සමෘද්ධි/දිවි නැගුම/ජනසවිය යන වැඩසටහන් පසුගිය දශක කිහිපය තුළ දරිද්‍රතාවය අවම කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළ ද, දිගින් දිගටම පවතින දරිද්‍රතාව සාර්ථකව දුරු කිරීමට එම වැඩසටහන් වඩා ඉලක්කගත වීම අවශ්‍ය වේ. සමාජ සහනාධාර මත ගෘහ ඒකක නිරන්තරයෙන් යැපීම අවම කිරීම සහ රජයේ අයවැය මත ඇති බර ලිහිල් කිරීම සඳහා වර්තමානයේ සමෘද්ධි ප්‍රතිලාභය ලබන පවුල් නැවත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි ප්‍රතිලාභ සැබවින්ම දරිද්‍ර හා දරිද්‍රතාවට ඇද වැටීමේ ඉහළ අවදානමක් ඇති පවුල් සඳහා පමණක් ම ලබා දීම වැදගත්ය. තවද, සමෘද්ධි ප්‍රතිලාභීන්ට ඔවුන්ගේ ජීවනෝපායන් ගොඩනගා ගැනීමටත් සමාජ සහනාධාර වැඩසටහන්වලින් ක්‍රමයෙන් ඉවත් වීමටත් දිරිමත් කළ යුතුය. මේ සඳහා, ග්‍රාමීය හා වතු අංශ නැගී එන නාගරික අංශයට සම්බන්ධ කිරීම සඳහා වැඩි වශයෙන් ආයෝජන දිරිමත් කිරීම අවශ්‍ය වන අතර, ග්‍රාමීය හා වතු අංශවල වර්ධන ප්‍රවණතා ඇති කරමින් පවුල් ඒකක මට්ටමේ මැදිහත්වීම තුළින් දිළිඳු පවුල් වෙත අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. ඊට අමතරව, දිළිඳු ජනතාව අතර ආදායම් හා රැකියා අවස්ථා ඉහළ නැංවීම සඳහා විශේෂණය වූ දරිද්‍රතාවය පිටු දැකීමේ ඵලදායී වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර, ඔවුන් තුළ ස්වාභාවික විපත් හෝ හදිසි අවතැන්වීම් වැනි ව්‍යසන අවස්ථාවන්ට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කළ යුතු ය. සම්බන්ධීකරණය, සැලසුම් කිරීම, වැඩසටහන්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අභියෝග ඇති කරන රාජ්‍ය ආයතනවල පවතින ආවේණික ව්‍යුහාත්මක දුර්වලතා මග හරවා ගැනීම පිණිස ආයතනික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

## පරිසරය

**මෑත වසරවල දී දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ඇති වූ ව්‍යසන ඇතුළු ස්වභාවික ව්‍යසනවලින් ශ්‍රී ලංකාවට නිරන්තරයෙන් අහිතකර බලපෑම් ඇති වූ අතර, ආපදා සඳහා සූදානම් වීම, හදිසි මෙහෙයුම් සහ පශ්චාත් ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳව පවතින ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමේ වැදගත්කම එමගින් ඉස්මතු කෙරෙයි. ගෝලීය**

දේශගුණ අවදානම් දර්ශකය - 2020ට අනුව ශ්‍රී ලංකාව 2018 වසරේ දී ඇති වූ ගංවතුර, තාප තරංග, කුණාටු සහ නායයෑම් වැනි කාලගුණික විපර්යාසයන් මගින් වඩාත් බලපෑමට ලක් වූ රටවල් අතුරින් හයවන ස්ථානයට පත් විය. තවද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුව 2019 වසරේ මුල් භාගයේ දී වැඩි වශයෙන් පැවති නියං තත්ත්ව හේතුවෙන් 935,098ක පිරිසක් පීඩාවට පත් වූහ. 2019 වසරෙහි පැවති නියඟය හේතුවෙන් වඩාත්ම පීඩාවට පත්වූ දිස්ත්‍රික්ක වූයේ යාපනය සහ අම්පාර දිස්ත්‍රික්කයන් ය. කොළඹ, බදුල්ල සහ අම්පාර ගංවතුරෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ දිස්ත්‍රික්ක ලෙස වාර්තා විය. මේ අතර, 2019 වසරෙහි ඇති වූ ගංවතුර හේතුවෙන් පුද්ගලයින් 579,428ක් පීඩාවට පත් වූ අතර, 13දෙනෙකුට ජීවිත අහිමි විය. මෙවැනි ප්‍රවණතා මගින් ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන ව්‍යසනවලට ගොදුරු වීමට ඇති අවදානම මෙන්ම සමස්ත ප්‍රතිපත්ති මත පදනම් වූ ඵලදායී ඒකාබද්ධ යාන්ත්‍රණයක හා නිශ්චිත උපායමාර්ගවල අවශ්‍යතාවය ද ඉස්මතු කරනු ලැබේ. ආපදා සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහාත් ආපදා හේතුවෙන් මතුවන සමාජ පිරිවැය අවම කිරීම සඳහාත් ප්‍රතිපත්තිවල විශාල වෙනසක් අවශ්‍ය වේ.

**පරිසරය හා ආර්ථික වර්ධනය අතර තුලනය පවත්වා ගැනීමේ අරමුණින් පරිසරය සංරක්ෂණය කිරීම සහ ආපදා අවම කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කළේය.** ඒ අනුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් විශේෂයෙන් ම 2019 වසරේ දී ඇති වූ නියඟ හා ගංවතුර අවස්ථාවල දී හදිසි මෙහෙයුම් කළමනාකරණය කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ස්වාභාවික විපත්වලින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා සිය ප්‍රයත්න අඛණ්ඩව සිදු කරන ලදී. 2019 වසරේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යටතේ නාය යෑම්, උපද්‍රව සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු විය. ලෝක බැංකුවේ මූල්‍යාධාර මත දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් 18ක් ආශ්‍රිත අස්ථායී බෑවුම් සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ අස්ථායී බෑවුම් 21ක් ස්ථාවර කිරීම සඳහා වූ ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් මස වන විට අවසන් කරන ලදී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් කාලගුණික විපර්යාස නිසා මතුවන බාධක සඳහා පෙර සූදානම් වීම පිණිස සාමාන්‍ය ජනතාවට, අදාළ බලයලත් ආයතනවලට හා ධීවර දෙපාර්තමේන්තුවට කාලගුණ අනාවැකි 6,928ක් සහ අනතුරු ඇඟවීම් සහ උපදෙස් 759ක් නිකුත් කරන ලදී. 2019 සැප්තැම්බර් මාසයේ දී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි කාලගුණ පුරෝකථන හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශයේ අදියර-I ක්‍රියාවට නැංවීම ආරම්භ කරන ලදී. තවද, සමාලෝචනය කරන ලද වර්ෂය තුළ දී වඩා හොඳ ප්‍රාදේශීය කාලගුණ අනාවැකි සහ අනතුරු ඇඟවීම් සැපයීමට සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. ආපදාවල දී දුෂ්කරතාවයන්ට මුහුණ දෙන මහජනතාවට සහාය දැක්වීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් සිදු කරන පශ්චාත් ආපදා කළමනාකරණ කටයුතුවල ප්‍රගතියක් දක්නට ලැබුණි. ලෝක ආහාර වැඩසටහනේ තාක්ෂණික සහාය ඇතිව ආපදා සහන සේවා සැලසීමට සූදානම් වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගන්නා ලදී. ඒ අනුව, 2019 වසරේ දී සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 185ක් සඳහා සැලැස්මක් සකස් කර ඇති අතර, ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

**නව පාරිසරික නීති හා රෙගුලාසි අනුගමනය කරමින් පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විවිධ කටයුතුවල නිරත විය.** යෝජිත ව්‍යාපෘතිවලින් ඇති විය හැකි පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ හා මූලික පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරනු ලබයි. ඒ අනුව, 2019 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම් තක්සේරු අනුමැති 17ක් ද, මූලික පාරිසරික ඇගයීම් අනුමැති 266ක් ද නිකුත් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණය නියාමනය කිරීම පිණිස, සිය කටයුතු හේතුවෙන් පරිසර දූෂණය සිදු වීමට ඉඩ ඇති කර්මාන්තවලට අයත් සමාගම් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරන ලදී. 2019 ජනවාරි මස සිට, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සහ මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, ජාතික සංසරණ වායු ගෝලීය තත්ත්ව අධීක්ෂණ වැඩසටහන යටතේ වායු දූෂක මට්ටම තක්සේරු කිරීම සඳහා තත්කාලීන ස්වයංක්‍රීය නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් බත්තරමුල්ල සහ මහනුවර පිහිටුවන ලදී. 2019 නොවැම්බර් මාසයේ දී කොළඹ නගරයේ වායු දූෂක මට්ටම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය බොහෝවිට දේශ සීමා ඔස්සේ ඉන්දියාවේ සිට පැමිණෙන වායු දූෂක නිසා සිදු වන්නට ඇති අතර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මහජනතාවට මේ පිළිබඳව අවධානයෙන් සිටින ලෙස අනතුරු ඇඟවීය. කෙසේ වෙතත්, මෙම

වායු දූෂණ මට්ටමේ සැලකිය යුතු ඉහළ යෑමේ තත්ත්වය කෙටිකාලීන විය. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රධාන ජල ප්‍රභවයන්හි ජලයේ ගුණාත්මක බව අධීක්ෂණය කළ අතර, භූගත ජල ආරක්ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ජාතික පරිසර පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. එපමණක් නොව, 2019 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරිය ඝන හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවලට සම්බන්ධ විය. මේ අතර, 2019 වසරේ මැයි මස දී පිළිසරු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඝන අපද්‍රව්‍ය ගැටලුව විසඳීම සඳහා ලක් පිවිතුරු නම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගන්නා ලදී. තවද, මධ්‍යම පරිසර අධිකාරිය පොලිතීන් භාවිතය නියාමනය, පාරිසරික අනුකූලතා අධීක්ෂණ ජාලයන් පිහිටුවීම සහ පරිසර නීති හා රෙගුලාසි සංශෝධනය කිරීම ඇතුළු පරිසර ආරක්ෂණ ක්‍රියාකරකම්වල ද නිරත විය.

**රටේ ජාතික වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ කටයුතු දෙපාර්තමේන්තු විසින් සිය කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යන ලදී.** 2019 වසරේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය වැඩිදියුණු කිරීම හා පරිසර පද්ධති පවත්වා ගැනීම සම්බන්ධ වැඩසටහනක් නිමාවට පත් කරන ලදී. මීට අමතරව, 2019 වසරේ දී ලෝක බැංකුවේ මූල්‍යාධාර ඇතිව, සංරක්ෂණය සහ ප්‍රජා ප්‍රතිලාභ සඳහා තෝරාගත් ස්ථානවල සංවේදී පරිසර පද්ධති කළමනාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්වයෙන් පිරි කලාපයක් ලෙස පිළිගෙන ඇති නමුත්, මෑත වසරවල දී වනාන්තර විනාශය රටේ ජෛව විවිධත්වයට තර්ජනයක් වී තිබේ. 2019 වසරේ දී වනහරණය වූ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 849ක් දක්වා අඩු වූ අතර 2019 වසරේ දී නැවත වන වගා කළ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 890ක් විය. 2019 වසරේ දී දේශීය ඖෂධ පැළෑටි ජාවාරම් කිරීමේ සිද්ධීන් 120ක් අනාවරණය වී ඇත. වනාන්තර ආවරණය තක්සේරු කිරීම පිළිබඳ සමීක්ෂණය අවසන් වරට 2015 වසරේ දී පවත්වන ලද අතර, එහි සමීක්ෂණ දත්ත 2020 වසරේ දී නිකුත් කරනු ඇත. මේ අතර, 2020 වසරේ දී මෙම සමීක්ෂණයේ මීළඟ වටය ආරම්භ කිරීමට අපේක්ෂිතය. වනාන්තර ආවරණ පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා කළමනාකරණය කිරීම සහ වාර්තාගත වනාන්තර ප්‍රදේශ තුළ හා ඉන් පිටත වනාන්තර ආවරණයේ වෙනස්වීම් පහසුවෙන් හඳුනාගැනීම පිණිස වනාන්තර සීමා මායිම් ඩිජිටල් තාක්ෂණයෙන් සලකුණු කිරීම යනාදී කටයුතු සඳහා භූගෝලීය තොරතුරු පද්ධති (GIS), ගෝලීය ස්ථාන නිර්ණ පද්ධති (GPS) සහ දුරස්ථ සංවේදක තාක්ෂණය වැනි ලොව ඇති දියුණු භූ අවකාශ තාක්ෂණික ක්‍රමවේදයන් වෙත ශ්‍රී ලංකාව යොමු වීම අත්‍යවශ්‍ය වේ.

3

3